

2016

වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

ANNUAL REPORT

ACC

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය.

நவீன தொழில்நுட்பவியலுக்கான ஆர்தர் சி. கிளார்க் நிறுவகம்.

Arthur C. Clarke Institute for Modern Technologies.

පටුන

1.0	සාමාන්‍ය තොරතුරු	01
2.0	සභාපතිතුමාගේ පණිවුඩය	05
3.0	විධායක සාරාංශය	06
4.0	ආයතනයේ අංශ	10
5.0	ජාතික වශයෙන් වැදගත් වන ව්‍යාපෘති	11
6.0	පර්යේෂණ, සංවර්ධන ක්‍රියාකාරකම් හා තාක්ෂණික සේවාවන්	15
6.1	කර්මාන්ත අංශය සඳහා ආරම්භ කර ඇති ඉංජිනේරු/ තොරතුරු තාක්ෂණ අංශයේ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම්	15
6.2	ඉංජිනේරු/ තොරතුරු තාක්ෂණ අංශයේ ආයතනික පර්යේෂණ හා ව්‍යාපෘති	16
6.3	තාරකා විද්‍යා අංශයේ ආයතනික පර්යේෂණ ව්‍යාපෘති	18
6.4	අභ්‍යවකාශ තාක්ෂණයේ යෙදවුම් පිළිබඳ පර්යේෂණ	20
6.5	ප්‍රකාශන	21
6.6	පරීක්ෂාකිරීම් හා මැණුම්, දෘඩකාංග පිලිසකර කිරීමේ හා උපදේශණ සේවා	21
7.0	ආයතනික පුහුණු, අධ්‍යාපනික වැඩසටහන් හා තොරතුරු බෙදාහැරීම	24
7.1	වෘත්තිකයන් සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) පුහුණු වැඩසටහන්	24
7.2	මූලික හා මධ්‍යම මට්ටමේ තාක්ෂණ පුහුණු වැඩසටහන්	25
7.3	විද්‍යාව හා තාක්ෂණය ජනප්‍රියකරවීම හා ප්‍රචාරය කිරීම	25
8.0	විශේෂ අවස්ථා හා ප්‍රදර්ශන	28
9.0	මානව සම්පත් සංවර්ධනය	29
10.0	2016 වසර සඳහා අවසාන ගිණුම්	30
10.1	මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය	30
10.2	මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය	31
10.3	විස්තරාත්මක මූල්‍ය කාර්යසාධනය	34
10.4	මුදල් ප්‍රවාහ ප්‍රකාශය	35
10.5	මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්	
11.0	සැලසුම් කළ කෙටිකාලීන හා මධ්‍යකාලීන ක්‍රියාකාරකම් වල සාරාංශය	48
12.0	විගණකාධිපතිගේ වාර්තාව	50
13.0	විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු	63

1.0 සාමාන්‍ය තොරතුරු

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය
කටුබැද්ද
මොරටුව
2018-05-01

ගරු විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,
විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය,
3 වන මහල, සෙත්සිරිපාය පළමු අදියර,
බත්තරමුල්ල.

ගරු අමාත්‍යතුමනි,

2016 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දින දක්වා වන කාලය සඳහා නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ වාර්ෂික වාර්තාව.

1994 අංක 11 දරණ විද්‍යා හා තාක්ෂණ වැඩිදියුණු කිරීමේ පනතේ vii කොටසේ 40 වන වගන්තිය අනුව පහත සඳහන් වාර්තා ද සමගින් නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම මා ලද ගෞරවයක් ලෙස සලකමි.

(අ) විගණනය කරන ලද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ පිටපතක්

(ආ) විගණනය කරන ලද මූල්‍ය තත්ව ප්‍රකාශයේ පිටපතක් සහ

(ඇ) විගණකාධිපති වාර්තාව හා ඒ පිළිබඳව ආයතනයේ නිරීක්ෂණ

අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීම සඳහා ඉදිරිපත් කෙරේ.

.....
ඉංජිනේරු සනත් පනාවැන්නගේ
අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිලධාරී
නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය

පාලන ව්‍යවස්ථාව

නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. 1984 අංක 30 දරණ පනත මගින් පිහිටුවන ලද නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් මධ්‍යස්ථානයේ අනුප්‍රාප්තිකයා ලෙස ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව මගින් අනුමත 1994 අංක 11 දරණ විද්‍යා හා තාක්ෂණය වැඩිදියුණු කිරීමේ පනත යටතේ 1998 අප්‍රේල් මස 01 දින නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය ස්ථාපනය කර ඇත.

පනතේ දක්වා ඇති පරිදි නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ කාර්යභාරය පහත දැක්වේ.

(අ) ශ්‍රී ලංකාවට නවීන තාක්ෂණ හඳුන්වාදීම වේගවත් කිරීම සඳහා

(i) නවීන තාක්ෂණ අදාල කිරීමෙහිලා පර්යේෂණ හා සංවර්ධන කටයුතු ආරම්භ කිරීමෙන්, ප්‍රවර්ධනය කිරීමෙන් හා පවත්වාගෙන යාම මගින්

(ii) නවීන තාක්ෂණ අදාල කිරීමෙහිලා රජයට සහ පෞද්ගලික අංශයේ ව්‍යාපාර වලට පර්යේෂණ හා සංවර්ධන සහාය සැළසීම මගින්,

(iii) රජයේ සහ පෞද්ගලික අංශයේ ව්‍යාපාර වල අවශ්‍යතාව පිරිමසාලීම සඳහා නවීන තාක්ෂණ සම්බන්ධයෙන් කාර්ය මණ්ඩල පුහුණු කිරීම මගින් දායකවීම, සහ

(ආ) අනාගත අධ්‍යයන කටයුතු ප්‍රවර්ධනය කිරීම.

නවීන තාක්ෂණ ක්ෂේත්‍රයන්ට සන්නිවේදනය සහ ආශ්‍රිත විද්‍යාවන්, තොරතුරු තාක්ෂණය, ඉලෙක්ට්‍රොනික, ක්ෂුද්‍ර ඉලෙක්ට්‍රොනික, අභ්‍යවකාශ තාක්ෂණ, රොබෝ විද්‍යාව, ෆොටෝනික්ස් සහ නව ද්‍රව්‍ය ඇතුලත්වේ.

ඉදිරි දැක්ම

නවීන තාක්ෂණය සඳහා කළාපය තුළ ප්‍රමුඛතම නවෝත්පාදන මධ්‍යස්ථානය වීම.

මෙහෙවර

දේශීය පදනමක් සහිත නවීන තාක්ෂණික හැකියාවන්, නවෝත්පාදන, පර්යේෂණ හා සංවර්ධන කාර්යයන්, පුහුණු, කර්මාන්ත සේවා සහ අන්තර්ජාතික සහයෝගීතා තුලින් සංවර්ධනය හා දිරිමත්කිරීමට පහසුකම් සැලසීම.

පාලනය කරන අමාත්‍යාංශාය

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය

පාලක මණ්ඩල සමාජිකයන්
(2016 ජනවාරි සිට 2016 ඔක්තෝබර් 16 දින දක්වා)

1.	මහාචාර්ය කෙමල් ඩීන් මයා	සභාපති, පාලක මණ්ඩලය
2.	ඉංජිනේරු සනත් පනාවැන්නගේ මයා	අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍ර.වි.නි., පාලක මණ්ඩල සාමාජික
3.	මහාචාර්ය ඒ.කේ.ඩබ්ලිව්.ජයවර්ධන මයා	පාලක මණ්ඩල සාමාජික
4.	මහාචාර්ය දිලීකා ඩයස් මිය	පාලක මණ්ඩල සාමාජික
5.	මහාචාර්ය චන්දන ජයරත්න මයා	පාලක මණ්ඩල සාමාජික
6.	ලක්ෂ්මී පෙගනාදන් මෙය	පාලක මණ්ඩල සාමාජික
7.	මහාචාර්ය එස්.ජේ.බී.ඒ.ජයසේකර මයා	පාලක මණ්ඩල සාමාජික
8.	මහාචාර්ය පී.එස්.එම්.ගුණරත්න	පාලක මණ්ඩල සාමාජික
9.	එස්.ඒ.සී.කුලතිලක මිය	පාලක මණ්ඩල සාමාජික
10.	ඇෂ්ලි ඩී.වොස් මයා	පාලක මණ්ඩල සාමාජික
11.	කේ.එම්.සී.ප්‍රනාන්දු මයා	පාලක මණ්ඩල සාමාජික

පාලක මණ්ඩල සමාජිකයන්
(2016 ඔක්තෝබර් 17 සිට 2016 දෙසැම්බර් 31 දක්වා)

1.	මහාචාර්ය කෙමල් ඩීන් මයා	සභාපති, පාලක මණ්ඩලය
2.	ඉංජිනේරු සනත් පනාවැන්නගේ මයා	අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍ර.වි.නි., පාලක මණ්ඩල සාමාජික,
3.	මහාචාර්ය ඒ.කේ.ඩබ්ලිව්.ජයවර්ධන මයා	පාලක මණ්ඩල සාමාජික
4.	මහාචාර්ය ඩී.ඒ. තන්ත්‍රිගොඩ	පාලක මණ්ඩල සාමාජික
5.	මහාචාර්ය දිලීකා ඩයස් මිය	පාලක මණ්ඩල සාමාජික
6.	මහාචාර්ය චන්දන ජයරත්න මයා	පාලක මණ්ඩල සාමාජික
7.	එස්.ඒ.සී.කුලතිලක මිය	පාලක මණ්ඩල සාමාජික
8.	ඇෂ්ලි ඩී.වොස් මයා	පාලක මණ්ඩල සාමාජික
9.	කේ.එම්.සී.ප්‍රනාන්දු මයා	පාලක මණ්ඩල සාමාජික

2016 වසර තුල පවත්වනු ලැබූ පාලක මණ්ඩල රැස්වීම් ලයිස්තුව

පාලක මණ්ඩල රැස්වීම් අංකය	රැස්වීම් පැවැත්වූ දින
2016/01	2016/1/21
2016/02	2016/2/18
2016/03	2016/3/17
2016/04	2016/4/26
2016/05	2016/5/19
2016/06	2016/6/27
2016/07	2016/7/27
2016/08	2016/8/18
2016/09	2016/9/15
2016/10	2016/12/9

2.0 සභාපතිගේ පණිවිඩය



අසහාය අවස්ථාවන් හා අභියෝග ගණනාවක් සමඟ උදා වූ 2016 වර්ෂයේදී, අභ්‍යවකාශ තාක්ෂණය මෙන්ම හඳුනාගත් වෙනත් මූලික තාක්ෂණයන් කීපයන්ම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ජාතික හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා ආයතනය විසින් ක්‍රමෝපායික ආරම්භයන් ගණනාවක් සාර්ථක ලෙස දියත් කිරීම සඳහා මග සාදනු ලැබීය.

අභ්‍යවකාශ තාක්ෂණය සම්බන්ධයෙන්, ආයතනය විසින් අප ඉතිහාසයේ සිදුකරනු ලැබූ වඩාත් අපේක්ෂිත ව්‍යාපෘති ආරම්භ කරනු ලැබීය. එනම් රුසියාවේ සමාරා ජාතික පර්යේෂණ විශ්ව විද්‍යාලයේ සහයෝගීතාවය ඇතිව ශ්‍රී ලංකීය ඉන්ජිනේරුවන් විසින් ප්‍රථම නැනෝ චන්ද්‍රිකාව නිර්මාණය කිරීම හා දියත් කිරීමයි. මෙය අප රටේ අභ්‍යවකාශ යුගයේ මූලික පියවර සනිටුහන් කරණ මූලික පියවරක් වනු ඇත. අනෙක් කැපී පෙනෙන ජයග්‍රහණය වන්නේ චීනයේ හා රුසියාවේ සහයෝගීතාවය ඇතිව පෘතුවි නිරීක්ෂණ දත්ත ලබාගැනීම හා බෙදාහැරීම සඳහා ජාතික මධ්‍යස්ථානය ඉදිකිරීමේ ප්‍රගතියයි. මේ සඳහා බස්නාහිර පලාතේ මහා නගර ව්‍යාපෘතිය යටතේ ACCIMT ආයතනය සඳහා ඉඩම් කැබැල්ලක් හඳුනාගෙන වෙන්කර ඇත. තවද අභ්‍යවකාශය පිළිබඳ එක්සත් ජාතීන්ගේ උසස්ම ආයතනය වන පිටත අභ්‍යවකාශය සාමකාමී ලෙස භාවිතාකිරීම පිළිබඳ කමිටුවේ (UNCOPUOS) සාමාජිකත්වය ලබාගැනීමෙන් පසු ACCIMT ආයතනය 2016 ඔක්තෝබර් මාසයේ පවත්වනු ලැබූ එහි පළමු සැසියේදීම ශ්‍රී ලංකාව නියෝජනය කරනු ලැබීය.

අභ්‍යවකාශ තාක්ෂණයට අමතරව ආයතනයේ ප්‍රවීණතාවය ඇති ක්ෂේත්‍රවල සැලසුම් හා සංවර්ධන ක්‍රියාකාරකම්වල නිරතව සිටින අතර ආයතනය තුල මෙන්ම සේවාදායකයින් තෘප්තිමත්වන අයුරින් ව්‍යාපෘති, ක්‍රමවේද හා විසඳුම් ලෙස ප්‍රත්‍යක්ෂ වන අයුරින් කැපී පෙනෙන ප්‍රතිඵල ලබා දී ඇත.

සියළු බාධක මධ්‍යයේ වුවද ආයතනය 2016 වසරේදී කැපීපෙනෙන ප්‍රගතියක් අත්කරගෙන ඇති අතර පාලක මණ්ඩලයේ සාමාජිකයින් ලබාදුන් සහයෝගයට ස්තුති කිරීමට මම මෙය අවස්ථාවක් කරගනිමි. එසේම බාධක ගණනාවකට මුහුණදෙමින් වුවද ආයතනය සැලකියයුතු ප්‍රගතියක් කරා ගෙනයාමට හා රටේ ප්‍රමුඛ පර්යේෂණ හා සංවර්ධන ආයතනයක් ලෙස ආයතනයේ නම රැකගැනීමට දායකත්වය ලබාදෙමින් වෙහෙස නොබලා කටයුතු කල ACCIMT ආයතනයේ කළමනාකරණයට හා කාර්ය මණ්ඩලයටද මාගේ ස්තුතිය පුදකරමි.

මහාචාර්ය කෙමල් ඩීන්
පාලක මණ්ඩල සභාපති

3.0 විධායක සාරාංශය



වැටුප් ප්‍රමාණවත් නොවීම හා ප්‍රතිඵල පාදක නියාමනයන්ට වඩා ඉතා ප්‍රබල පරිපාටික අනුකූලතා පාදක නියාමන බලපෑම් හේතුවෙන් ආයතනය සඳහා කාර්ය මණ්ඩලය බඳවාගැනීමට හා රඳවාගැනීමට නොහැකිවීම යන ආයතනය මුහුණ පා ඇති ප්‍රධාන ගැටළු දෙක මගින් ඇතිවන අනවරත බලපෑම් මධ්‍යයේ වුවද සමාලෝචනයට ලක්වන කාලය තුලදී මෙම ආයතනය පර්යේෂණ හා සංවර්ධන, තාක්ෂණ සේවා, පුහුණු හා උපදේශණ සේවා අංශයන්හි මෙන්ම ආයතනයේ විෂය පථයට අදාලව විශේෂඥතාවය ලබා ඇති පරිදි සමස්ත ජාතික තාක්ෂණ හැකියාව වැඩිදියුණු කිරීමෙහිලා දායකත්වය ලබා දෙමින් සැලකිය යුතු ප්‍රගතියක් ලබාගැනීමට කටයුතු කර ඇත.



සලකා බලන ලද වර්ෂය තුලදී ආයතනය මගින් ආරම්භ කරන ලද වඩාත්ම කැපී පෙනෙන තාක්ෂණික වැඩසටහන වන්නේ 2020 වනවිට ශ්‍රී ලාංකික ඉංජිනේරුවන් විසින් රුසියාවේ සමාරා ජාතික පර්යේෂණ විශ්ව විද්‍යාලයේ සහයෝගීතාවය ඇතිව පළමු නැනෝ චන්ද්‍රිකාව නිර්මාණය කිරීම, වැඩිදියුණු කිරීම, ඉදිකිරීම, පරීක්ෂා කිරීම හා දියත් කිරීම සම්බන්ධයෙන් පියවර ගැනීමයි. මෙම කාර්යය සාර්ථක කර ගැනීම සඳහා ACCIMT ආයතනය දේශීය විශ්ව විද්‍යාලවල කාර්ය මණ්ඩලය හා වෘත්තිකයන් සමඟ මෙන්ම වෙනත් අදාල රාජ්‍ය සංවිධාන සමඟ කටයුතු කරනු ඇත. එමගින් අභ්‍යවකාශ තාක්ෂණය සම්බන්ධව රටේ මූලික අනුකූලතාවය ගොඩනැගීම අරමුණු කරගත් අභ්‍යවකාශ යුගයක් කරා අඩිතාලම දමන අතර දිගු ආයු කාලයක් සහිත, වැඩිදුරකට සංවේදී චන්ද්‍රිකාවක් මෙන්ම අනාගතයේදී වෙනත් විද්‍යාත්මක හැකියාවක් නිර්මාණය කිරීම සඳහා ශක්තිමත් පදනමක් නිර්මාණය වනු ඇත.



මෙම ආයතනය චන්ද්‍රිකා දත්ත ලබාගැනීම හා බෙදා හැරීම සඳහා යෝජිත ජාතික මධ්‍යස්ථානය සඳහා යටිතල පහසුකම් හා වෙනත් අවශ්‍යතාවයන් වැඩිදියුණු කිරීමේ අරමුණු ලභාකරගැනීම සම්බන්ධයෙන් 2016 වර්ෂය තුලදී සැලකිය යුතු සාර්ථකත්වයක් ළභාකරගෙන ඇත. බස්නාහිර පළාත සඳහා වන මහානගර මූලික සැලසුම යටතේ මේ සඳහා අක්කර 10 ක භූමියක් වෙන්කර ඇත. තවද අපේම චන්ද්‍රිකාවක් නිර්මාණය කිරීම ආරම්භ කිරීමටත් පසුව ACCIMT මගින් චන්ද්‍රිකා දත්ත නොමිලයේ හෝ අඩු වියදමින් ලබාගැනීම සඳහා අභ්‍යවකාශ තාක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර සහයෝගිතාවන් ගණනාවක් හා වෙනත් විදේශීය නියෝජිතායතන සමඟ සාකච්ඡා කර ඇත. ලබාගනු ලබන දත්ත ACCIMT ආයතනයේ පිහිටා ඇති සර්වරයක (Server) ගබඩාකර තබනු ලබන අතර එම දත්ත ජාතික සංවර්ධනය සඳහා චන්ද්‍රිකා දත්ත යොදාගනු ලබන රාජ්‍ය අංශයේ ආයතන සමඟ හුවමාරුකරගනු ඇත.තිරසාර සංවර්ධනය සඳහා වන දිගුකාලීන කලාපීය අභ්‍යවකාශ යෙදවුම් සහයෝගිතා වැඩසටහන (RESAP) හරහා ඵලදායී ලෙස නියගය අධීක්ෂණය හා පූර්ව දැනුම්දීම සඳහා අභ්‍යවකාශ තාක්ෂණය යොදාගැනීමේ ජාතික හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා ආසියා පැසිපික් කලාපීය එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සාමාජීය කොමිසම (UNESCAP) සමඟ එක්ව ආරම්භ කරනු ලැබූ ව්‍යාපෘතියේ කටයුතු සිදුකෙරෙමින් පවතී.

කලාපීය රටවලට ආර්ථිකමය වශයෙන් බලපෑම් ඇතිකරන කෘෂිකාර්මික නියඟ හා එබඳු වෙනත් සංසිද්ධි වලින් ඇතිවන බලපෑම් යථා තත්වයට පත්කිරීම මෙම වැඩසටහනෙහි අරමුණවේ. ACCIMT ආයතනය මූලික වී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ස්වාභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, කාලගුණවිද්‍යා දෙපාර්තමේන්තුව, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව හා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය යන අදාල ජාතික නියෝජිතායතන 7 සමඟ එක්ව නියමු ව්‍යාපෘතිය සාර්ථකව සිදුකරගෙන යමින් සිටී. තවද ආයතනය විසින් UNESCAP සහයෝගිතාවය ඇතිව කලාපීය නියඟ අධීක්ෂණය කිරීමේ යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් උසස් මට්ටමේ ප්‍රගති සමාලෝචන රැස්වීමක් 2016 අප්‍රේල් 28 - 29 දිනවලදී ශ්‍රී ලංකාවේදී සංවිධානය කරනු ලැබීය. මෙම ව්‍යාපෘතියේ අංගයක් වශයෙන්, චන්ද්‍රිකා දත්ත බාගතකර ඇති අතර NDVI, NDVI විෂමතාවය හා NDWI ගණනය කර ඇත. චන්ද්‍රිකා දත්තවල භෞමික සත්‍යතාව තහවුරුකර ගැනීම සිදුකෙරෙමින් පවතී.



2016 වර්ෂය තුලදී ආයතනය මගින් සාර්ථකව සිදුකරනු ලැබූ වෙනත් සැලකියයුතු සේවාලාභී විශේෂිත උසස් නිර්මාණ හා වැඩිදියුණු කිරීමේ විසඳුම් වන්නේ මහජන උපයෝගිතා කොමිසම සඳහා දුරස්ථ වෝල්ටීයතා දත්ත ගබඩාවක් හා ග්‍රාහක මොඩියුලය (RVDL) නිර්මාණ කිරීම හා වැඩිදියුණු කිරීම, බයෝ මෙඩ් ඉන්ටර්නැෂනල් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය සමඟ සහයෝගිතාවයෙන් සම්පූර්ණ ස්වයංක්‍රීය රෝහල් ඇඳ වැඩිදියුණුකිරීම, ජාතික ගුවන්සේවය වන ශ්‍රී ලංකන් ගුවන් සේවය සඳහා කාර්මික බිත්ති ඔරලෝසු 2 ක් නිර්මාණය කර භාරදීම, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය සඳහා CCTV ආරක්ෂක අන්වේක්ෂණ පද්ධතියක් නිර්මාණය කිරීම හා මොබිටෙල් සමාගම හා කැළණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ සහයෝගිතාවය ඇතිව ඇන්ඩ්‍රොයිඩ් යෙදවුමක් ලෙස පිළිකා ආරක්ෂණ තොරතුරු පද්ධතිය නිර්මාණය කිරීම අයත් වේ. තවද ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සඳහා Alstom M9 පන්තියේ දුම්රිය ධාවනාගාරවල ත්‍රිත්ව ක්‍රියාකාරී පාලන ඒකක සඳහා ගැඹුරු විනිශ්චයන් හා දෘඩකාංග යථා තත්වයට පත්කිරීම සඳහා උසස් මට්ටමේ පිළියම් කිරීම් මෙන්ම සේවාලාභීන් කීපදෙනෙකු සඳහා වෙනත් නවීන ඉලෙක්ට්‍රොනික පද්ධති යථා තත්වයට පත්කිරීමේ කටයුතු ද සිදුකරනු ලැබීය.









වසර තුලදී ආයතනය මගින් ආරම්භ කරනු ලැබූ හා අඛණ්ඩව සිදුකරගෙන යන ලද නිර්මාණ හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති වලට උදාහරණ ලෙස සාක් තීරයේ රටවල් වලට ගැලපෙන ඉහල කාර්ය සාධනයක් ඇති හදිසි වෝල්ටීයතා ඉහලයාම් වලින් විදුලි උපකරණ ආරක්ෂාකිරීමේ උපකරණයක් (Surge Protector) නිර්මාණය කිරීම, කැරකෙන පෙති 4 ක් මගින් ගුවන්ගත කරන නියමුවන් රහිත වාහනයක් (drone) නිර්මාණය කිරීම හා වැඩිදියුණු කිරීම හා වාහන හඳුනාගැනීමේ හා තොරතුරු රැස්කිරීමේ පද්ධතිය දැකිවිය හැක.



ආයතනයේ තාරකා විද්‍යා අංශය මගින් වර්ෂය තුලදී ප්‍රධාන පර්යේෂණ ව්‍යාපෘති 3 ක් සිදුකරනු ලැබ ඇති අතර ඒ සම්බන්ධයෙන් දේශීය මෙන්ම ජාත්‍යන්තර විද්‍යාත්මක සමුළුවලදී ප්‍රකාශයට පත්කිරීම සඳහා පර්යේෂණ පත්‍රිකා ලිවීමේ කාර්යයේ යෙදී සිටී. මෙම සිදුකරනු ලැබූ ව්‍යාපෘති වලට බහුවර්ණ ප්‍රකාශමිතික හා ඉහල තීව්‍රතාවයක් ඇති වර්ණාවලීක්ෂ යොදාගෙන ස්කූටි ආකාරයේ තාරකාවල විචල්‍යතා ආකාරය හඳුනාගැනීම, KEPLER 2 ප්‍රකාශමිතික දත්ත උපයෝගීකරගෙන සුපර්නෝවා 1 a ආකාරය මගින් ක්ෂීරපථ වල ඉතිරිව ඇති කොටස්, හා මීවද පොකුරේ ඇති ඩෙල්ටා ස්කූටි ආකාරයේ තාරකාවල අභ්‍යන්තර ව්‍යුහය අධ්‍යයනය කිරීම ඇතුලත්ය. මෙම අංශය මගින් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයින් ද සමඟ කෙටිකාලීන ඩෙල්ටා ස්කූටි ආකාර විචල්‍ය තාරකා අධ්‍යයනය යටතේ උපාධි අපේක්ෂක සහයෝගිතා ව්‍යාපෘතියක් ද සිදුකරනු ලැබීය.මීට අමතරව අභ්‍යවකාශ නාක්ෂණ යෙදවුම් හා RS/GIS යන ක්ෂේත්‍රයන්හි පහත දැක්වෙන පර්යේෂණ ව්‍යාපෘති සිදුකරනු ලැබීය. එනම්, බතලගොඩ වී පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ සහයෝගිතාවය ඇතිව ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික වී ප්‍රභේදවල වර්ණාවලි මුද්‍රා අධීක්ෂණය කිරීම හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සහයෝගීතාවය ඇතිව පුරාවිද්‍යාත්මක ගවේෂණ හා කැණීම් සඳහා මිනිසුන් රහිත ගුවනේ ගමන් ගන්නා වාහනයක් යොදා ගැනීම මගින වායුමය ප්‍රකාශමිතිය යෙදවීම වේ.

තොරතුරු තාක්ෂණ අංශය මගින් ප්‍රධාන වශයෙන්ම ජාතික විශ්ව විද්‍යාල හා වෙනත් රාජ්‍ය අංශයේ ආයතන සඳහා තොරතුරු පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති ගණනාවක් සිදුකරනු ලැබීය.

වර්ෂය තුල කාර්මික සේවා සඳහා ඇති සැලකියයුතු ඉල්ලුම සපුරාලමින් ආයතනය විසින් එහි සේවා සැපයුම කාර්මික අංශයේ සේවාලාභීන් සඳහා ද ලබාදීමේ කටයුතු වැඩිදියුණු කරනු ලැබීය. ආයතනය මගින් ලබාදෙන ප්‍රධාන සේවාවන්වලට ඉලෙක්ට්‍රොනික පරීක්ෂා කිරීම් හා මිණුම් උපකරණ ක්‍රමාංකනය කිරීම, විවිධ ආකාරයේ ඉලෙක්ට්‍රොනික උපකරණ, උපාංග හා මොඩියුල, ලෙඩ් අම්ල බැටරි, වෝල්ටීයතාවය වැඩිවීමෙන් ආරක්ෂා කිරීමේ උපකරණවල ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීම, සන්නිවේදන හා විකාශන අංශය සඳහා සපයනු ලබන පරීක්ෂා කිරීමේ හා මැණුම් සේවා ආදිය අයත්වේ.

2016 වර්ෂයේදී ආයතන මගින් ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීමේ වාර්තා 305 ක් හා ක්‍රමාංකන වාර්තා 103 ක් නිකුත් කරනු ලැබීය. පුහුණු පාඨමාලා සැලකීමේදී ආයතනය මගින් නවීන බලශක්ති ඉලෙක්ට්‍රොනික විද්‍යාව, නවීන ඉලෙක්ට්‍රොනික අංග, Embedded පාලන පද්ධති විද්‍යුත් භාණ්ඩ විදුලි සැර හා වෝල්ටීයතාවය වැඩිවීමෙන් ආරක්ෂා කිරීමේ පද්ධති නිර්මාණය කිරීම, හා වැඩසටහන් කල හැකි ලොජික් පාලන පද්ධති වැනි ඉතා විශේෂිත තාක්ෂණික ක්ෂේත්‍රවල, ප්‍රධාන වශයෙන්ම ඉංජිනේරුවන්, තාක්ෂණවේදීන් හා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනවල වෘත්තිකයන් සඳහා කෙටිකාලීන අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) වැඩසටහන් පවත්වනු ලැබූ අතර මෙමගින් කර්මාන්තවල ඉල්ලුම සැලකිය යුතු ආකාරයකින් සැපයීම හැකිවිය.

ඉංජිනේරු සනත් පනාවැන්නගේ
අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිලධාරී

4.0 ආයතනයේ අංශ

ඉලෙක්ට්‍රොනික හා ක්ෂුද්‍ර ඉලෙක්ට්‍රොනික අංශය

සන්නිවේදන අංශය/රොබෝ විද්‍යා අංශය

කාර්මික සේවා අංශය

අභ්‍යවකාශ තාක්ෂණ යෙදවුම් අංශය/අභ්‍යවකාශ තාක්ෂණ අංශය/
තාරකා විද්‍යා අංශය

තොරතුරු තාක්ෂණ අංශය

පරිපාලන හා මානව සම්පත් අංශය

මූල්‍ය අංශය

5.0 ජාතික වශයෙන් වැදගත් වන ව්‍යාපෘති

නැනෝ චන්ද්‍රිකා ව්‍යාපෘතිය



අභ්‍යවකාශ තාක්ෂණය හා වෙනත් ප්‍රධාන තාක්ෂණයන් කීපයක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ජාතික හැකියාවන් වැඩිදියුණු කිරීම රට දැනුම්පාදක ආර්ථිකයක් කරා ගෙනයාමට මූලිකවේ. ශ්‍රී ලාංකීය ඉංජිනේරුවන් විසින් සැලසුම් කර නිර්මාණය කරනු ලැබූ ශ්‍රී ලංකාවේ ප්‍රථම නැනෝ චන්ද්‍රිකාව දියත් කිරීම රටේ තාක්ෂණික දියුණුව පෙන්නුම්කරන සාධකයක් ලෙස සැලකිය හැකි අතර එය ජාතික වශයෙන් ආඩම්බරයක් වන අතර අභ්‍යවකාශ තාක්ෂණ හැකියාවන් සඳහා ලභාවීමේ මූලික පියවර ලෙසද සැලකිය හැක. මෙම ව්‍යාපෘතිය සිදුකිරීම මගින්;

- ACCIMT ආයතනය හා වෙනත් පාර්ශවකාර ආයතනවල චන්ද්‍රිකා වැඩිදියුණු කිරීමේ හැකියාවන් හා ඒ පිළිබඳ මූලික විශ්වාසයන් වැඩිදියුණු කිරීම

- නැනෝ චන්ද්‍රිකා සැලසුම් කිරීමේ, වැඩිදියුණු කිරීමේ, නිර්මාණය කිරීමේ හැකියාවන් සහිත විශේෂ ඉංජිනේරුවන් හා විද්‍යාඥයින් පිරිසක් බිහිකිරීමට හැකිවන පරිදි මූලික අභ්‍යවකාශ තාක්ෂණ අංශයේ ජාතික වශයෙන් ධාරිතාවක් ලබාගැනීම

- අභ්‍යවකාශ තාක්ෂණය හා ඒ ආශ්‍රිත වෙනත් ක්ෂේත්‍රයන්හි උසස් තාක්ෂණ වැඩිදියුණු කිරීම අරමුණු කරගෙන අභ්‍යවකාශ තාක්ෂණය පදනම් වූ කර්මාන්ත අංශයක් ශ්‍රී ලංකාව තුල ප්‍රවර්ධනය කිරීම සඳහා සෙ.මී. 10 (අහල් 4) ඝනකයක් හා කි.ග්‍රෑ. 1 – 10 දක්වා බරින් යුත් Cubesat ලෙස හඳුන්වන පිළිගත් ප්‍රමිතියෙන් යුතුව නැනෝ චන්ද්‍රිකාවක් නිර්මාණය කරනු ලැබේ. සමහර නැනෝ චන්ද්‍රිකා ඝනක 2 කින් හෝ 3 කින් යුතු ඒකක වලින් සමන්විතවේ. මෙම ප්‍රමාණයේ චන්ද්‍රිකා හා කුඩා චන්ද්‍රිකා ප්‍රයෝජනවත් විද්‍යාත්මක දත්ත හා වාණිජමය සේවාවන් බෙදාහරින පර්යේෂණාත්මක උපාංග ලෙස යොදා ගනු ලැබේ. ඒ සඳහා වන පිරිවැය අනුව සලකා බලන විට නැනෝ චන්ද්‍රිකා මගින් සම්ප්‍රදායික චන්ද්‍රිකා මගින් ලබාදෙන කාර්යයන් බොහොමයක් ඉටුකර ගත හැකිවේ.

අභ්‍යවකාශ තාක්ෂණ හැකියාවන් හා යෙදවුම් වැඩිදියුණු කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා වගකිවයුතු ශ්‍රී ලංකාවේ ජාතික නියෝජිතායතනය ලෙස ACCIMT ආයතනය සතු ධාරිතාවය අනුව රාජ්‍ය අභ්‍යවකාශ රොකට් මධ්‍යස්ථානය සමඟ එක්ව ක්‍රියාත්මක වන අභ්‍යවකාශය පිළිබඳව විශේෂඥතාවයක් ඇති රුසියාවේ සමාරා විශ්ව විද්‍යාලය සමඟ ශ්‍රී ලංකාවේ ප්‍රථම නැනෝ චන්ද්‍රිකාව සැලසුම්කිරීම, වැඩිදියුණු කිරීම, නිර්මාණය කිරීම, පරීක්ෂා කිරීම හා දියත් කිරීම සඳහා වන ව්‍යාපෘතිය ආරම්භ කර තිබේ.

මෙහි මූලික සැලසුම් අවස්ථාවේ වැදගත් කොටසක් අන්තර්ගත වැඩමුළුව, ඒ සම්බන්ධයෙන් මෙරටට පැමිණෙන ලද රුසියානු විශේෂඥයින්ගේ සහභාගිත්වය ඇතිව 2016 අගෝස්තු 18 හා 19 දිනවලදී ACCIMT පරිශ්‍රයේදී පවත්වනු ලැබීය.

කෘෂිකාර්මික නියඟ අධීක්ෂණය හා පූර්ව දැනුම්දීමේ පද්ධතිය (UN-ESCAP නියමු ව්‍යාපෘතිය)

ආසියා පැසිපික් කලාපයේ කෘෂිකාර්මික රටවල් සඳහා නියඟයන්ගෙන් වන බලපෑම් වලින් මිදීම සඳහා UN-ESCAP මගින් නියඟ අධීක්ෂණය කිරීම හා පූර්ව දැනුම්දීම සඳහා කලාපීය සහයෝගිතා යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කෙරේ. මෙම යාන්ත්‍රණය මගින් නියමිත කාලයේදී චන්ද්‍රිකා දත්ත ලබාදීම, නියඟ සඳහා ගැලපෙන පරිදි වැඩිදියුණු කරන ලද නිෂ්පාදන, ESCAP සාමාජික රටවල් සඳහා කෘෂිකාර්මික නියඟ වඩාත් කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීම සඳහා අවශ්‍යවන දැනුම හා හැකියාව ලබාදීම සඳහා විශේෂිත හැකියා වර්ධනය කිරීමේ පුහුණු කිරීම් ලබාදෙනු ලැබේ. මෙම ආරම්භයන් යටතේ මෙකී නියඟ අධීක්ෂණය කිරීමේ හා පූර්ව දැනුම්දීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියමු රට ලෙස ශ්‍රී ලංකාව තෝරාගෙන තිබේ.

අභ්‍යවකාශය මගින් ලබාගන්නා දත්ත යොදාගෙන පියවි ඇසට දැකගැනීමට පෙර නියඟ පිළිබඳව දැන ගැනීමට හැකිවනු අතර එමගින් එබඳු තත්ව ඇතිවීමට පෙර සිටම බලපෑම් අවම කිරීම සඳහා ක්‍රියා කිරීමට බලධාරීන්ට හැකිවේ. ඉන්දියාව හා චීනය ඔවුන් සතු අති නවීන අභ්‍යවකාශ තාක්ෂණ දැනුම සමඟින් ඔවුන්ට අයත් අධීක්ෂණ පද්ධති නිර්මාණය කර තිබේ. චීනයේ හා ඉන්දියාවේ ත්‍යාගශීලී සහාය මගින් ESCAP මගින් ව්‍යාපෘතියේ දේශීය ආයතනය හා රටේ අභ්‍යවකාශ තාක්ෂණයේ ප්‍රමුඛ ලක්ෂය වන ආතර් සී ක්ලාක් ආයතනය සඳහා නියඟ අධීක්ෂණයකිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණික විශේෂඥතාවය හා පුහුණුව ලබාදේ.





ACCIMT හා ESCAP එක්ව නියඟ සඳහා කලාපීය යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රගතිය අධීක්ෂණය කිරීමේ ඉහල මට්ටමේ රැස්වීමක් 2016 අප්‍රේල් 28 හා 29 දී ගල්කිස්ස මහ හෝටලයේදී පවත්වන ලදි. චන්ද්‍රිකා දත්ත යෙදාගෙන NDVI, NDVI විෂමතාවය, හා NDWI ගණනය කරනු ලැබීය. චන්ද්‍රිකා දත්තවල භෞමික සත්‍ය අගය තහවුරුකරගැනීම සිදුකෙරෙමින් පවතී.

පෘතුවි නිරීක්ෂණ දත්ත ලබාගැනීම හා බෙදාහැරීම සඳහා වන ජාතික මධ්‍යස්ථානය

දුරස්ථ සංවේදී (RS) දත්ත දැරිය හැකි මිලකට ලබාගැනීමට නොමැති වීම හා දත්ත භාවිතා කිරීම හා යෙදවීම සම්බන්ධයෙන් අදාල ආයතන අතර සම්බන්ධීකරණයක් නොමැතිවීම වැනි ගැටළු හේතුවෙන් රටේ සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා ඵලදායී සම්පත් සැලසුම් කිරීමේ හා කළමණාකරණය කිරීමේ මෙවලමක් ලෙස පෘතුවි නිරීක්ෂණ හා දුරස්ථ සංවේදී දත්ත යොදාගැනීම සම්බන්ධයෙන් බාධා ඇතිවී තිබේ. අවසානයේ එය අභ්‍යවකාශ තාක්ෂණය ක්ෂේත්‍රයේ රටේ සමස්ත හැකියාවන් වර්ධනයවීම සඳහා බාධාවක් වේ.

වෙනත් ආයතන සඳහා දැරිය හැකි මිලකට දුරස්ථ සංවේදී දත්ත ලබාගැනීමට සැලැස්වීම හා එමගින් රටේ සංවර්ධනය සඳහා අභ්‍යවකාශ තාක්ෂණික දත්ත යොදාගැනීම ප්‍රවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. යටිතල පහසුකම් සංවර්ධනය යටතේ නව සර්වර් කාමරයේ (Server Room) තල සර්වර් (Blade servers) සවිකිරීම සම්පූර්ණ කර ඇත. තාත්වික භෞමික මධ්‍යස්ථානය (VGS) පහසුකම් ඉදිකර ඇත. පරීක්ෂාකිරීම සඳහා වන අභ්‍යවකාශ දත්ත සමඟ මූලික GIS SW සඳහා භූගෝලීය තොරතුරු ලබාගැනීම සඳහා වන වෙබ් ප්‍රවේශය (Geoportal) සකස්කර තිබේ.

ACCIMT ආයතනයේ යෝජිත චන්ද්‍රිකා භෞමික මධ්‍යස්ථානය සඳහා 6°49’ 38.48”N, 80° 2’ 8.20”E භූගෝලීය පිහිටීම්වලදී පෘතුවි නිරීක්ෂණ චන්ද්‍රිකා දත්ත ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා රජයේ මහා නගර ව්‍යාපෘතිය යටතේ අක්කර 10 ක ඉඩමක් හඳුනාගෙන හා වෙන්කර ඇත.



ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ M9 පන්තියේ JGBT දුම්රිය ධාවන මැදිරි ධාවන මොඩියුලවල දෝෂ හඳුනාගැනීම හා උසස් දෘඩකාංග යථා තත්වයට පත්කිරීම

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ඉල්ලීමකට අනුව ප්‍රකර්ෂණ පාලන ඒකක (Traction Control units) දෙකක් සාර්ථක ලෙස දෝෂ හඳුනාගෙන පිළිසකර කර ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදුකර ඇති අතර Alstom වර්ගයේ දුම්රිය ධාවන මැදිරි දෙකක ස්ථාපනය කිරීම සඳහා භාරදී ඇත. මෙම ඉතා උසස් මට්ටමේ දෘඩකාංග පිළියම් වලට ප්‍රතිවර්ත ඉංජිනේරු යෙදවුම් මගින් සැලසුම් ක්‍රමවේද උකහාගැනීම ඇතුලත් වේ.



ශ්‍රී ලංකා ජාතික තාරකාවිද්‍යා නිරීක්ෂණ මධ්‍යස්ථානය (NAOSL)



සිසුආර්ථික සංවර්ධනයක් ලගාකර ගැනීමේදී විද්‍යා හා තාක්ෂණ නවෝත්පාදන වල වැදගත්කම රජයේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුව තුල සුදුසු ලෙස ඉස්මතුකර දක්වා ඇත. සියළු ක්ෂේත්‍රයන්හි සිදුකරන ලද විද්‍යාත්මක පර්යේෂණ අතර මහජනයා තුල විශේෂ උනන්දුවක් ඇති කිරීම සම්බන්ධයෙන් තාරකා විද්‍යාව කැපී පෙනේ. අධ්‍යාපනික හා පර්යේෂණ ආයතන කෙරේ අවධානය යොමු කළ විට මෙම උනන්දුව මගින් ප්‍රජාවට සුවිශේෂී සංස්කෘතික හා සමාජ ප්‍රතිලාභ ලබාදිය හැක.විද්‍යාව හා තාක්ෂණය සඳහා හඳුන්වාදීමක් ලෙස තාරකා විද්‍යාව මගින් ශිෂ්‍යයින් ආකර්ශණයවීම හා දිරිමත් කිරීම සිදුවේ. තාරකා විද්‍යාව අධ්‍යයනය කිරීම මගින් ලබාගන්නා පුළුල් පරාසයක පැතිරුණු නිපුණතා හා ක්‍රමවේද මගින් ශිෂ්‍යයන්ට විද්‍යා හා තාක්ෂණ අංශයේ ක්ෂේත්‍ර ගණනාවක හොඳින් කටයුතු කිරීම සඳහා ඉඩ සැලසේ.අප විසින් පර්යේෂණ පත්තිය 1-5 වී රොබෝටික් දුරදක්නයකින් සමන්විත ජාතික තාරකාවිද්‍යා නිරීක්ෂණ මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජයේ සහය ඉල්ලා සිටින ලදි. රටේ තාරකා විද්‍යාත්මක පර්යේෂණ හා අධ්‍යාපනය වැඩිදියුණු කිරීමෙහි ලා මෙම ව්‍යාපෘතිය මගින් වැදගත් කාර්යයක් සිදුකෙරේ. මෙම යෝජනාව මගින් ඉදිරිපත් කර ඇති නව පහසුකම යටතේ මෙරට විශාලතම ඔප්ටිකල් දුරදක්නට විල්පත්තුව ප්‍රදේශයේ අහස යට ස්ථාපනය කරනු ඇත.

දුරස්ථ වෝල්ටීයතා දත්ත රැස්කිරීමේ හා ලබාගැනීමේ මොඩියුලය

ඉලෙක්ට්‍රොනික අංශය මගින් මහජන උපයෝගිතා කොමිසම සඳහා දුරස්ථ වෝල්ටීය දත්ත රැස්කිරීමේ හා ලබාගැනීමේ මොඩියුලයක් (RVDL) නිර්මාණය කර වැඩිදියුණු කර තිබේ.



විදුලිබල සැපයුම දුරස්ථව අධීක්ෂණය කිරීම සඳහා මෙම RVDL නිර්මාණය කර තිබේ. මෙම අති නවීන උපකරණය මගින් එකලා විදුලිබල සැපයුමක වෝල්ටීයතා විචල්‍යයන් මැනබැලීමේ හා සටහන්කිරීමේ පහසුකම් සැලසෙන අතර එමගින් දත්ත සජීවව අධීක්ෂණය කිරීමට ද හැකිවේ.
මෙම උපකරණය සේවාදායකයාගේ විවිධ අවශ්‍යතාවයන් අනුව සකස් කරගත හැකි නිසා එය සුවිශේෂීවේ.
RDVL නිරවද්‍යව මැණීමේ, දත්ත ගබඩාකිරීමේ, දත්ත දුරස්ථ
ලබාගැනීමේ හා පරාමිතීන් සකස් කිරීමේ හා ආවේණික සන්නිවේදන ක්‍රියාවලිය සඳහා වන ක්‍රමවේදයකින් සමන්විතවේ.

මූලාකෘතිය නිර්මාණය කර සේවාදායකයා වන මහජන උපයෝගිතා කොමිසමට භාරදී ඇත.

6.0 පර්යේෂණ, සංවර්ධන කටයුතු හා තාක්ෂණික සේවාවන්

6.1 කර්මාන්ත අංශය සඳහා ආරම්භ කර ඇති ඉංජිනේරු අංශයේ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම්

Bio-Med International Pvt Ltd ආයතනය සමඟ රෝහල් ඇඳ ස්වයංක්‍රීය කිරීම.



දැනට රෝහල්වල භාවිතාවන අතින් ක්‍රියාත්මක ඇඳ අඩු වියදමින් ස්වයංක්‍රීය කිරීම සඳහා වන ව්‍යාපෘතියකි. මෙම වැඩිදියුණු කිරීම මගින් රෝගීන් බලාගැනීමේදී රෝහල් කාර්ය මණ්ඩලයට ඇති අපහසුතා අඩු කිරීමට හැකිවනු ඇත. මෙම ඇඳ ස්වයංක්‍රීය කිරීම සඳහා Bio-Med International Pvt Ltd සමඟ ගිවිසුමක් අත්සන් කර ඇත.

ශ්‍රී ලංකන් ගුවන්සේවය සඳහා කාර්මික බිත්ති ඔරලෝසු 2 ක්



මෙම ව්‍යාපෘතිය මගින් ශ්‍රී ලංකන් ගුවන් සේවය සඳහා LED බිත්ති ඔරලෝසු 2 ක් නිර්මාණය කර, වැඩිදියුණු කර ස්ථාපනය කර තිබේ.

ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය සඳහා ප්‍රදර්ශණ පුවරු (Panel Displays)



ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය ප්‍රදර්ශණ පුවරු දෙකක් සාදා බාරදෙනු ලැබීය.

ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය (NWSDB) සඳහා CCTV ආරක්ෂණ අන්වේක්ෂණ පද්ධතිය වැඩිදියුණු කිරීම

ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් අඹතලේ, බියගම, තෙලවල හා රත්මලාන යන ස්ථාන 4 ක් සඳහා ආරක්ෂක ආවේක්ෂණ පද්ධතියක් නිර්මාණය කර, වැඩිදියුණු කර ස්ථාපනය කිරීම මෙම ව්‍යාපෘතියට ඇතුලත්ය. ඊට අමතර PTZ කැමරාවක් සවිකිරීම ඇතුළුව රත්මලාන හා තෙලවල වැඩබිම්වල ස්ථාපන කටයුතු සම්පූර්ණ කර ඇති අතර ඉතිරි වැඩබිම් 2 හි වැඩකටයුතු වලින් 90% කට වැඩි ප්‍රමාණයක් නිමකර ඇත. මෙම ව්‍යාපෘතිය සන්නිවේදන අංශය මගින් භාරගෙන ඇත.

ඇන්ඩ්‍රොසිඩ් යෙදවුමක් ලෙස පිළිකා ආරක්ෂණ පද්ධතියක් වැඩිදියුණු කිරීම



මෙම සෞඛ්‍ය ආරක්ෂණ ඇප් එක වැඩිදියුණු කිරීම මගින් මහජනයා දැනුවත් කිරීම සඳහා පහසුකම් සැපයෙන අතර එය සායන පවත්වාගෙනයාම හා ප්‍රතිකාර සැලසුම් සඳහා ද උපකාරීවේ. කැලණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය හා මොබිටෙල් පෞද්ගලික සමාගමේ සහයෝගීතාවය ඇතිව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මකවේ. මේ වනවිට එම පද්ධතිය වැඩිදියුණු කිරීමේ කටයුතු නිම කර ඇත.

6.2 ඉන්ජිනේරු අංශයේ ආයතනික පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති

සමකය ආශ්‍රිත රටවල් සඳහා ඉහල ක්‍රියාකාරිත්වයක් සහිත සර්ජ් ආරක්ෂක උපකරණයක් (Surge Protector) නිර්මාණය කිරීම හා වැඩිදියුණු කිරීම

හදිසි වෝල්ටීයතා ඉහලයාම්වලින් විද්‍යුත් උපකරණ ආරක්ෂාකිරීමසඳහා ඉහල ක්‍රියාකාරිත්වයක් සහිත සර්ජ් ආරක්ෂක උපකරණයක් (Surge Protector) නිර්මාණය කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය මගින් සැලසුම්කර ඇති අතර මෙම නිෂ්පාදනය ශ්‍රී ලංකාව වැනි සමකය ආශ්‍රිත රටවල් සඳහා විශේෂයෙන් සුදුසුවේ. මූලාකෘතිය වැඩිදියුණු කර විවිධ ආකාර සඳහා පර්යේෂණාගාර පරීක්ෂණ සිදුකර ඇත. (මූලාකෘති සංකල්පය තහවුරු කරගැනීම සඳහා විද්‍යාගාර පරීක්ෂාකිරීම් සිදුකර ඇත.)



Power over Ethernet එතර්නෙට් ජාලකරණය මගින් විදුලිබල සැපයුම

බැටරි අධීක්ෂණ පද්ධතිය ස්වයංක්‍රීය කිරීම සඳහා බැටරි වල තත්වය පෙන්නුම් කරන එතර්නෙට් පාදක ප්‍රදර්ශන පද්ධතියක් වැඩිදියුණු කිරීම සඳහා වන ව්‍යාපෘතියකි.



ඩ්‍රෝනයක් (Drone) නිර්මාණය කිරීම හා වැඩිදියුණු කිරීම

දේශීය වශයෙන් ලබාගත හැකි තාක්ෂණයන් භාවිතා කිරීමේ ප්‍රයත්නයක් වශයෙන් සන්නිවේදන අංශයේ රොබෝවිද්‍යා විද්‍යාගාරය මගින් උපාංග මට්ටමින් ආරම්භකර ගුවන්ගත කිරීමේ පර්යේෂණ දක්වා ගුවන් ගමන් ගන්නා යන්ත්‍රයක් වැඩිදියුණු කර ඇත. අවශ්‍ය උපකරණ රැගෙනයමින් ඉඩම් මැනීමේ කටයුතුවලට යොදාගැනීම සඳහා යෝජිත ඩ්‍රෝනය වැඩිදියුණු කිරීම සඳහා ප්‍රත්‍යක්ෂ තාක්ෂණයන් යොදාගනු ලැබේ.



තේ කොල වර්ණ ශ්‍රේණිගත කිරීමේ පද්ධතිය

පහතරට තේ වගා කරුවන්ට අවශ්‍යකරන, තේකොළ නිෂ්පාදන ක්‍රියාවලියේ අවසාන අදියරේදී වර්ණ වෙන්කිරීමට සුදුසු ලක්ෂණවලින් යුත් අඩු වියදම නිෂ්පාදනයක් අරමුණු කරගන මෙම ව්‍යාපෘතිය ආරම්භ කරනු ලැබීය. තේ අංශුවල වර්ණ වෙන්කිරීම සඳහා ක්‍රියාත්මක ආදර්ශකයක් වැඩිදියුණු කිරීම සඳහා ගිවිසුම් අත්සන් කර තිබේ. මෙම අදියර සාර්ථක ලෙස නිමකරනු ලැබ ඇති අතර ACCIMT ආයතනය සඳහා තාක්ෂණය පැවරීමේ කටයුතු ද සිදුකර ඇත. ඊළඟ වසරේ FPGA පදනම කරගත් ඉලෙක්ට්‍රොනික පද්ධතියක් වැඩි දියුණු කිරීමට සැලසුම් කර ඇත.



වාහන හඳුනාගැනීමේ හා තොරතුරු රැස්කිරීමේ පද්ධතිය



ආයතනික ව්‍යාපෘතියක් ලෙස ආරම්භකරනු ලැබූ මෙය වාහන කළමනාකරණය සඳහා ඵලදායී ලෙස ආධාරවීම සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය සමඟ අඛණ්ඩව වැඩිදියුණු කරනු ලැබීය. පද්ධතිය මගින් වාහන ක්‍රියාත්මක පිහිටීම් පෙන්නුම්කරන අතර එම දත්ත රැස්කිරීම මෙන්ම කළමනාකරණයට අවශ්‍ය කරන වාර්තා උත්පාදනය කිරීමද කරනු ලැබේ. දත්ත ගබඩා කලමනාකරණය හා වෙනත් අදාල ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය දෘඩකාංග හා මෘදුකාංග වැඩිදියුණු කර මූලාකෘති පරීක්ෂා කිරීමේ මට්ටමේ පවතී. වාහනවල පද්ධතිය ස්ථාපනය කිරීම සිදුකෙරෙමින් පවතී.

RF- ID භාවිතයෙන් පුස්තකාල ක්‍රියාවලිය ස්වයංක්‍රීය කිරීම



අවශ්‍යකරණ සලකුණු කිරීමේ ක්‍රමය හඳුනාගැනීමේ උපකරණ, පුස්තකාලය ක්‍රියාත්මක කිරීම සඳහා වන කළමනාකරණ තොරතුරු පද්ධතිය එක්කරමින් පොත් හා පරිශීලකයින් සඳහා RF-ID තාක්ෂණය පදනම් කරගත් සලකුණු කිරීමේ ක්‍රමයක් යොදාගනු ලැබ ඇත. පද්ධතිය සඳහා මූලික පරීක්ෂාකිරීම් සම්පූර්ණ කර ඇති අතර දැනට ACCIMT ආයතනය පුස්තකාලයේ ස්ථාපනය කර දත්ත ඇතුලත් කිරීමේ කටයුතු සිදුකෙරෙමින් පවතී.

විදුලිබල ඉලෙක්ට්‍රොනික මිණුම් පර්යේෂණාගාර වැඩිදියුණු කිරීම-විදුලි ස්විච/පේනු/සොකට් පරීක්ෂාකිරීමේ පහසුකම් වැඩිදියුණු කිරීම

ඉලෙක්ට්‍රොනික අංශය මගින් SLSI 1000 අනුව විදුලි ස්විච පරීක්ෂා කිරීමේ යාන්ත්‍රණයක් (සෑදීමේ හා කැඩීමේ හැකියාව, සාමාන්‍ය ක්‍රියාත්මකවීම හා උෂ්ණත්වය ඉහලයාම සඳහා වන පරීක්ෂා කිරීම්) නිර්මාණය කර වැඩිදියුණු කර ඇත.



තවද 5A, 13A, 15A විදුලි ක්ෂේත්‍ර සඳහා SLS 734 හා SLS 948 අනුව පරීක්ෂාකිරීම් සඳහා ප්‍රවාහ බැරලය (tumbling barrel) නිමකොට ඇත.

6.3 ආයතනය තුළ සිදුකෙරෙන තාරකා විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති

බහුවර්ණ ප්‍රකාශමිතිය හා ඉහල විභේදනයක් සහිත වර්ණමිතිය යොදාගනිමින් ස්කූටි ආකාරයේ තාරකාවල වලන ආකාර හඳුනාගැනීම

ඩෙල්ටා ස්කූටි තාරකා යනු වර්ණාවලි පන්තිය A සිට මූලික V සහ දීප්තතාවය අනුව V පන්තිය සිට III දක්වා වන ආලෝකය ස්පන්දනය වන විචල්‍ය තාරකාවේ. ඩෙල්ටා ස්කූටි ආකාර තාරකාවක් වන SZ Lyn (HD 67390) වර්ණමිතිය යොදාගෙන නිරීක්ෂණය කර තිබේ. මෙහි ආලෝක වක්‍ර ලබාගෙන ඇත. ප්‍රධාන වලන කාලසීමාව දින 0.120-0.003 ලෙස නිගමනය කර ඇත. වෙනත් වලන ආකාර හඳුනාගැනීම සඳහා ෆූරියර් වියෝජනය (Fourier decomposition) සිදුකර ඇත. මේ පිළිබඳ පර්යේෂණ පත්‍රිකාව ලියමින් පවතී.





A displacement field with l=2 and m=0.



A displacement field with l=5 and m=3.

සුපර්නෝවා 1 A ආකාරයේ ක්ෂීර පථ අවශේෂ පිළිබඳ පරීක්ෂා කිරීම

සුපර්නෝවා 1 A ක්ෂීරපථවල අවශේෂ පැවැත්ම පිළිබඳව ඇස්තමේන්තු කිරීම සඳහා යොදාගත හැක. කානගී මෙලන් සුපර්නෝව ව්‍යාපෘතිය මගින් නිරීක්ෂණය කරන ලද 20-25 ආකාරයේ සුපර්නෝවා සාම්පලයක් මේ සඳහා යොදාගැනීමට අපේක්ෂිතය. මෙය B සහ V ආලෝක වක්‍රයක් අදාල කරගෙන විශ්ලේෂණය කර ඇත. සංකල්ප පත්‍රිකාව ලියමින් පවතී.





NASA ආයතනයේ “Kepler” පර්යේෂණය මගින් ලබාගත් විද්‍යාත්මක දත්ත භාවිතා කිරීම

NASA ආයතනයේ Kepler හා K 2 මගින් ග්‍රහලෝක හා තාරකාවිද්‍යාත්මක භෞතික විද්‍යා පර්යේෂණ සඳහා දීර්ඝ පදනමකින්, යුත් ඉතා නිරවද්‍ය ප්‍රකාශමිතීක දත්ත ලබාදේ. දත්ත ලබාගැනීමේ පද්ධති ෆෙඩෝරා මෙහෙයුම් පද්ධතිය සඳහා භාගතකර ස්ථාපනය කර තිබේ.



තාරකා විද්‍යාව පිළිබඳව උපාධිඅපේක්ෂක මට්ටමේ සහයෝගීතාවය

කෙටිකාලීන ඩෙල්ටා ස්කූටි ආකාරයේ තාරකා පිළිබඳ අධ්‍යයනය (පේරාදෙණිය විශ්ව විද්‍යාලය සමඟ සහයෝගිතා ව්‍යාපෘතිය)

ඉන්දියාවේ ගුරුෂිකාර් Mount Abu නිරීක්ෂණාගාරයේ ඇති 1.2m ගැසග්‍රේන් දුරේක්ෂය මගින් ලබාගත් ප්‍රකාශමිතික දත්ත විශ්ලේෂණය කරනු ලැබ ඇත. තාරකාවේ සාමාන්‍ය ඝනත්වය හා දීප්තිය අඩුවැඩිවන සංඛ්‍යානය තීරණය කර තිබේ. නිබන්ධනය විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කර ඇත.



Figure 1.8: The periodogram of KP Cnc.

දුරේක්ෂ කාමරය ප්‍රතිසංස්කරණය කිරීම

- ශ්‍රී ලංකාවේ ඇති විශාලම ප්‍රකාශ දුරේක්ෂය (සෙ.මී. 45 GOTO දුරදක්නය) තබා ඇති ACCIMT ආයතනයේ දුරේක්ෂ කාමරය ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු 2016 වසරේදී සිදුකරණු ලැබීය. MS DOS පදනම් දුරේක්ෂ පාලන වැඩසටහන නැවත ස්ථාපනය කරණු ලැබීය. දුරේක්ෂය ගැටීම වැලැක්වීම සඳහා PLC පදනම් ලිස්සායාමේ පාලන හා ආරක්ෂණ පද්ධතිය නිර්මාණය කර ස්ථාපනය කරණු ලැබීය.



6.4 අභ්‍යවකාශ තාක්ෂණයේ යෙදවුම් පිළිබඳ පර්යේෂණ

ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික වී වර්ගවල ආවේණික වර්ණාවලීක්ෂ ලක්ෂණ අධීක්ෂණය

වර්ණාවලීක්ෂ දර්ශක අතර සම්බන්ධතාවය හා ශාකවල ජෛවභෞතික හා ව්‍යුහාත්මක ලක්ෂණ අධීක්ෂණය කිරීම පිළිබඳව අධ්‍යයනයන් ගණනාවක් මගින් යොමුවී ඇත. ශාකපත්‍රවල ඇතුලත හා පිටත සෛලීය ව්‍යුහය, ක්ලෝරපීල්, කැරටිනොයිඩ, නයිට්‍රජන් හා ජලසංයුතිය වැනි ජෛව රසායනික ලක්ෂණ අනුව විවිධ තරංග ආයම වලදී ශාඛවල වර්ණාවලීක්ෂ ලක්ෂණ පාලනය කරනු ලැබීය. වී වර්ගවල වර්ණාවලී ලක්ෂණ අධීක්ෂණය කිරීම මෙම අධ්‍යයනය මගින් සිදුකරනු ලැබීය. ස්වභාවික ආලෝකය හා පාරිසරික තත්වයන් යටතේ තුනේමීටර් 320-1100 පරාසය තුල ක්ෂේත්‍ර වර්ණාවලි විකිරණ මීටරයක් භාවිතාකර ආවේණික වර්ණාවලීක්ෂ ලක්ෂණ මැණීම සිදුකරනු ලැබූ අතර සාම්ප්‍රදායික වී වර්ග 22 සම්බන්ධයෙන් නියදි ගණනාවක්ම එකතු කරනු ලැබීය. වයඹ විශ්ව විද්‍යාලයේ පැවති වයඹ ජාත්‍යන්තර සමුළුවේ දී (winc2016) මේ පිළිබඳ පර්යේෂණ පත්‍රිකාව ප්‍රකාශයට පත්කරන ලදි.





පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සහයෝගීතාවය ඇතිව මිනිසුන් රහිත ගුවනේ ගමන්ගන්නා වාහනයක් යොදාගෙන පුරාවිද්‍යාත්මක ගවේෂණ හා කැණීම් සඳහා වායුමය ප්‍රකාශමිතික යෙදවුම්

සමකය ආසන්නයේ පිහිටීම් නිසා ශ්‍රී ලංකාව වටා වසර පුරාම දැඩි වලාකුළු ආවරණයක් පවතින හෙයින් අභ්‍යවකාශයේ සිට වලාකුළු වලින් තොර ඡායාරූපගැනීමට දුෂ්කරවේ. මෙම වාහනය වළාකුළු මට්ටමට පහළින් ගමන් කරන අතර හොඳින් ගුවන් ඡායාරූප ලබාගත හැකිය. එයට මීටර් 100 ට ද වඩා අඩු දුරකින් පවා පියාසර කිරීමට හැකි අතර ඉහල විභේදනයක් සහිත ඡායාරූප (සෙ.මී. 2 ට වඩා අඩු) ලබාගැනීමට ද හැකිය. ගුවන් ඡායාරූප මගින් මිනින්දෝරුවන්ට හා භූ අභ්‍යවකාශ වෘත්තිකයන්ට සුරක්ෂිත පිහිටීමක සිට විවිධ යෙදවුම් සඳහා කෙටිකාලයක් තුල (පැයකට අඩු කාලයකදී) දත්ත විශාල සංඛ්‍යාවක් (වර්ග කිලෝමීටර් ගණනාවක) රැස්කර ගත හැකිවේ. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් දැනටමත් පුරාවිද්‍යා ප්‍රදේශ කළමනාකරණය සඳහා ගුවන් ඡායාරූප ගැනීමේ අවශ්‍යතාවය ප්‍රකාශ කර ඇත.

වාහනය මිලදී ගෙන ඇත. නිෂ්පාදනය සඳහා භාරදීම අධ්‍යයනය කර ඇති අතර ගුවන්ගත කිරීමේ සැලසුම් හා තාක්ෂණික අවශ්‍යතා හඳුනාගෙන ඇත. ගුවන්ගත කිරීම් පරීක්ෂා කර ඇත.

6.5 ප්‍රකාශන

1). “Enhanced True RMS Voltage Recorder” (වැඩිදියුණු කල සත්‍ය වෝල්ටියතා රෙකෝඩරය): ජේ.පී.ඩී.එස්.අතුරලිය, එන්.එල්. රත්නායක, එන්.ඒ.ඒ.එන්.දිල්රුක්ෂි, පී මහදේවන්, ටී.එම්.එස්.ඩයස්, එස්.ආර්.ජේ.එස්.බණ්ඩාර, සී.ඩී.පානමල්දෙණිය. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) 2016 වාර්ෂික හමුව

2). “Evaluation of Spectral Signature Characteristics of Traditional Paddy Varieties of Sri Lanka” (ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික වී ප්‍රභේදවල වර්ණාවලි මුද්‍රා ලක්ෂණ විශ්ලේෂණය කිරීම): මාරසිංහ බී. එස්., ෆොන්සේකා එච්. පී. යූ., ජයවර්ධන ඩබ්ලිව්. ජී. එන්. එන්. මොහමඩ් රිලා, ඒ. ආර්., රත්නායක ඩබ්. එම්. කේ, සිරිසේන ඩී. එන්, බෙන්තොට ඒ. පී., WinC 2016, වයඹ ජාත්‍යන්තර සමුළුව, වයඹ විශ්වවිද්‍යාලය.

6.6 පරීක්ෂාකිරීම් හා මැණුම්, දෘඩකාංග පිලිසකර කිරීමේ හා උපදේශක සේවා

විදුලිබල ඉලෙක්ට්‍රොනික මිණුම් විද්‍යාගාරයේ පරීක්ෂාකිරීමේ හා මිණුම් සේවාවන් - ඉලෙක්ට්‍රොනික හා ක්ෂුද්‍ර ඉලෙක්ට්‍රොනික අංශය



වර්ෂය තුලදී මෙම අංශය මගින්, බැටරි, වෝල්ටියතාවය වෙනස්වීමෙන් ආරක්ෂා කිරීමේ උපකරණ (SPDS), විද්‍යුත් පරිපථ විසන්ධිකිරීමේ ඒකක, ඉතා කුඩා පරිපථ විසන්ධි කිරීමේ ඒකක, විදුලි පේණු, සොකට්, ස්විච LTE, PSTN දුරකථන හා රවුටර් පරීක්ෂාකිරීම් සඳහා ක්‍රියාකාරිත්ව පරීක්ෂණ වාර්තා 215 නිකුත්කරනු ලැබීය. සේවාලාභී පිහිටීම් වලදී සිදුකරනු ලබන විදුලිබලයේ තත්වය මැනබැලීම්වලට අමතරව මෙම අංශය මගින් විද්‍යුත්/ඉලෙක්ට්‍රොනික නිෂ්පාදනවල ආරක්ෂාව පරීක්ෂා කිරීම හා තත්වය මැනබැලීමද සිදුකරනු ලැබීය.

ඔරෙල් කෝපරේෂන්, මයික්‍රොපවර් ඉන්ජිනියරින්, ශ්‍රී ලංකා ටෙලිකොම්, කෙවිල්ටන් ඉලෙක්ට්‍රිකල් ප්‍රොඩක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, සොෆ්ලොජික් හෝල්ඩින්ග්ස් පීඑල්සී, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, ඩීසල් හා මෝටර් ඉන්ජිනියරින් ජීඑල්සී, බැටරි නිෂ්පාදකයින්ගේ සංවිධානය ප්‍රධාන සේවාලාභීන් වේ.

ඉලෙක්ට්‍රොනික හා ක්ෂුද්‍ර ඉලෙක්ට්‍රොනික අංශය මගින් සිදුකරනු ලැබූ ගැටළු විසඳීමේ/පිලිසකර කිරීමේ සේවා හා උපදේශක සේවාවන්

සමාලෝචනයට ලක්කරන කාලය තුලදී ඉලෙක්ට්‍රොනික හා ක්ෂුද්‍ර ඉලෙක්ට්‍රොනික අංශය මගින් ප්‍රධාන උපදේශක සේවා, දෘඩකාංග පිලිසකර කිරීම් 52 ක් භාරගනු ලැබීය.

භාරගනු ලැබූ දෘඩකාංග පිලිසකර කිරීම්වලට බ්‍රැන්ඩික්ස් ඇපරල් සොලියුෂන් ලිමිටඩ් සඳහා ෆෝක්ලිෆ්ට් පරිපථ කාඩ් 02 ක් අළුත්වැඩියා කිරීම, රත්මලාන තාක්ෂණික විද්‍යාලයේ දෝලනේක්ෂය අළුත්වැඩියාකිරීම, ලැබෝරටරි ඉක්විප්මන්ට් කම්පනී ලිමිටඩ් සඳහා දෝලනේක්ෂයක් අළුත්වැඩියාකිරීම රුහුණු විශ්ව විද්‍යාලය සඳහා ෆයිබර් ඔප්ටිකල් සම්ප්‍රේෂකය, දෝලනේක්ෂය, විදුලිබල සැපයුම් හා ක්‍රියාකාරී උත්පාදක අළුත්වැඩියාකිරීම ආදිය අයත්වේ.

සන්නිවේදන අංශය මගින් සිදුකරන ලද පරීක්ෂාකිරීම් හා මැණුම් හා දෘඩකාංග පිලිසකර කිරීමේ සේවාවන් හා උපදේශක සේවාවන්

පරීක්ෂාකිරීමේ හා මැණුම් සේවාවන් යටතේ ලක්විරු රේඩියෝ, කැළණි කේබල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, සෙඩර් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්, විශේෂ කාර්ය බලකාය, මහජන බැංකුව, අයිරි් ටෙක්නික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආදී සේවාලාභීන් සඳහා ගුවන්විදුලි සංඛ්‍යාත ආශ්‍රිත හා කේබල් ලක්ෂණ මැණීමේ කාර්යයන් 04 ක් හා විශේෂ උපදේශක සේවා 05ක් සිදුකරනු ලැබීය.

ක්‍රමාංකය විද්‍යාගාරය මගින් ලබාදෙන ලද උපකරණ ක්‍රමාංකන සේවා/ක්‍රියාකාරිත්වය පරීක්ෂාකිරීමේ සේවා - කාර්මික සේවා අංශය

වර්ෂය තුල ප්‍රධාන වශයෙන්ම ඉලෙක්ට්‍රොනික හා විද්‍යුත් පරීක්ෂාකිරීම් උපකරණ සඳහා ක්‍රමාංකන සේවාවන් සිදුකරනු ලැබූ අතර කර්මාන්තවල ඉල්ලීම අනුව ක්‍රමාංකන වාර්තා 103 ක් නිකුත් කරනු ලැබීය. ක්‍රමාංකනය කරන ලද උපකරණවලට ඩිජිටල්/ඇනලොග් මල්ටිමීටර්, දෝලනේක්ෂ, AC/DC ක්ලැප් මීටර්, ඉහල වෝල්ටීයතා ටෙස්ටර්, හිංසාම් ටෙස්ටර්, ප්‍රොසෙස් මීටර්, විදුලිබල හා සංඛ්‍යාත අධීක්ෂණය කිරීමේ උපකරණ, වොට් මීටර්, වෝල්ට් මීටර්, පවර් කොලිටි ඇනලයිසර්, එහා මෙහා ගෙනයාහැකි උපකරණ ටෙස්ටර්, තාපපරිවාරක අඛණ්ඩවම පවත්වාගෙන යාමේ ටෙස්ටර්, භූගතකිරීම් ටෙස්ටර්, RCCB ටෙස්ටර් හා Loop ටෙස්ටර් අයත්වේ.



SGS ලංකා, ලංකා ට්‍රාන්ස්ෆෝමර්ස් ලිමිටඩ්, කොහුකු ලංකා, ශ්‍රී ලංකා නාවුක හමුදාව, වෙනෝරා ඉන්ටර්නැෂනල් සහ ඩේවිඩ් පීරිස් මෝටර් සමාගම ප්‍රධාන සේවාලාභීන්වේ.

LMS පරීක්ෂණාගාරය මගින් සලසනු ලැබූ ආලෝක මිණුම් සේවා - කාර්මික සේවා අංශය

වසර පුරාම CPL හා LED බල්බ පරීක්ෂාකිරීමේ සේවාවන් සිදුකරනු ලැබූ අතර ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ සහයෝගිතාවය ඇතිව පරීක්ෂණ වාර්තා 90 ක් නිකුත්කරනු ලැබීය. කෙවිල්ටන් ඉලෙක්ට්‍රිකල් (ප්‍රයිවට්) ලිමිටඩ්, ඔරෙල්කෝපරේෂන් හා පිලිස්ස් ලයිටින් ලංකා ප්‍රධාන සේවාලාභීන්වේ.



වගකීම් පවත්වාගෙනයාමේ හා ගිවිසුම්ගත සේවා

සමාලෝචනයට ලක්වන කාලය තුල මහජන උපයෝගිතා කොමිසම සඳහා නිර්මාණයකර වැඩිදියුණු කරන ලද සත්‍ය RMS වෝල්ටියතා රෙකෝඩර් 05 ක් සාර්ථකව පවත්වාගෙනයාම සිදුකරනු ලැබීය.

දත්ත ගබඩා හා වෙනත් තොරතුරු පද්ධති පවත්වාගෙනයාමේ ගිවිසුම්

ගිණුම් පද්ධතිය - මොරටුව විශ්ව විද්‍යාලය

ගිණුම් පද්ධතිය - ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

වැටුප් පද්ධතිය - සංවර්ධන ලොතරැයි මණ්ඩලය

ගිණුම් පද්ධතිය - බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලය

7.0 ආයතනික පුහුණු, අධ්‍යාපනික වැඩසටහන් හා තොරතුරු බෙදාහැරීම

7.1 වෘත්තිකයන් සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) පුහුණු වැඩසටහන්

නවීන බලශක්ති ඉලෙක්ට්‍රොනික විද්‍යාව

26 දෙනෙකු සඳහා එක් (CPD) පුහුණු වැඩසටහන් පවත්වනු ලැබූ අතර එමගින් ලැබූ ආදායම රු.273,000/-කි. සහභාගිවූවන් සඳහා පොලවේ ප්‍රතිරෝධතාවය මැණුම්, බලශක්ති තත්වය විශ්ලේෂණය හා අනුවර්තී විශ්ලේෂණය, ස්විච් ආකාරයේ විද්‍යුත් සැපයුම්, අඩංගු කොටස්වල ලක්ෂණ, බැටරි සහ UPS වැනි නූතන විද්‍යුත් ඉලෙක්ට්‍රොනික විද්‍යාවේ භාවිතයන්, යෙදවුම්, වාසි හා අවාසි පිළිබඳ දැණුම හා ප්‍රායෝගික පුහුණුව ලබාදෙනු ලැබීය.

නවීන ඉලෙක්ට්‍රොනික අංග

22 දෙනෙකු සඳහා එක් (CPD) පුහුණු වැඩසටහන් පවත්වනු ලැබූ අතර එමගින් ලැබූ ආදායම රු. 341,000/= කි. සහභාගිවූවන් සඳහා දත්ත පරිවර්තනය කිරීමේ අංග සමඟ ඇනලොග් හා ඩිගිටල් යන නවීන ඉලෙක්ට්‍රොනික අංග දෙකම පිළිබඳ දැණුම හා ප්‍රායෝගික පුහුණුව ලබාදෙනු ලැබීය.

විදුලිසැර වැදීම් වලින් හා සර්ජ් ආරක්ෂක පද්ධති නිර්මාණය කිරීම

නවසීලන්තයේ වයිකටෝ විශ්ව විද්‍යාලයේ සේවය කරන ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ සහකාර මහාචාර්ය නිහාල් කුලරත්න මහතා විසින් කර්මාන්ත අංශයේ සහභාගිවන්නන් මෙන්ම ACCIMT ආයතනයේ තාක්ෂණ කාර්යමණ්ඩලයේ ප්‍රයෝජනය සඳහා මෙම CPD පුහුණු වැඩසටහන පවත්වන ලැබීය. නියමිත ගාස්තුවක් යටතේ බාහිර සහභාගිවන්නන්ට ද විවෘත මෙම පාඨමාලාව සඳහා 14 දෙනෙකු සහභාගි වූ අතර එමගින් රු.56,000/= ක ආදායමක් ලබාගෙන ඇත.

අවසානයට භාවිතාකරන්නන් සඳහා අඩු වෝල්ටීයතා පද්ධතිවලට යොදාගත හැකි වෝල්ටීයතාවය ඉහල යාමෙන් ආරක්ෂා වීමේ සංකල්පය පිළිබඳව මෙම වැඩසටහන පවත්වනු ලැබීය. එයට අදාල සිද්ධාන්තය, යොදාගත හැකි තාක්ෂණයන්, අදාල ජාත්‍යන්තර ප්‍රමිතීන්, දැනට ඇති තාක්ෂණයන්, හා කාර්මික ප්‍රායෝගිකතාවය හා නවීන තාක්ෂණය හා ඉදිරි ක්‍රියාකාරකම් පිළිබඳ සාරාංශයන් ගෙන් සමතුලිතව සමන්විත වූ සමස්ත ඉදිරිපත්කිරීම සඳහා තෝරාගත් පර්යේෂණ ප්‍රකාශන මගින් ද ආධාර වනු ලැබීය.

Embedded පාලන පද්ධති

ප්‍රධාන වශයෙන්ම කාර්මික අංශයේ 43 දෙනෙකු සඳහා CPD වැඩසටහන් 2ක් පවත්වනු ලැබීය

වැඩසටහන් ගත කල හැකි ලොජික් පාලන පද්ධතිය

වෙනත් ආයතනවල තාක්ෂණ අංශයේ තාක්ෂණ කළමණාකරුවන්, තාක්ෂණ නිලධාරීන්, හා උපාධි අපේක්ෂකයින් ගෙන් සමන්විත පුද්ගලයන් 69 දෙනෙකු සඳහා කණ්ඩායම් දෙකක් වශයෙන් 57-200 PLC පිළිබඳ දින පහත CPD වැඩසටහනක් පවත්වනු ලැබීය. ලංකා විදුලිබල මණ්ඩලය, ගුවන්තොටුපල හා ගුමන්ගමන් සමාගම, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව, ඛණිජතෙල් සංස්ථාව, කොළඹ නැව් තටාකාංගනය, කාර්මික සංවර්ධන මණ්ඩලය, ජර්මන් දූමිරිය සේවය, NERD මධ්‍යස්ථානය, හා රෙග්නීස් ලංකා පීඑල්සී ප්‍රධාන සහභාගි ආයතන විය.

7.2 මූලික හා මධ්‍යම මට්ටමේ තාක්ෂණ පුහුණු වැඩසටහන්

විද්‍යා උපාධි අපේක්ෂකයින් සඳහා තාරකා විද්‍යා දත්ත පිළියෙල කිරීම පිළිබඳ වැඩමුළුව

දේශීය විශ්වවිද්‍යාලවල උපාධි අපේක්ෂකයින් 25 දෙනෙකු සඳහා තාරක විද්‍යා දත්ත පිළියෙල කිරීම පිළිබඳ දින දෙකක වැඩමුළුවක් පවත්වනු ලැබීය. ඇ.එ.ජ. ග්‍රහලෝක විද්‍යා ආයතනයේ ජ්‍යෝෂ්ඨ පර්යේෂණ විද්‍යාඥ ආචාර්ය නලින් සමරසිංහ මහතා මෙම වැඩමුළුව සඳහා සම්පත් දායකයෙකු ලෙස සහභාගි විය.

7.3 විද්‍යාව හා තාක්ෂණය ජනප්‍රියකරවීම හා ප්‍රචාරය කිරීම

ACCIMT පුස්තකාලය

රටේ ඇති ඉතා උසස් තාක්ෂණික පුස්තකාලයක් ලෙස ශ්‍රේණිගතකරණ ලද ACCIMT පුස්තකාලය සතුව සන්නිවේදන, තොරතුරු තාක්ෂණ, ඉලෙක්ට්‍රොනික, ප්‍රෝටෝන විද්‍යාව, රොබෝ විද්‍යාව හා අභ්‍යවකාශ තාක්ෂණය යන ක්ෂේත්‍රවල පොත්පත්, සඟරා මෙන්ම වෙනත් අධ්‍යාපනික ලිපිලේඛනවල හොඳ එකතුවක් පවතී.

වෘත්තිකයන්, පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘතිවල නියැලි පුද්ගලයන් උපාධිධාරීන්, පශ්චාත් උපාධිධාරීන් හා ශිෂ්‍යයන් ආදී අය සඳහා අවශ්‍ය තොරතුරු ලබාගැනීමට පහසුකම් සැලසීම මෙම පුස්තකාලය මගින් අපේක්ෂා කෙරේ.

පුස්තකාල එකතුව

රට තුළ මෙන්ම රටින් පිටතින් ද ලබාගත් සත්‍ය හා නිදහස් ලෙස යාවත්කාලීන කරන ලද ඉතා වටිනා විශේෂ වාර්තා හා ප්‍රකාශනවල හොඳ එකතුවක් පුස්තකාලය සතුවේ. අත්පොත්, දත්ත පුස්තකාල, භාවිතයට ගත හැකි පරීක්ෂණ, නිෂ්පාදන මාර්ගෝපදේශ, අයදුම් සටහන්, නිර්මාණ සඳහා වන පෙළ පොත්, අති නවීන සමාලෝචන, විශ්වකෝෂ, ශබ්ද කෝෂ, නාමාවලි, හඬපට, VCDපට, DVDපට, CD-ROM දත්ත ගබඩා, ප්‍රමිතීන් ආදිය ඊට අයත්වේ. සන්නිවේදනය, තොරතුරු තාක්ෂණය ඉලෙක්ට්‍රොනික විද්‍යාව ආදී ක්ෂේත්‍රයන්ට අදාල විශේෂිත සඟරා වාර සඟරා අංශයෙන් ලබාගත හැක.

සම්පූර්ණ එකතුව:-

පොත්	- 8947
CD-ROMs	- 745
වීඩියෝ පට	- 368
හඬපට	- 94
VCDපට	- 130
DVDපට	- 87

අළුතෙන් ලබාගත්

පොත්	- 67

පුස්තකාල සේවාවන්

(අ) පොත් බැහැරදීමේ හා කියවීමේ පහසුකම් :- ACCIMT ආයතනයේ කාර්ය මණ්ඩලය හා පුහුණුවන්නන් සඳහා

(ආ) පොත් කියවීමේ පහසුකම් :- බාහිර කථිකාචාර්යවරු හා උපදේශකවරු, ව්‍යාපෘතිවල නියලි උපාධිධාරීන් හා පශ්චාද් උපාධි පාඨමාලා හදාරන ශිෂ්‍යයන්, CPD පාඨමාලා සඳහා සහභාගිවන්නන් හා පෞද්ගලික හා ආයතනික සමාජිකයන්

(ඇ) කියවන්නන් සඳහා ඇති පහසුකම් :- ඡායා පිටපත් ලබාගැනීමේ සේවාවන්, ස්කෑනින් පහසුකම්, අන්තර්ජාල පහසුකම් ඉලෙක්ට්‍රොනික පුස්තකාල පහසුකම්, අන්තර් පුස්තකාල ණය, දැණුවත්කිරීමේ සේවා, තොරතුරු හා ලේඛණ සැපයීමේ සේවා,

(ඈ) ප්‍රජාව සඳහා සේවාවන් :- රාජ්‍ය හා පෞද්ගලික කාර්මික අංශයේ වෘත්තිකයන් සඳහා සාමාජිකත්වය පිරිනැමේ. වෘත්තිකයන් හා විද්වතුන් ((a) කාර්මික (b) විශ්ව විද්‍යාල ආචාර්යවරු හා පර්යේෂකයන් (c) විශේෂ උනන්දුවක් ඇති සාමාන්‍ය ජනයා) සඳහා තොරතුරු හා ලේඛණ සැපයීමේ සේවා ප්‍රදර්ශන හා තාරකාවිද්‍යා ප්‍රවර්ධන වැඩසටහන් සඳහා ප්‍රදර්ශක භාණ්ඩ ලබාදීම

අන්තර්ජාලය හරහා මහජනයා සඳහා විවෘත පිවිසුම් වලිය (http://www.accimt.ac.lk).

පොත් එකතුව පිළිබඳ විස්තර අන්තර් ජාලය ඔස්සේ ACCIMT සෘජු මාර්ගගත පුස්තකාල නාමාවලිය මගින් ලබාගත හැක. ආයතනයේ LAN මගින් පුස්තකාල එකතුව පිළිබඳව සොයා බැලීම සඳහා පුස්තකාලය භාවිතා කරන්නන්ට පරිගණක පහසුකම් ද සපයා දී ඇත.

තාරකා විද්‍යාව හා අභ්‍යවකාශ විද්‍යාව ජනප්‍රිය කිරීමේ වැඩසටහන්

පාසල් සිසුන්, විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් හා ආරක්ෂක හමුදා සාමාජිකයන් සඳහා තාරකා විද්‍යා දේශණ

පුද්ගලයන් 580 දෙනෙකු පමණ ACCIMT අයතනය නැරඹීමට පැමිණ අතර තාරකා විද්‍යා දේශණ හා දුරේක්ෂ ප්‍රදර්ශන සඳහා සහභාගි විය.

අඟහරු ග්‍රහයාගේ මාරුවීම පිළිබඳ මහජන නිරීක්ෂණ සැසිවාරය

අඟහරු ග්‍රහයාගේ මාරුවීම පිළිබඳ මහජන නිරීක්ෂණ සැසිවාරය 2016 මැයි මස 09 වන දින ACCIMT ආයතනයේදී පවත්වනු ලැබීය.

පාසල් සඳහා තාරකා විද්‍යා තොරතුරු හා අභ්‍යවකාශ විද්‍යා තොරතුරු බෙදාහැරීම

සිසුන් 10 දෙනෙකු සඳහා තාරකා විද්‍යාව හා අභ්‍යවකාශ විද්‍යාව පිළිබඳ දැණුම ලබාදෙනු ලැබීය.

ජලය මගින් ක්‍රියාත්මක රොකට් තරග - 2015

පාසල් ළමුන් අතර අභ්‍යවකාශ විද්‍යාව ප්‍රචලිත කිරීම අරමුණු කරගෙන ACCIMT ආයතනය මගින් ජල රොකට් සෑදීමේ වැඩමුළුවක් හා ජල රොකට් තරගයක් වාර්ෂිකව සංවිධානය කරනු ලැබේ. දිවයිනේ විවිධ ප්‍රදේශවලින් පැමිණි ගුරුවරුන් 54 දෙනෙකු හා ශිෂ්‍යයන් 57 දෙනෙකු ජල රොකට් නිර්මාණය කිරීමේ වැඩමුළුවට සහ ජල රොකට් තරගය සඳහා සහභාගි විය. දේශීය වශයෙන් පවත්වන ජල රොකට් තරගයේ ජයග්‍රාහකයන්ට ආසියා-පැසිපික් කලාපීය අභ්‍යවකාශ නියෝජිතායතන සංසදය (APRSAF) මගින් 2016 නොවැම්බර් 15-18 දිනවල දී පිලිපීනයේ මැනිලා නුවර පවත්වන ලද ජාත්‍යන්තර ජල රොකට් තරගයේ 23 වන සැසිවාරය (APRSAF-23) සඳහා සහභාගි වීමේ අවස්ථාව හිමිවිය.

APRSAF මගින් සංවිධානය කරනු ලැබූ පෝස්ටර් නිර්මාණ තරගය

වයස අවු. 8 ත් 11 අතර ආරම්භක සිසුන් සඳහා අභ්‍යවකාශ විද්‍යාව නිර්මාණාත්මක ඉදිරිපත් කිරීම් හා ඉගෙනීම සඳහා යොමු කිරීම සඳහා පෝස්ටර් නිර්මාණය කිරීමේ තරගයක් සංවිධානය කරනු ලැබේ. "මගේ සිහින ග්‍රහලෝකය" යන තේමාව යටතේ සංවිධානය කරනු ලැබූ දේශීය පෝස්ටර් තරගය මගින් තෝරාගනු ලැබූ හොඳම නිර්මාණ 3 2016 නොවැම්බර් 15-18 දිනවල දී පිලිපීනයේ මැනිලා නුවර පැවති APRSAF 23 වන සැසිවාරය සඳහා ඉදිරිපත් කරනු ලැබීය.

8.0 විශේෂ අවස්ථා සහ ප්‍රදර්ශණ

ආතර් සී ක්ලාක් අනුස්මරණ දේශණය - 2016

ආයතනයේ ආරම්භක අනුශාසක වූ ශ්‍රී ලංකා දේශභිමානය ආතර් සී ක්ලාක් ශ්‍රීමතානන් අභාවප්‍රාප්තවී දහඅට වන සංවත්සරය සැමරීම සඳහා වනදේශණය කීර්තිමත් ශ්‍රී ලාංකික විද්‍යාඥයකු වන ඇමරිකා එක්සත් ජනපදයේ කැලිපෝනියාවේ, නාසා ආයතනයේ (Jet Propulsion) ක්ෂේප ප්‍රචාලන විද්‍යාගාරයේ අධෝරක්ත වර්ණාවලි අනාවරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ආචාර්ය සරත් ගුණපාල මහතා විසින් සිදුකරනු ලැබීය.

“අපගේ සූර්ය ග්‍රහ මණ්ඩලයෙන් එහා ගවේෂණයකිරීම.... ” යන මැයෙන් මෙම දේශණය පවත්වනු ලැබූ මෙම දේශණය සඳහා ප්‍රතිපත්ති සම්පාදකයන්, ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන්, ඉංජිනේරුවන්, විද්‍යාඥයින්, අධ්‍යාපනඥයින්, අනෙකුත් වෘත්තිකයන් හා ශිෂ්‍යයින් ඇතුළු විශාල පිරිසක් සහභාගි විය.

ප්‍රදර්ශන

ACCIMT ආයතනය 2016 ඔක්තෝබර් 07-09 දක්වා BMICH හිදී පවත්වන ලද ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය මගින් සංවිධානය කරනු ලැබූ ප්‍රධාන ජාතික ඉංජිනේරු හා තාක්ෂණික ප්‍රදර්ශනය වන Techno 2016 සඳහා සහභාගි විය. මීට අමතරව ආයතනය පාසල් ප්‍රදර්ශණ කීපයක් සඳහා ද සහභාගි විය.

9.0 මානව සම්පත් සංවර්ධනය

කාර්ය මණ්ඩලයේ තත්වය

ACCIMT ආයතනය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් කාර්ය මණ්ඩල තනතුරු 177 ක් අනුමත කර ඇති අතර 2016 අවසානය වනවිට ඉන් තනතුරු 91 ක් සඳහා බඳවාගෙන ඇති අතර ඉතිරි තනතුරු 86 පුරප්පාඩුව පවතී. පුරප්පාඩුව පවතින තනතුරු වලින් බහුතරයක් ඉංජිනේරු උපාධිය හෝ ඒ හා සමාන සුදුසුකම් මූලික සුදුසුකම් ලෙස අවශ්‍ය කෙරෙන තාක්ෂණ ක්ෂේත්‍රයේ තනතුරු වේ.

2016 වසරේදී, නව පත්කිරීම් 17 සිදුකෙරිණ. නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන හා මූල්‍ය), පර්යේෂණ ඉංජිනේරුවන් දෙදෙනෙක්, පර්යේෂණ විද්‍යාංඥයින් පස්දෙනෙක්, වැඩ පරීක්ෂකවරයෙක්, ඉංජිනේරු සහකාරවරු දෙදෙනෙක්, කළමනාකරණ සහකාර නිලධාරින් දෙදෙනෙක්, රියදුරන් තිදෙනෙක්, එක් කාර්යාල කාර්ය සහායකයෙක් මෙසේ බඳවාගනු ලැබීය.

වර්ෂය තුලදී ආයතනයේ සේවකයින් හත්දෙනෙකු ඉල්ලා අස්විය. ඊට පර්යේෂණ ඉංජිනේරුවන් දෙදෙනෙක්, ඉංජිනේරු සහකාරවරු හතරදෙනෙක් හා රියදුරෙක් ඇතුලත්වේ.

වර්ෂය තුලදී පර්යේෂණ ඉංජිනේරුවරයෙක් හා කළමනාකරණ සහකාර නිලධාරියෙක් සඳහා උසස්වීම් දෙකක් සිදුකරනු ලැබීය.

2016 දෙසැම්බර් 31 වනවිට ආයතනයේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරින් සංඛ්‍යාව 56 ක් විය.

ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා වැඩමුළු දෙකක් පවත්වන ලද අතර දේශීය පුහුණු අවස්ථා අටක් ලබාදෙනු ලැබීය.

10.0 2016 වසර සඳහා මූල්‍ය ප්‍රකාශන

10.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන		2016 රු.'000		2015 රු.'000
වත්කම්					
ජංගම වත්කම්					
මුදල් හා මුදලට සමාන දෑ	2		58,896		73,859
කෙටිකාලීන ආයෝජන	2ඒ		20,417		19,154
වෙළඳ හා වෙනත්ලැබිය යුතු	3ඒ සහ බී	32,178		32,738	
අඩුකලා බොල් ණය සඳහා ප්‍රතිපාදන		(2,480)	29,698	(5,019)	27,719
භාණ්ඩ වට්ටෝරු/තොග	4		9,357		9,392
පූර්ව ගෙවීම්	5		3,128		2,496
			121,496		132,620
ජංගම නොවන වත්කම්					
ආයෝජන					
කාර්යයමණ්ඩලය සඳහා ණය	3.ඒ. ඒ		7,955		7,060
දේපළ පිරියත හා උපකරණ	6		231,911		198,548
			239,866		205,608
සිදු කෙරෙමින් පවත්නා ඉදිකිරීම්	7		18,502		12,730
සම්පූර්ණ වත්කම්			379,864		350,958
වගකීම්					
ජංගම වගකීම්					
ගෙවිය යුතු	8		9,930		10,848
උපචිත වියදම්	9		4,933		4,038
			14,863		14,886
ජංගම නොවන වගකීම්					
විලම්බිත ආදායම්	10		10,206		10,711
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්	11		29,795		27,131
			40,001		37,842
සම්පූර්ණ වගකීම්			54,864		52,728
ශුද්ධ වත්කම්			325,000		298,230
ශුද්ධ වත්කම්/ස්කන්ධ ප්‍රාග්ධනය	12				
රජය මගින් දායක වූ ප්‍රාග්ධනය			371,627		325,201
සංචිත			73,550		71,892
එකතු වූ අතිරික්තය (හිඟය)			(120,177)		(98,863)
මුළු ශුද්ධ වත්කම / ස්කන්ධ ප්‍රාග්ධනය			325,000		298,230

පිටු 07 සිට 13 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා පිටු 14 සිට 38 දක්වා වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටසක්වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට වගකීම් පැවරේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ මූල්‍ය ප්‍රකාශන සඳහා ඒ වෙනුවෙන් මෙසේ අත්සන් කරනු ලැබේ.

සභාපති | අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිලධාරි | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්)

10.2 2016 වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය

	2016	2015
	රු.'000	රු.'000
ආදායම		
පුනරාවර්තන ලැබීම්	92,878	111,500
වෙනත් ආදායම්	17,029	17,376
ක්‍රමක්ෂය	29,772	23,200
මුළු ආදායම	139,679	152,076
වියදම්		
පුද්ගල පඩිනඩි	75,811	79,679
ගමන් වියදම්	4,437	3,270
සැපයුම් හා අවශ්‍යතා	11,575	6,948
ක්ෂය කිරීම්	29,772	23,200
අළුත්වැඩියාවන් හා නඩත්තු	7,638	6,689
ප්‍රවාහන, සන්නිවේදන		
උපයෝජන හා වෙනත් සේවාවන්	17,144	16,466
ව්‍යාපෘති වියදම්	7,555	4,832
වෙනත් මෙහෙයුම් වියදම්	1,034	1,480
මුළු වියදම්	154,966	142,564
අදාල කාලය සඳහා අතිරික්තය /හිඟය	(15,287)	9,512
2016.12.31 දිනෙන් අවසන් වන වසර සඳහා ආදායම් හා වියදම් විසර්ජන ගිණුම		
අදාල කාලය සඳහා අතිරික්තය/ (හිඟය)	(15,287)	9,512
PC ගිණුම් වලින් උත්පාදනය වූ අරමුදල් වලින් (සටහන 13) අතිරික්තය මාරු කිරීම්	(6,027)	(6,363)
අදාල කාලය සඳහා ශුද්ධ අතිරික්තය/ (හිඟය)	(21,314)	3,149

10.3 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා විස්තරාත්මක මූල්‍ය කාර්යසාධනය

2015		2016	
රු.	ආදායම	රු.	
111,500,000.00	රජයේ ප්‍රතිපාදන - පුනරාවර්තන		92,878,000.00
4,863,700.00	පාඨමාලා ගාස්තු	4,489,057.14	
9,013,818.75	ව්‍යාපෘති ආදායම/උපදේශණ සේවා ආදායම	9,033,554.16	
416,842.37	භාණ්ඩාගාර බිල්පත් සඳහා පොලී ආදායම	574,072.80	
339,890.23	පොලී ආදායම	319,206.41	
549,000.00	ටෙන්ඩර තැන්පතු	100,000.00	
2,192,252.96	වෙනත් ආදායම්	1,694,639.56	
	ප්‍රදානයන්ගේ ආදායම්		
	අනුග්‍රහකත්ව ආදායම	735,925.64	
	ස්ථාවර වත්කම් අපහරණය මගින් ඉපයූ ආදායම්	82,617.93	
23,200,087.85	ක්‍රම ක්ෂය	29,772,155.52	46,801,229.16
152,075,592.16	මුළු ආදායම		139,679,229.16
	වියදම්		
	පුද්ගල පඩිනඩි		
57,869,532.91	වැටුප් හා වේතන	55,742,480.60	
1,036,951.38	අතිකාල හා නිවාඩු දින වැටුප්	1,462,785.43	
300,000.00	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් සඳහා දීමනා	324,000.00	
6,791,141.00	වෙනත් දීමනා	5,736,929.00	
8,008,330.73	සේ.අ.අ. (E.P.F.)	8,091,172.09	
1,601,666.19	සේ.භා.අ. (E.T.F.)	1,618,234.80	
4,071,298.46	පාරිතෝෂික	2,835,497.91	75,811,099.83
79,678,920.67			
	ගමන් වියදම්		
653,908.83	ගමන් වියදම් - දේශීය	379,514.75	
2,615,963.55	ගමන් වියදම් - විදේශීය	4,057,355.88	4,436,870.63
3,269,872.38			

2015		2016	
රු.	සැපයුම් හා අවශ්‍යතා	රු.	
1,060,233.42	ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා	1,710,169.65	
3,512,928.21	ඉන්ධන	8,409,432.07	
(13,960.41)	යාන්ත්‍රික හා ඉලෙක්ට්‍රොනික භාණ්ඩ / විද්‍යාගාර උපකරණ	114,360.90	
77,029.20	නිල ඇඳුම්	218,024.00	
29,185.50	වාර සභරා	768.00	
908,994.40	සුභසාධක අයිතම	736,964.27	
1,373,846.93	ප්‍රදර්ශන හා සම්මන්ත්‍රණ	105,747.50	
-	තොග ගැලපීම්	280,239.42	11,575,705.81
6,948,257.25			
	අළුත්වැඩියාවන් හා නඩත්තු කටයුතු		
2,785,546.47	ගොඩනැගිලි	3,218,997.60	
2,477,303.66	උපකරණ	1,468,349.35	
1,426,089.02	රථවාහන	2,950,802.83	
23,200,087.85	ක්ෂයවීම්	29,772,155.52	37,410,305.30
29,889,027.00			
	ප්‍රවාහනය, සන්නිවේදන උපයෝජන හා වෙනත් සේවාවන්		
3,815,523.90	දුරකථන	4,982,983.06	
105,305.00	තැපැල් ගාස්තු	99,850.00	
93,800.00	බැංකු ගාස්තු	65,730.00	
2,966,941.02	රක්ෂණ	4,206,473.38	
2,485,428.75	වෙළඳ දැන්වීම්	1,399,658.40	
130,271.20	සත්කාරක හා සංග්‍රහ වියදම්	98,317.88	
1,434,772.00	ආරක්ෂක	1,853,606.86	
1,108,471.10	වෙනත් වියදම්	1,522,402.79	
4,353,533.50	විදුලිය	5,173,403.86	
306,335.83	ජලය	280,451.77	
(334,785.57)	බොල් ණය	(2,539,175.25)	17,143,702.75
16,465,596.73			
	ව්‍යාපෘති වියදම්		
4,832,358.95	පාඨමාලා/ව්‍යාපෘති	7,554,709.48	7,554,709.48
4,832,358.95			

2015		2016	
රු.		රු.	
	වෙනත් මෙහෙයුම් වියදම්		
172,052.08	සාමාජික ගාස්තු	149,159.57	
1,307,620.00	කාර්ය මණ්ඩල පුහුණු	884,706.42	1,033,865.99
1,479,672.08			
142,563,705.06	මුළු වියදම්		154,966,259.79
9,511,887.10	අදාල කාලය සඳහා අතිරික්තය/(හිඟය)		(15,287,030.63)

10.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2016	2015
මෙහෙයුම් කටයුතු මගින් මුදල් ප්‍රවාහ	රු. 000	රු. 000
සාමාන්‍ය කටයුතු මගින් ඉපයූ අතිරික්තය /(හිඟය)	(15,287)	9,512
මූල්‍යමය නොවන ගනුදෙනු		
ක්ෂයකිරීම්	29,772	23,200
ක්‍රම ක්ෂය	-	(23,200)
බොල් ණය සඳහා ප්‍රතිපාදන	(2,539)	(335)
හඳුනාගත් ප්‍රතිලාභ සැලසුම් සඳහා ප්‍රතිපාදන	2,835	4,071
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම්/ලාභය (පාඩු)	14,781	13,248
වෙලඳ හා වෙනත් ලැබීම්වල (වැඩිවීම) / අඩුවීම	(335)	1,847
බඩු වට්ටෝරුවල (වැඩිවීම්)/අඩුවීම	35	(83)
ගෙවීම්වල (වැඩිවීම)/අඩුවීම්	(632)	(444)
ගෙවිය යුතු වැඩිවීම්/(අඩුවීම්)	(918)	(1,691)
උපචිත වියදම්වල වැඩිවීම/(අඩුවීම)	895	802
මෙහෙයුම් මගින් ඉපයූ මුදල්	13,826	13,679
ගෙවනු ලැබූ හඳුනාගත් ප්‍රතිලාභ සැලසුම්වල පිරිවැය	(201)	(1,462)
ඉවත ලන භාණ්ඩ විකිණීමෙන් ලැබූ ලාභය	(83)	-
විලම්භිත ආදායම	(505)	(405)
මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් ලැබූ ශුද්ධ මූල්‍ය/ (යෙදවීම්)	(789)	(1,867)
ආයෝජන ක්‍රියා/ (යෙදවීම්) මගින් ලැබූ මූල්‍ය ප්‍රවාහ		
දේපල, පිරියත හා උපකරණ අත්පත්කර ගැනීම	(57,522)	(30,272)
කෙටිකාලීන ආයෝජන	(1,266)	(996)
පොලිය හා වෙනත්	-	(2,609)
පොලී හා වෙනත් ලැබීම්	286	869
දේපල, පිරියත හා උපකරණ අපහරණය මගින් ලද ලැබීම්	167	-
සිදු කෙරෙන ප්‍රාග්ධන කාර්යයන්	(20,406)	(361)
ආයෝජන ක්‍රියාකාරකම්/ (යෙදවුම්) මගින් ලද ශුද්ධ මූල්‍ය ප්‍රවාහ	(78,741)	(33,369)
මූල්‍ය ක්‍රියාකාරකම් (යෙදවුම්) මගින් ලද මූල්‍ය ප්‍රවාහ		
මූලධන ප්‍රදාන මගින් ලැබීම්	85,433	31,409
අරමුදල් භාවිතාකිරීම	(34,692)	-
මූල්‍ය ක්‍රියාකාරකම්/ (යෙදවුම්) මගින් ලද ශුද්ධ මූල්‍ය ප්‍රවාහ	50,741	31,409
මුදල් හා මුදලට සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)	(14,962)	9,852
වසර ආරම්භයේ තිබූ මුදල් හා මුදලට සමාන දෑ	73,859	64,007
වසර අවසානයේ ඇති මුදල් හා මුදලට සමාන දෑ	58,896	73,859

10.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන් - වැදගත් ගිණුම් ප්‍රතිපත්ති

සාමාන්‍ය ප්‍රතිපත්ති

වාර්තා කරනු ලබන ආයතනය

1994 අංක 04 දරණ විද්‍යා හා තාක්ෂණ වැඩිදියුණු කිරීමේ පනත යටතේ ස්ථාපිත නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය (මෙහි මින්මතු ''ආයතනය'' ලෙස හඳුන්වනු ලබන) මොරටුව, කටුබැද්ද බණ්ඩාරනායක මාවතේ පිහිටා ඇත.

ආයතනයේ ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම් ස්වභාවය

ආයතනයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වනුයේ;

(අ) ශ්‍රී ලංකාවේ නවීන තාක්ෂණය හඳුන්වාදීම වේගවත් කිරීම සඳහා,

(i) නවීන තාක්ෂණයන් යොදාගැනීම සඳහා පර්යේෂණ හා සංවර්ධන ආරම්භ කිරීම, දිරිමත් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

(ii) රාජ්‍ය හා පෞද්ගලික අංශය මගින් සිදුකරන කාර්යයන් සඳහා නවීන තාක්ෂණය යොදාගැනීම පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන සහය ලබාදීම.

(iii) රාජ්‍ය හා පෞද්ගලික අංශය මගින් සිදුකරන කාර්යයන්වලදී නවීන තාක්ෂණය පිළිබඳවම පුද්ගලයන් පුහුණු කිරීම

(ආ) අනාගත අධ්‍යයනයන් දිරිමත් කිරීම

සන්නිවේදනය හා අදාල විද්‍යාවන්, තොරතුරු තාක්ෂණය, ඉලෙක්ට්‍රොනික විද්‍යාව, විදුලි සංදේශනය, ක්ෂුද්‍ර ඉලෙක්ට්‍රොනික විද්‍යාව, අභ්‍යවකාශ තාක්ෂණය, රොබෝ විද්‍යාව, පොටෝනික්ස් හා නව ද්‍රව්‍ය යන ක්ෂේත්‍ර නවීන තාක්ෂණයන්ට අයත්වේ.

සේවකයන් සංඛ්‍යාව

වාර්තා කරනු ලබන කාලය අවසානයේදී සේවයේ නියුතු ස්ථීර සේවකයන් සංඛ්‍යාව 90 කි.

සකස් කිරීම සඳහා පාදක කරගත් කරුණු

(අ) අනුකූලතා ප්‍රකාශය

මූල්‍ය ප්‍රකාශන සඳහා මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය, ශුද්ධ වත්කම්/ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස්වීමේ ප්‍රකාශය මුදල් ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශය හා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඇතුලත්වේ. මෙම ප්‍රකාශන, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් නිකුත් කරනු ලැබූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිතීන්ට (SLPSAS) අනුකූලව සකස් කර ඇත.

(ආ) මිණුම් සඳහා පදනම

අදාල සටහන් යටතේ සාධාරණ අගයන් පිළිබඳව සුදුසු අනාවරණයන් සිදු කරනු ලබන අවස්ථාවලදී හැර මූල්‍ය ප්‍රකාශන අතීත පිරිවැය සංකල්පය මත පිළියෙල කර ඇත.

(ඇ) තුලනාත්මක තොරතුරු

වත්මන් කාලය සඳහා මූලය ප්‍රකාශන පිළිබඳ අවබෝධය වැඩිදියුණු කිරීම හා අන්තර්කාලීන තුලනය වැඩිදියුණුකිරීම සඳහා පසුගිය කාලය සඳහා මූල්‍ය ප්‍රකාශන මගින් අනාවරණය වී ඇති සියලුම අගයන් පිළිබඳ ප්‍රමාණාත්මක දත්ත, ඒ සඳහා හේතුවූ කරුණු හා විස්තරාත්මක කරුණු තුලනාත්මක තොරතුරුවලට ඇතුලත්වේ.

වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම් පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත්කර ඇති සියලු කාල සීමාවන්වලට අනුකූල වන ලෙස යොදාගෙන ඇත.

(ඈ) ක්‍රියාත්මක හා ඉදිරිපත් කරනු ලබන මුදල් වර්ගය

ආයතනයේ ව්‍යවහාර කරන හා ගිණුම් ඉදිරිපත් කරනු ලබන මුදල වන ශ්‍රී ලංකා රුපියල් වලින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලැබේ.
වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම්, ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කරනු ලබන මූල්‍ය තොරතුරු ආසන්න දහස් සංඛ්‍යාවෙන් දක්වනු ලැබේ.

(ඉ) ඇස්තමේන්තු හා විනිශ්චයන්ගේ ප්‍රයෝජන

කළමනාකාරිත්වයට ගිණුම් ප්‍රතිපත්ති යෙදවුම හා වාර්තා වූ වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් කෙරෙහි බලපාන විනිශ්චයන් තක්සේරුකිරීම් හා උපකල්පන සිදුකිරීම සඳහා SLPSAS ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීම හා අවශ්‍ය කෙරේ. සත්‍ය වියදම් මෙම ඇස්තමේන්තු හා යොදාගත් විනිශ්චයන්ගෙන් වෙනස්විය හැක.

ඇස්තමේන්තු හා වැදගත් උපකල්පනයන් සිදුකරගෙන යන පදනම මත සමාලෝචනය කෙරේ. සංශෝධන ඒවා සිදුකරනු ලැබූ කාලය තුලදී පමණක් හෝ සංශෝධනය සිදු කරනු ලබන කාලය තුලදී හා අනාගත කාලයේදී, සංශෝධන මගින් වර්තමාන හා අනාගත කාලයක් යන දෙකම සඳහා බලපාන්නේ නම් ඇස්තමේන්තු සංශෝධන සිදුකරනවිට ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා සංශෝධන හඳුනාගැනේ.

ඇස්තමේන්තුවල වැදගත් ක්ෂේත්‍ර පිළිබඳ තොරතුරු, මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත් ප්‍රමාණ කෙරෙහි වඩා වැදගත් බලපෑම් ඇතිකරනු ලබන, ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගැනීමේදී සිදුකරණ අවිනිශ්චිත හා වැදගත් විනිශ්චයන් පිළිබඳව මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන්වල ඇතුලත්වේ.

වත්කම් හා ඒවායේ වටිනාකම තක්සේරු කිරීමේ පදනම

දේපළ, පිරියත හා උපකරණ

(අ) හඳුනාගැනීම හා මැනීම

දේපල, පිරියත හා උපකරණවලට අයත් අයිතම පිරිවැය ලෙස හෝ සමුච්චිත ක්ෂයවීම් අඩුකර සාධාරණ අගයක් ලෙස දැක්වේ.
දේපල, පිරියත හා උපකරණවලට අයත් සියළු අයිතම, සමුච්චිත ක්ෂයවීම් අඩුකර පිරිවැය අනුව මූලිකව සටහන් කරනු ලැබේ. වත්කමක වැදගත් අංග වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන ක්ෂය කිරීම සිදුකෙරේ. දේපල, පිරියත හා උපකරණවල වැදගත් කොටස් යම් කාල පරාසයකදී ප්‍රතිස්ථාපනය කල යුතු වූ විට ආයතනය මගින් ප්‍රතිස්ථාපනය කරන ලද කොටස අත්හැර දමා නව කොටස හා එමගින් ප්‍රයෝජන ලබන කාලය හා ක්ෂයවීම පිළිබඳව සලකා බැලේ. වෙනත් සියළු අළුත්වැඩියාවන් හා නඩත්තු වියදම් දරන ලද වියදම් ලෙස ආදායම් ප්‍රකාශයේ දැක්වේ.

(ආ) පිරිවැය

දේපල, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීමේ හෝ ඉදිකිරීමේ වියදම් හා ඒ හා සම්බන්ධ වෙනත් වියදම් පිරිවැයවේ. දේපල පිරියත හා උපකරණවල මිලදී ගැනීමේ වියදම හා එම වත්කම එමගින් අපේක්ෂා කරන කාර්යය සඳහා ක්‍රියාත්මක තත්වයට ගෙනඒමට සෘජු ලෙස දරන ලද වියදම් වලින් එකී පිරිවැය සමන්විතවේ.
වත්කමක් පවත්වාගෙන යාම හෝ එමගින් මුදල් ඉපයීමේ ධරිතාවය ඉහල නැංවීම සඳහා ස්ථාවර ආකාරයේ වත්කමක් අත්පත් කර ගැනීම, විස්කෘති කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා තදනන්තරව දරන ලද වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකා ඇත.

ප්‍රධාන පිරික්සුම්, පිලිසකර කිරීම් වියදම් ඇතුළුව දේපල, පිරියත හා උපකරණවල කොටසක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා වෙන් වශයෙන් දරන ලද වියදම මුදල් බවට පත්කෙරේ. එකී කොටස් මගින් ආයතනයට අනාගත ආර්ථික ප්‍රතිලාභ ලබාදීමේ ප්‍රවනතාවයක් ඇත්නම් හා එහි පිරිවැය විශ්වාසනීයව මැනිය හැකි නම් පමණක් වෙනත් තදන්තර වියදම් මුදල් බවට පත්කෙරේ.

ආයතනය පිහිටි ඉඩම උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් දේපලක් වන අතර එය ආයතනයේ කටයුතු සිදුකරගෙන යාම සඳහා විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයට පවරනු ලැබ ඇති බැවින් ඉඩමේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල සඳහන් නොවේ. ආයතනය හා මොරටුව විශ්ව විද්‍යාලය අතර ඇතිකරගෙන ඇති අවබෝධතා ගිවිසුම අනුව, ආයතනයේ කටයුතු දිගටම සිදුකරමින් පවත්වාගෙන නොයන්නේ නම්, ඉඩම මොරටුව විශ්වවිද්‍යාලයට භාරදිය යුතුය.

(ඇ) ක්ෂයවීම්

සින්නක්කර ඉඩම් හා සිදුකෙරෙමින් පවතින ඉදිකිරීම් සඳහා ක්ෂයවීම් ගනණය කරනු නොලැබේ. වෙනත් සියළු දේපල, යන්ත්‍ර හා උපකරණවල පිරිවැය සඳහා ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයුකාලය අනුව සෘජු රේඛා පදනම මත පහත දැක්වෙන ලෙස සමාන වාරික වලින් ක්ෂයවීම් ගහණය කරනු ලැබේ.

	වසරක් සඳහා ප්‍රතිශතය
වත්කම් කාණ්ඩය	%
ගොඩනැගිලි	5
පරිගණක හා උපාංග	20
වන්ද්‍රිකා ඇන්ටනා, පර්යේෂණාගාර උපකරණ	10
කාර්යාල උපකරණ, ගෘහභාණ්ඩ හා උපාංග	10
මෝටර් රථ	20
පුස්තකාල පොත්	15

අත්පත්කරගනු ලැබූ වත්කමක් ක්ෂයවීම ආරම්භ වන්නේ එය ප්‍රයෝජනයට ගත හැකි අවස්ථාවේ සිට වන අතර ක්ෂයවීම නවතිනුයේ විකිණීම සඳහා යැයි වත්කම් වර්ගීකරණය කළ දිනයේ හෝ වත්කම ඉවත් කරන දිනය යන දිනවලින් කලින් පැමිණෙන දිනයේය.

භාණ්ඩ වට්ටෝරු

භාණ්ඩ වට්ටෝරු පොත් ලිපිද්‍රව්‍ය තොග, ඉලෙක්ට්‍රොනික උපාංග, හා මෙවලම් ආදියෙන් යුක්ත වේ. භාණ්ඩ සඳහා අඩුම මිල හා ශුද්ධ උපලබ්ධි වටිනාකම භාණ්ඩ වට්ටෝරුවල සඳහන්වේ. ශුද්ධ උපලබ්ධි වටිනාකම වන්නේ භාණ්ඩය නිමකිරීම හා විකිණීම සඳහා වන වියදම් අඩුකල සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී ඇස්තමේන්තුගත විකිණුම් මිලවේ.

වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ

බොල්ණය හා සැකසහිත ලැබිය යුතු දෑ සඳහා වන දීමනා වල ශුද්ධ අගය උපලබ්දි වීම සඳහා ඇස්තමේන්තු කරණ ලද අගයෙන් වෙළඳ ලැබිය යුතු දෑ දක්වනු ලැබේ.

වෙනත් ලැබිය යුතු දෑ හා අදාල පාර්ශව වෙතින් ලැබියයුතු දෑ, බොල්ණය හා සැකසහිත ලැබිය යුතු දෑ සඳහා වන දීමනා අඩුකර ලැබෙන පිරිවැයවේ.

සාමාන්‍ය බොල් ණය ප්‍රතිපාදන පහත පරිදි තීරණය කරණු ලැබේ:

ඉක්මවූ කාල සීමාව	අවශ්‍ය ප්‍රතිපාදන
වසර 1 – 2	50%
වසර 2 – 3	75%
වසර 3 ට වැඩි	100%

ආයෝජන

භාණ්ඩාගාර බිල්පත් සඳහා සිදුකල ආයෝජන පිරිවැය මගින් දක්වා ඇත. එකී ආයෝජනවල ආදායම උපචිත පදනම යටතේ ගිණුම්ගත කර ඇත.

මුදල් හා මුදලට සමාන දෑ

මුදල් හා මුදලට සමාන දෑ වන්නේ අත ඇති මුදල්, අවශ්‍ය විටක ආපසු ගත හැකි තැන්පතු හා කෙටිකාලීන දැඩි ද්‍රවශීල ආයෝජන, දන්නා ප්‍රමාණයෙන් ක්ෂණිකව මුදල් වලට පරිවර්තනය කල හැකි හා අගය වෙනස්වීමේ අවදානමට ලක්වීම නොසලකා හැරිය හැකි දේය. මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා, අත ඇති මුදල් හා බැංකු අයිරා ද ඇතුලත්ව තැන්පතුවල ඇති මුදල් වලින් මුදලට සමාන දෑ සමන්විත වේ. කෙටිකාලයකදී කල්පිරෙන ආයෝජන ද (උදා - අත්පත් කර ගන්නා දිනයේ පටන් මාස 3 ක් හෝ ඊට අඩු කාලයක්) මුදලට සමාන දෑ ලෙස සැලකේ.

වගකීම් හා ප්‍රතිපාදන

ඉල්ලුම්කරන පරිදි ගෙවීමට ඇති මුදල් හෝ වාර්තා කරන දිනයේ සිට වසරක් ඇතුලත ගෙවීමට ඇති මුදල් මූල්‍ය තත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් ලෙස වර්ගීකරණ කෙරේ. වාර්තා කරනු ලබන දිනයේ පටන් වසරකට පසුව ගෙවිය යුතු ශේෂය ජංගම නොවන වගකීම් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී දන්නා සියළුම වගකීම් සැලකිල්ලට ගෙන ඇත. පසුගිය සිද්ධියක ප්‍රතිඵලයක් ලෙස ආයතනයට නෛතික හෝ අනපේක්ෂිත ගෙවීම් කිරීමට ඇති විට ප්‍රතිපාදන හා වගකීම් හඳුනා ගැනෙන අතර වගකීම් ඉටුකිරීම සඳහා ආර්ථිකමය ප්‍රතිලාභ ලබාගැනීමක් අවශ්‍ය වියහැක.

සේවක ප්‍රතිලාභ

(අ) නිර්වචිත ප්‍රතිලාභ සැලසුම්

විශ්‍රාම ප්‍රතිලාභ යනු නිර්වචිත ප්‍රතිලාභ සැලසුමකි. මෙම වගකීම් ඉටුකිරීම සඳහා වන ප්‍රතිපාදන මූල්‍ය තත්ව ප්‍රකාශයේ ඉදිරියට ගෙන යනු ලැබේ. අනාගත පඩි වැඩිවීමේ අනුපාත, වට්ටම් අනුපාත හා අපේක්ෂිත කාර්යමණ්ඩල පිරිවැටුම් අනුපාත සලකාබලා සූත්‍ර ක්‍රමය පදනම් කරගෙන ප්‍රතිපාදන ගණනය කරනු ලැබීය (මේ පිළිබඳ වන උපකල්පනයන් 11.1 සටහන මගින් දැක්වේ). වසර ආරම්භයේ ඉදිරියට ගෙනා ප්‍රතිපාදන හා වසර අවසානයේ ඉදිරියට ගෙනා ප්‍රතිපාදන අතර ඇතිවන වෙනස පිළිබඳව විස්තීර්ණ ආදායම් ප්‍රකාශය මගින් කටයුතු කෙරේ. නමුත් 1983 අංක 12 දරණ විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීමේ පනත අනුව විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් සඳහා බාහිරව ප්‍රදානයන් සිදු නොකෙරේ. මෙම වගකීම්, මූල්‍ය තත්ව ප්‍රකාශයේ ජංගම නොවන-වගකීම් යටතේ කාණ්ඩ කර තිබේ.

(ආ) සේවක අර්ථසාධක අරමුදල

අනුමත අර්ථසාධක අරමුදල සඳහා සෑම සේවකයෙකු සඳහාම ආයතනය මගින් හා සේවකයින්ගේ වැටුප මඟින් පිළිවෙලින් 15% ක හා 10%ක දායකත්වය ලබාගේ

(ඇ) සේවක භාරකාර අරමුදල

සේවක භාරකාර අරමුදල සඳහා ආයතනය මගින් සෑම සේවකයෙකුගේම වැටුපෙන් 3% ක් දායක කෙරේ.

වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ

වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ පිරිවැය අනුව දක්වා ඇත.

බදුකරණය

2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ 7 (b) (ii) වගන්තිය යටතේ මෙම ආයතනය ආදායම් බදු වලින් නිදහස් කර ඇත. ආයතනය එකතු කල අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි වී ඇත. පාඨමාලා මගින් ලැබෙන ආදායම හැර ව්‍යාපෘති ආදායම හා වෙනත් ආදායම් සඳහා VAT ගෙවිය යුතුය.

ප්‍රාග්ධන බැඳීම් හා අසම්භාව්‍ය වගකීම්

අවිනිශ්චිත වගකීම් යනු ආර්ථික ප්‍රතිලාභ ලැබිය නොහැකි හෝ සත්‍ය ලෙස මැනිය නොහැකි විට අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ වත්මන් බැඳීම් මගින් පමණක් තහවුරු කරගත හැකි සිදුවීමේ ප්‍රවණතාවයක් ඇති බැඳීම්වේ. ආයතනයේ ප්‍රාග්ධන බැඳීම් හා අවිනිශ්චිත වගකීම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශන වල අදාල සටහන් මගින් අනාවරණය කර ඇත.

ප්‍රදානයන් ගිණුම්කරණය

ආයතනය දරන ලද වියදම් සඳහා ආයතනයට වන්දි ලබාදෙන ප්‍රදානයන්, වියදම් හඳුනාගත් සමාන කාලසීමාව සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ආදායමක් ලෙස හඳුනා ගැනේ. වත්කමක් සඳහා වන වියදමක් ලෙස ආයතනයට වන්දි ලබාදෙන ප්‍රදානයන් අදාල වත්කම සඳහා ප්‍රයෝජනවත් ආයුකාලය සම්බන්ධ ක්‍රමානුකූල පදනම මත ආදායම් ප්‍රකාශයේ දක්වා ඇත.

ආදායම හඳුනාගැනීම

ආයතනයට ආර්ථික ප්‍රතිලාභ ලබාදිය හැකි හා විශ්වාසනීය ලෙස මැනිය හැකි ප්‍රමාණය අනුව ආදායම හඳුනාගනු ලැබේ.

(අ) සිසුන්ගෙන් ලැබෙන පාඨමාලා ගාස්තු උපචිත පදනම යටතේ ආදායමක් ලෙස හඳුනාගැනේ.

(ආ) ව්‍යාපෘති ආදායම, උපදේශක ආදායම උපචිත පදනම යටතේ ආදායමක් ලෙස හඳුනාගැනේ.

(ඇ) පොලී ආදායම උපචිත පදනම යටතේ හඳුනා ගැනේ.

(ඉ) දායකත්වය පාලනය කල යුතු හෝ දායකත්වය ලැබීමේ අයිතිය තහවුරු කරනු ලැබුවිට ප්‍රදානයන්ට අදාල ආදායම ඇතුලත් කෙරේ.

(ඊ) වෙනත් ආදායම් උපචිත පදනම යටතේ හඳුනා ගැනේ.

අතිරික්ත ව්‍යාපෘති ආදායම් උපයෝජනය

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ සාමාන්‍යයෙන් ඇතුලත් ක්‍රියාකාරකම්වලට අමතරව සිදුකරන ලද ව්‍යාපෘති මගින් ලැබෙන අතිරික්ත ආදායම විශ්වවිද්‍යාල හා පර්යේෂණ ආයතන සඳහා අදාලවන රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 380 අනුකූලව උපයෝජනය කෙරේ.

වියදම්

(අ) දරනු ලැබූ වියදම් හා විශේෂ ආදායම් අයිතම මගින් වන ඉපයීම් අතර ඇති සෘජු සම්බන්ධය පදනම් කරගෙන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වියදම් හඳුනා ගනු ලැබේ. ආයතනය පවත්වාගෙන යාම හා ප්‍රාග්ධන වත්කම් කාර්යක්ෂමලෙස නඩත්තු කිරීම සඳහා දරන ලද වියදම්, වසර සඳහා අතිරික්තයක් ලැබෙන අවස්ථාවන්හිදී ආදායම්වලට එරෙහිව අයකර තිබේ.

(ආ) පාඨමාලා, ව්‍යාපෘති හා උපදේශණ කාර්යයන් හා වෙනත් ක්‍රියාකාරකම් සඳහා වන වියදම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ උපචිත පදනම යටතේ හඳුනාගනු ලැබේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශ SLPAS 2 ට අනුකූලව පිලියෙල කර ඇත.

වාර්තා කරන දිනයට පසුව වන සිදුවීම්

වාර්තා කරන දිනයට පසුව සිදුකරන ක්‍රියාකාරකම්වල අදාලත්වය පිළිබඳව සලකා බලා අවශ්‍ය විටක ගිණුම්වල සුදුසු පරිදි ගැලපීම් කර ඇත.

(2) මුදල් හා මුදලට සමාන දෑ

	රු.
ලංකා බැංකුව ගිණුම් - C/A 7054733	43,340,842.47
ලංකා බැංකුව ගිණුම් - C/A 307144	10,288,815.63
FINDS බැංකු ගිණුම - S/A 326764	107,467.31
NASDA බැංකු ගිණුම - S/A 328391	6,644.33
අධ්‍යක්ෂවරයාගේ අරමුදල බැංකු ගිණුම - C/A 307399	49,221.76
වක්‍රීය අරමුදල බැංකු ගිණුම - C/A 2479737	4,402,364.10
මහජන බැංකුව -CA 313-1-001-9-0012847	674,804.83
කොමර්ෂල් බැංකුව -CA 1114029211	26,500.00
	58,896,660.43

(2අ) කෙටි කාලීන ආයෝජන

අතිරික්ත අරමුදල් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කිරීම - ව්‍යාපෘති/පාඨමාලා අරමුදල	7,620,339.66
අතිරික්ත අරමුදල් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කිරීම - අධ්‍යක්ෂ මණ්ඩල අරමුදල	1,107,069.44
අතිරික්ත අරමුදල් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කිරීම - වක්‍රීය අරමුදල	2,156,124.03
අතිරික්ත අරමුදල් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කිරීම - FINDS ප්‍රදාන	5,668,455.76
ස්ථාවර තැන්පතු 01(76387182)- වක්‍රීය අරමුදල	552,257.25
ස්ථාවර තැන්පතු 02(76387290)- වක්‍රීය අරමුදල	552,257.25
ස්ථාවර තැන්පතු 03(76387299)- වක්‍රීය අරමුදල	552,257.25
ස්ථාවර තැන්පතු 04(76387310)- වක්‍රීය අරමුදල	552,257.25
ස්ථාවර තැන්පතු 05(76387322)- වක්‍රීය අරමුදල	552,257.25
ස්ථාවර තැන්පතු 06(76387328)- වක්‍රීය අරමුදල	552,257.25
ස්ථාවර තැන්පතු 07(76387343)- වක්‍රීය අරමුදල	552,257.25
	20,417,789.64

(3අ) වෙළඳ හා වෙනත් ලැබිය යුතුදේ

		රු.
කාර්ය මණ්ඩල ණයකරු - TG		302.00
රක්ෂණ සංස්ථා ණයකරු		9,700.00
ලැබිය යුතු ගිණුම් - TG		1,058,649.94
ලැබිය යුතු ගිණුම් - P/C		9,366,238.97
ණයකරු - පී.ටී.ප්‍රනාන්දු මයා		4,000.00
ණයකරු - සී.ආර්.රණසිංහ මයා		426.78
ණයකරු - ජයතු ප්‍රනාන්දු මයා		106,894.72
ණයකරු - බී.ආර්.පී.පෙරේරා මයා		45,699.66
ණයකරු - එස්.ඩී.ජේ.සංකල්ප මයා		1,250.00
වෙනත් තැන්පතු		155,315.00
ආර්.එස්.ණයකරු		14,434.91
මැනිවරණ දෙපාර්තමේන්තුව		8,159.60
අමාත්‍යාංශ ණයකරු Dish T.V.පැකේජය		33,381.50
උත්සව අත්තිකාරම්		58,750.00
කාර්ය මණ්ඩල ණය		
ආපදා ණය	8,243,647.00	
Motor Cycle ණය	267,526.00	
මෝටර් රථ ණය	2,111,969.00	
	10,623,142.00	
එක් වසරකට පසු ලැබිය යුතු කාර්ය මණ්ඩල ණය	(7,954,876.00)	
එක් වසරක් තුල ලැබිය යුතු කාර්ය මණ්ඩල ණය		2,668,266.00
LC Margin Control A/c		4,321,376.00
Guarantee A/c		101,000.00
පීසී.පාලන		734,671.49
		18,688,516.57

3.අ.අ

එක් වසරක් තුල ලැබිය යුතු කාර්ය මණ්ඩල ණය	2,668,266.00
එක් වසරකට පසු ලැබිය යුතු කාර්ය මණ්ඩල ණය	7,954,876.00
	10,623,142.00

(3ආ) වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ

සිදු කෙරෙන කාර්යයන්

	රු.
පාඨමාලා	
SPD පාඨමාලා (ඉලෙක්ට්‍රොනික)	27,684.20
ව්‍යාපෘති	27,684.20
තේ කොළවල වර්ණ වෙන්කිරීමේ ව්‍යාපෘතිය (සන්නිවේදන අංශය)	4,209,066.13
ආලෝක මිණුම් දැනුම්දීමේ පද්ධති ව්‍යාපෘතිය	10,975.00
SPG LED Light ව්‍යාපෘතිය	251.45
RFID පුස්තකාල ස්වයංක්‍රියකරණ- ACCIMT (සන්නිවේදන අංශය)	91,854.36
HRJB ශබ්ද පෙට්ටිවල (Jingle Boxes) දෘඩකාංග යථා තත්වයට පත්කිරීම	55,790.19
2012/ 2013 ව්‍යාපෘතිය - SS - CCTV - NWSDB	8,726,217.07
ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ ඇදන් ව්‍යාපෘතිය 2015	251,177.59
AC මගින් බලය ලබාදෙන LED පහන් ව්‍යාපෘතිය(Elec)	1,053.00
ශ්‍රී .ජු.දෙ CRT 2 ක දෘඩකාංග යථාතත්වයට පත්කිරීම 2015	101,098.27
වාහන හඳුනාගැනීමේ පද්ධතිය	14,250.00
	13,461,733.06
(3අ+3ආ)	32,177,933.83

(4) වට්ටෝරු/තොග භාණ්ඩ

ඉලෙක්ට්‍රොනික උපාංග	3,727,274.15
ලිපිද්‍රව්‍ය	1,161,417.40
වෙනත්	38,443.56
ඉලෙක්ට්‍රිකල් හා යාන්ත්‍රික	213,923.93
සුභසාධක	124,870.00
උපාංග - TG	199,218.03
වට්ටෝරු භාණ්ඩ - TG	518,035.98
වට්ටෝරු භාණ්ඩ -ව්‍යාපෘති (P/C)	1,990,140.32
මෙවලම් - TG	1,383,466.69
	9,356,790.06

(5) පූර්ව ගෙවීම්

	රු.
අත්තිකාරම් ගෙවීම - TG	3,074,766.94
මුද්දර අක්මුදල්	53,251.00
	3,128,017.94

(6) දේපල පිරියත හා උපකරණ

විස්තරය	2016 01.01.දිනට වියදම	වසර තුල සිදුකරණ ලද එකතුකිරීම්	වසර තුල සිදුකරණ ලද අපහරණයන්	ගැලපීම්	2016 12 31 දිනට එකතුව
ගොඩනැගිලි	124,672,004.70	16,892,792.38			141,564,797.08
වන්ද්‍රිකා ඇන්ටනා	2,959,797.83	-			2,959,797.83
පරිගණක	66,274,686.27	8,703,782.24	(22,420,006.05)	(31,004.42)	52,527,458.04
පරීක්ෂණාගාර උපකරණ	175,478,889.44	27,701,725.37	(12,430,364.51)	47,040.00	190,797,290.30
කාර්යාලිය උපකරණ	26,911,472.19	2,813,525.03	(2,449,053.25)	(825.00)	27,275,118.97
ගෘහභාණ්ඩ හා උපාංග	14,768,967.76	1,252,586.92	(1,696,819.57)	(13,372.93)	14,311,362.18
මෝටර් රථ	22,068,489.00	6,390,000.00			28,458,489.00
පුස්තකාල පොත්	23,795,969.65	40,666.25			23,836,635.90
	456,930,276.84	63,795,078.19	(38,996,243.38)	1,837.65	481,730,949.30

ක්ෂය කිරීම් මුල් පිරිවැය මත හෝ පසුගිය වසරට අනුකූල ලෙස සරල රේඛා පදනම මත ඉදිරිපත්කර ඇති අතර ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයුකාලය මත කපාහැරීම සඳහා වත්කම් ගනණය කර ඇත.

ක්ෂයකිරීම් පහත අනුපාත අනුව සිදුකර ඇත.

ගොඩනැගිලි	5%
වන්ද්‍රිකා ඇන්ටනා, පර්යේෂණාගාර උපකරණ	10%
කාර්යාලිය උපකරණ, ගෘහභාණ්ඩ හා උපාංග	10%
පුස්තකාල පොත්	15%
පරිගණක, මෝටර් රථ	20%

16.01.01දිනට සමුච්චිත ක්ෂය කිරීම්	වසර තුල සිදුකරණ ලද ක්ෂය කිරීම්	වසර තුල සිදුකරණ ලද අපහරණයන්	ගැලපීම්	16.12.31දිනට සමුච්චිත ක්ෂය කිරීම්	16.12.31දිනට W D V
29,727,107.02	6,306,998.29			36,034,105.31	105,530,691.77
2,959,778.83				2,959,778.83	19.00
45,115,971.70	6,150,514.54	(22,402,421.05)	(27,331.42)	28,836,733.77	23,690,724.27
111,138,255.14	10,784,825.31	(12,379,725.04)	18,816.00	109,562,171.41	81,235,118.89
18,059,793.15	1,680,587.79	(2,448,981.25)	(45.66)	17,291,354.03	9,983,764.94
9,452,239.47	907,925.03	(1,680,213.97)	(31,458.93)	8,648,491.60	5,662,870.58
18,898,489.00	4,314,946.95			23,213,435.95	5,245,053.05
23,030,657.23	242,809.01			23,273,466.24	563,169.66
258,382,291.54	30,388,606.92	(38,911,341.31)	(40,020.01)	249,819,537.14	231,911,412.16

(7) සිදු කෙරෙන කාර්යයන් - ඉදිකිරීම්

	රු.
W I P - ප්‍රධාන ශ්‍රවනාගාරය	4,400,000.00
WIP - ගෘහභාණ්ඩ හා උපාංග (කෑම කාමරය)	110,264.00
WIP ගොඩනැගිල්ල - වහලය ("C" ගොඩනැගිල්ල)	500,000.00
WIP ගොඩනැගිල්ල - වැසිකිලි 06 ක්("C" ගොඩනැගිල්ල)	1,600,000.00
WIP ගොඩනැගිල්ල - නව ඇළුමිනියම් ජනේල(ශ්‍රවනාගාරය)	775,273.95
WIP ගොඩනැගිල්ල - නව ලී පිටුපස බිත්ති	1,809,645.75
WIP ගොඩනැගිල්ල - විද්‍යුත් පද්ධතිය MDB	1,215,782.52
WIP ගොඩනැගිල්ල - සලකුණුකිරීම හා ආරක්ෂා කිරීම (පිටිපන)	3,545,744.40
WIP ගොඩනැගිල්ල - විද්‍යුත් පද්ධතිය වැඩිදියුණු කිරීම	2,235,234.13
WIP ගොඩනැගිල්ල - ශබ්ද ආරක්ෂක බිත්ති පැනල(ප්‍රධාන ශ්‍රවනාගාරය)	1,780,614.00
WIP ගොඩනැගිල්ල - සෙදුම් කාමර (A)	528,947.52
	18,501,506.27

(8) ගෙවිය යුතු

	රු.
ගෙවිය යුතු ගිණුම්-TG	1,003,127.26
ගෙවිය යුතු ගිණුම්-PC	4,600.63
E.P.F. පාලනය	1,166,892.18
E.T.F. පාලනය	140,027.06
සුභසාධන සංගම් පාලනය	1,713.00
ණයකරු - මහා භාණ්ඩාගාරය	906,359.63
ආපසු ගෙවිය හැකි තැන්පතු	120,000.00
ලැබීම් මත ගෙවිය යුතු VAT- P/C	1,005,059.90
ලැබීම් මත ගෙවිය යුතු VAT- T/G	126,190.11
ගෙවිය යුතු NBT - TG	19,677.77
ගෙවිය යුතු NBT- P/C	149,896.30
ගෙවිය යුතු මුද්දර ගාස්තු- TG	8,775.00
ගෙවිය යුතු PAYE Tax- TG	43,788.00
උපයෝජන පාලනය	2,714,512.42
ගොඩනැගිලි දෙපාර්තමේන්තු ණයකරු	984,403.00
Arpico Interiors - ණයකරු	145,083.20
TG පාලන	734,671.49
රඳවා ගැනීම්	655,238.95
	9,930,015.90

(9) උපචිත වියදම්

	රු.
භාණ්ඩාගාර අරමුදල්	4,773,505.69
ව්‍යාපෘති / පාඨමාලා	160,032.24
	4,933,537.93

	රු.
(10) විලම්භීත ආදායම්	10,205,848.64

(11) විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්

	රු.
ජනවාරි 1 දිනට,	27,131,466.39
සංක්‍රමණ වගකීම් හඳුනාගැනීම්	-
වසර සඳහා අයකිරීම්	2,835,497.91
වසර තුළ සිදුකළ ගෙවීම	(171,329.75)
දෙසැම්බර් 31 දිනට	29,795,634.55

(11.1) උපකල්පන

	2016
වට්ටම් ප්‍රතිශතය	6.50%
පඩි වැඩිවීම්	8%
කාර්ය මණ්ඩල පිරිවැටුම්	8.93%
විශ්‍රාම යාමේ වයස	වසර 60

12) ශුද්ධ වත්කම්/ස්කන්ධ ප්‍රාග්ධනය

	2016 රු.		2015 රු.
රජයේ ප්‍රාග්ධන ප්‍රදාන			
ආරම්භක ශේෂය	322,031,396.20		284,282,034.05
ලැබුණු ප්‍රදානයන්	79,043,000.00		62,959,000.00
ගැලපීම්			(5,179,550.00)
හැකියා වර්ධන වැඩසටහන්	(9,234,889.61)		
ක්‍රම ක්ෂය	(25,457,207.57)	*	(20,030,087.85)
	366,382,299.02		322,031,396.20
මූල්‍ය නොවන රජයේ ප්‍රාග්ධන ප්‍රධාන**			
ආරම්භක ශේෂය	3,170,000.00		6,340,000.00
ලැබුණු ප්‍රදානයන්	6,390,000.00		
ක්‍රම ක්ෂය	(4,314,947.95)		(3,170,000.00)
	5,245,052.05		3,170,000.00

සංචිත	2016 රු.		2015 රු.
පොදු සංචිත	272,721.64		272,721.64
Cellted පරිත්‍යාග	213,333.34		213,333.34
පර්යේෂණ හා උපදේශණ අරමුදල	1,341,446.90		1,341,446.90
විදේශ ප්‍රදාන	3,464,295.25		3,464,295.25
ප්‍රත්‍යාගණන අතිරික්තය	26,682,504.54		26,682,504.54
පර්යේෂණ සංචිතය	182,953.96		-
වෙනත් ප්‍රදාන පරිත්‍යාග			
ආරම්භක ශේෂය	24,483,547.98		25,076,430.83
ස්ථාවර වත්කම් ලැබීම්	47,040.00		
ගැලපීම්			
ක්ෂයකිරීම්	(576,431.39)	**	(592,882.85)
	23,954,156.59		24,483,547.98
වක්‍රීය අරමුදල			
ආරම්භක ශේෂය	8,929,686.66		7,363,739.04
ලැබීම්	1,547,889.54		1,565,947.62
වියදම්			
	10,477,576.20		8,929,686.66
අධ්‍යක්ෂවරයාගේ අරමුදල			
ආරම්භක ශේෂය	1,074,744.75		1,016,213.81
ලැබීම්	80,856.27		58,530.94
වියදම්			
	1,155,601.02		1,074,744.75
FINDS ප්‍රදාන			
ආරම්භක ශේෂය	5,423,835.41		5,122,849.29
පොලී ආදායම	375,184.11		300,986.12
වියදම්			
	5,799,019.52		5,423,835.41

NASDA ප්‍රදාන		
ආරම්භක ශේෂය	6,383.61	-
ගැලපීම්		6,133.78
පොලී ආදායම	260.72	249.83
වියදම්		-
	6,644.33	6,383.61
	73,550,253.29	71,892,500.08

එකතුවූ අතිරික්තය/ (හිඟය)	2016 රු.	2015 රු.
ආරම්භක ශේෂය -TG	(121,151,928.51)	(120,070,824.29)
ආරම්භක ශේෂය - P/C	22,288,520.39	18,971,086.39
ගැලපීම් - TG		(906,733.61)
ගැලපීම් - PC		(6,133.78)
වියදම් මත ආදායම් අතිරික්තය	(21,314,395.74)	3,149,197.16
	(120,177,803.86)	(98,863,408.13)
මුළු ශුද්ධ වත්කම්/ස්කන්ධ ප්‍රාග්ධනය	324,999,800.50	298,230,488.15

* ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 24 අනුව ක්‍රමක්ෂයකර ඇත.

** පරිත්‍යාග/ප්‍රදාන මත ලැබූ අයිතම ක්ෂය කිරීම

පරිත්‍යාග / ප්‍රදාන යටතේ ලැබූ අයිතම මත ක්ෂය කිරීම්, මහ භාණ්ඩාගාරය මගින් උපදෙස් ලබාදී ඇති පරිදි පරිත්‍යාග/ප්‍රදාන ගිණුම් සඳහා ගැලපීම් කර ඇත.

11.0 සැලසුම් කළ කෙටිකාලීන හා මධ්‍යකාලීන ක්‍රියාකාරකම් වල සාරාංශය

- **පෘතුවි නිරීක්ෂණ චන්ද්‍රිකා දත්ත ලබාගැනීම හා බෙදාහැරීම සඳහා වන ජාතික මධ්‍යස්ථානය** - සාමාන්‍ය පෘතුවි නිරීක්ෂණ චන්ද්‍රිකා මගින් දත්ත ලබාගැනීම සඳහා පෘතුවි මධ්‍යස්ථාන 03ක් ස්ථාපනය කිරීම. මෙයට මූලික වශයෙන්ම පෘතුවි නිරීක්ෂණ චන්ද්‍රිකා මගින් පෘතුවි නිරීක්ෂණ දත්ත ලබාගැනීම සඳහා පෘතුවි නිරීක්ෂණ මධ්‍යස්ථාන සංකීර්ණයක් ඉදිකිරීම හා තාක්ෂණික පාලනය, දත්ත සැකසීම හා බෙදාහැරීම සඳහා අවශ්‍ය වන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම අයත්වේ. අභ්‍යවකාශ නිරීක්ෂණයෙහි ප්‍රමුඛ රටවල් 2ක ජාතික පෘතුවි නිරීක්ෂණ නියෝජිතායතන මගින් ජාතික මධ්‍යස්ථානයෙහි එම ආයතන වල පෘතුවි මධ්‍යස්ථාන පිහිටුවීමට පොරොන්දු වී ඇත.

- **මූලික අභ්‍යවකාශ තාක්ෂණයෙහි ජාතික හැකියාවන් ලබාගැනීම හා වැඩිදියුණු කිරීම** -

  - නැනෝ චන්ද්‍රකාවක් වැඩිදියුණු කිරීම සඳහා රුසියානු සමූහාන්ඩුවේ ජාතික අභ්‍යවකාශ සංස්ථාව හා සමාරා ජාතික පර්යේෂණ විශ්ව විද්‍යාලය (SNRU) ඇතුළු විදේශ රටවල නියෝජිතායතන සමඟ සහයෝගිතා ආරම්භයන් වැඩිදියුණු කිරීම.
  - ජපානයේ කියුෂු තාක්ෂණික ආයතනය (Kyutech) සමඟ ඝනකයක හැඩයෙන් යුත් චන්ද්‍රිකාවක් වැඩිදියුණු කිරීම.

- **ශ්‍රී ලංකාවේ ගුවන්අභ්‍යවකාශ නිර්මාණය කිරීමේ හා ඉදිකිරීමේ හැකියාවන් වැඩිදියුණු කිරීම** - ස්ථායිතාවය, පාලනය කිරීමේ හැකියාව හා විවිධ යෙදවුම් සඳහා සුදුසු ව්‍යුහයන් වැඩිදියුණු කරන ලද කැරකෙන පෙති 04ක්/06ක් සහිත කුඩා ගුවන් යානා තාක්ෂණය (UAV) වැඩිදියුණු කිරීම.

- **ශ්‍රී ලංකාවේ මෙකාට්‍රොනික් (යාන්ත්‍රික විද්‍යාව) හා රොබෝ විද්‍යා හැකියාවන් වැඩිදියුණු කිරීම** - ස්වයංපාලක යෙදවුම්, කාර්මික යෙදවුම් සඳහා ජංගම රොබෝ වේදිකාවන් වැඩිදියුණු කිරීම.

- විශේෂ කෙටි කාලීන පුහුණු, පශ්චාද් උපාධි පුහුණු, විශේඥ දූත මණ්ඩල ඔස්සේ ගුවන්යානා තාක්ෂණය, අභ්‍යවකාශ තාක්ෂණය හා එහි යෙදවුම්, රොබෝ විද්‍යාව හා ඒවා වෛද්‍ය ඉන්ජිනේරු තාක්ෂණය යන ක්ෂේත්‍ර වල මානව සම්පත් ධාරිතාවන් සංවර්ධනය කිරීම.

- **දුරස්ථ සංවේදී හා භූගෝලීය තොරතුරු පද්ධති (RS/GIS) ක්‍රියාකාරකම්** - කෘෂිකර්මාන්තය, පාරිසරික, නාගරික සංවර්ධනය, ස්වභාවික සම්පත් කළමනාකරණය ආදී ක්ෂේත්‍රයන්හි පෘතුවි නිරීක්ෂණ චන්ද්‍රකා ඡායාරූප හා වායුගෝලීය ඡායාරූප (UAV)

නිරීක්ෂණය කිරීම් යොදා ගැනෙන ව්‍යාපෘතිවේ. ප්‍රකාශ විකිරණමිතික ක්ෂෙත්‍රයේ ප්‍රකාශමිතික මුද්‍රා බැංකු හා පර්යේෂණ පුළුල් කිරීම.

- ඉලෙක්ට්‍රොනික, ක්ෂුද්‍ර ඉලෙක්ට්‍රොනික හා සන්නිවේදන ව්‍යාපෘති (ඉලෙක්ට්‍රොනික නිෂ්පාදන හා කාර්මික විසඳුම් සංවර්ධනය සඳහා).
- ඉලෙක්ට්‍රොනික, සන්නිවේදන හා තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) වැඩසටහන්.
- දුරස්ථ පාලනය/ වෙබ්පාදක MIS පද්ධති සඳහා කෙටි පණිවුඩ යැවීම (SMS) හා වෙබ් තාක්ෂණය ඒකාබද්ධ කිරීම (SMS හරහා දත්ත රැස්කිරීම, විශ්ලේෂණය කිරීම හා වෙබ් අඩවි හරහා ප්‍රදර්ශනය කිරීම).
    - ආපදා සහන කළමනාකරණ තීරණ සහය පද්ධතිය
- තාරකා විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති හා තාරකා විද්‍යාව ප්‍රචලිත කිරීමේ ක්‍රියාකාරකම්.
- ක්‍රියාකාරිත්වය පරීක්ෂාකර බැලීම/ සහතිකකරණය හා ක්‍රමාංකනය හා ඒ හා සම්බන්ධ ක්‍රියකාරකම්.
- නවීන ඉලෙක්ට්‍රොනික පද්ධති (උදා: දුම්රිය ධාවනාගාර වල ප්‍රධාන පාලක ඒකක), මිණුම් උපකරණ, වෛද්‍ය උපකරණ වල දෘඩාංග යථා තත්වයට පත්කිරීම.

12.0 විගණකාධිපතිගේ වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No.: විඊසි/කී/ඒසිසිඅයිඑමටී/1/16/63
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2018 ජනවාරි 24 දින

සභාපති,

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය.

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ වැඩිදියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වන වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට නවින තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 2 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂයේ පාරිතෝෂික ගෙවීම් රු.171,000 ක් වුවත් මෙහෙයුම් කටයුතු වලින් වූ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී එය රු.201,000 ක් ලෙස දක්වා තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ දී ප්‍රාග්ධන ප්‍රදාන ලෙස භාණ්ඩාගාරයෙන් රු.79,043,000 ක් ලැබී තිබුණ ද මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී එය රු.85,433,000 ක් ලෙස දක්වා තිබුණි.

2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ආදායම් ගිණුම්ගත කිරීමේදී උපචිත පදනම අනුගමනය කරන බව ආයතනයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණ ද, නිලධාරීන් වෙත බෙදාහැරීමට යටත්වන ආදායම් ව්‍යාපෘති 19කට අදාළව 2014, 2015 හා 2016 වර්ෂවලදී ඉන්වොයිස් කරන ලද එකතුව රු.1,504,800 ක ආදායම් අදාළ වර්ෂවල කාර්යසාධන ප්‍රකාශනවලට ඇතුළත් කිරීම වෙනුවට, විලම්බිත ආදායම් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි.

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දී අපහරණය කරන ලද රු.453,295 ක් පිරිවැය වූ කාර්යාල උපකරණවල සමුච්චිත ක්ෂය වෙන්කිරීම රු.91,637 ක් වැඩියෙන් ගණනය කිරීම හේතුවෙන් භාණ්ඩ විකිණීමේ ලාභය රු.91,637 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සඳහා සේවා සැපයීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු රු.1,035,657 ක කුලී ආදායම ගිණුම් ගත කර නොතිබුණි.

(ඇ) තේ කොළ වර්ණ ශ්‍රේණිගත කිරීමේ යන්ත්‍රය නිපදවීමේ පර්යේෂණ ව්‍යාපෘතිය වෙනුවෙන් 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී රු.4,209,066 ක වියදමක් දරා තිබුණු අතර ඉන් රු.1,102,586 ක් පර්යේෂණ වියදම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට කෙරිගෙනයන වැඩ ලෙස මුල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දක්වා තිබුණි.

(ඈ) පර්යේෂණ ව්‍යාපෘතිවලට අදාළ වැඩමුලු හා සම්මන්ත්‍රණ පැවැත්වීම වෙනුවෙන් දරන ලද රු.9,234,889 ක් මුල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ පර්යේෂණ හා සංවර්ධන වියදම් ලෙස හා ප්‍රාග්ධන ප්‍රදාන උපයෝජනය කිරීම ආදායමක් ලෙස දැක්වීම වෙනුවට, එම මුදල් හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ ප්‍රාග්ධන ප්‍රදාන වලින් අඩුකර දක්වා තිබුණි.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති සහ පාඨමාලා පැවැත්වීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු. 8,986,777ක ශේෂයෙන් රු. 4,178,088 ක්, 2017 නොවැම්බර් මාසය වන විටත් අයකරගෙන නොතිබුණු අතර ඉන් වර්ෂ 2ට වැඩි ශේෂයන්හි එකතුව රු. 1,586,990 ක් විය.

(ආ) පුද්ගලයන් 3 දෙනෙකුගෙන් හා බාහිර ආයතන 4 කින් අයවිය යුතු වසර 3 ඉක්මවා තිබූ රු.222,270 ක ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) බාහිර පාර්ශවයන් වෙත ගෙවිය යුතු වසර 3 කට වැඩි ශේෂයන්ගේ එකතුව රු.1,877,338 ක් වූ අතර මෙම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2014 හා 2015 වර්ෂවලදී ලබාදී තිබූ රු.195,150 ක් වටිනා අත්තිකාරම් 4 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද පියවා නොතිබුණි.

2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම්
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය	
(i) VII පරිච්ඡේදයේ 10 වගන්තිය හා 2013 ඔක්තෝම්බර් 07 දිනැති අංක 21/2013 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 (අ) සහ (ඇ)	අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියකින් තොරව ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී විසින් නිවාඩු දිනවල වැඩ කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී නිවාඩු දින 22 ක් වෙනුවෙන් නිවාඩු දින වැටුප් ලෙස රු.81,620 ක් ලබාගෙන තිබුණි.

(ii)	VII පරිච්ඡේදයේ 12.5.4 වගන්තිය	වැඩ බැලීමේ තනතුරක් සඳහා ගෙවීම් කිරීමේදී වැඩබලන තනතුරට අයත් ආරම්භක වැටුපෙන් සියයට 25 ක් පමණක් ගෙවිය යුතුය. එහෙත් නිලධාරීන් දෙදෙනෙකුට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරෙහි වැඩ බැලීම වෙනුවෙන් දීමනා ගෙවීම වෙනුවට, 2015 මැයි සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා ප්‍රවාහන හා ඉන්ධන දීමනා ලෙස රු.2,778,116 ක් ගෙවීම හේතුවෙන් අදාළ නිලධාරීන්ට වැඩබැලීමේ දීමනාව ලෙස හිමි දීමනාවට වඩා රු.2,214,602 ක් වැඩිපුර ගෙවා තිබුණි.
(ආ)	2000 ජනවාරි 19 දිනැති අංක 380 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	චක්‍රලේඛයෙන් ආවරණය නොවන බැටරි පරීක්ෂාව, RCCB පරීක්ෂාව යන ව්‍යාපෘති තුළින් ලැබෙන ආදායමෙහි අතිරික්තය ඊට සම්බන්ධ සෘජු හා වක්‍ර කාර්ය මණ්ඩලය වෙත බෙදා හැරීමට කටයුතු නොකළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළදී එම ආදායමෙන් රු.831,897 ක් කාර්ය මණ්ඩලය වෙත බෙදා හැර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.15,287,030 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.9,511,887 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.24,798,917 ක පිරිහීමක් දක්නට ලැබුණි. සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන ප්‍රදාන ලැබීම් රු.18,622,000 කින් අඩුවීම හා මෙහෙයුම් වියදම් රු.5,830,487 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේදී රු.18,679,669 ක් වූ අතිරික්තය 2015 වර්ෂය වනවිට රු.9,511,887 ක් දක්වා අඩු වී තිබුණු අතර 2016 වර්ෂයේදී රු.15,287,030 ක ඌනතාවයක් ඇතිවී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට

සේවක පාරිශ්‍රමික හා ස්ථාවර වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැලපීමේදී 2012 වර්ෂයේදී රු.77,249,669 ක් වූ ආයතනයේ දායකත්වය 2016 වර්ෂය අවසානයට රු.90,296,226 ක් දක්වා වර්ධනය වී තිබුණද, 2015 වර්ෂයට සාපේක්ෂව සියයට 10 කින් අඩු වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ වැඩිදියුණු කිරීමේ පනතේ 22 වන ඡේදය ප්‍රකාරව, ආයතනයේ කාර්යභාරය වනුයේ නවීන තාක්ෂණය හඳුන්වාදීම වේගවත් කිරීම සඳහා නවීන තාක්ෂණයන් යොදාගැනීම සඳහා පර්යේෂණ හා සංවර්ධන කටයුතු ආරම්භ කිරීම හා පවත්වාගෙන යාම, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ව්‍යාපාරවලට පර්යේෂණ හා සංවර්ධන සහාය සැලසීම සහ රාජ්‍ය හා පෞද්ගලික අංශය මගින් සිදුකරන කාර්යයන් වලදී නවීන තාක්ෂණය පිළිබඳව පුද්ගලයන් පුහුණු කිරීම හා අනාගත අධ්‍යයන කටයුතු ප්‍රවර්ධනය කිරීම වුවත් ආයතනයේ කාර්යසාධනය පිළිබඳ පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) තේ කොළ වර්ණ ශ්‍රේණිගත කිරීමේ යන්ත්‍රය නිපදවීමේ ව්‍යාපෘතිය

(i) තේ කොළ වර්ණ ශ්‍රේණිගත කිරීම සඳහා අඩු පිරිවැය යන්ත්‍රයක් නිපදවීමේ පර්යේෂණ ව්‍යාපෘතියක් 2012 වර්ෂයේ ආරම්භකර තිබුණද, එම ව්‍යාපෘතිය නිමකල යුතු කාලය, එක් එක් වර්ෂයේ සිදු කළ යුතු කාර්යභාරය ආදිය පිළිබඳ සැලැස්මක් සකස්කර නොතිබුණු අතර 2016 වර්ෂය අවසාන වනවිටත් යන්ත්‍රය නිපදවීමට කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඒ වෙනුවෙන් දරන ලද පිරිවැය රු.4,209,066 ක් විය.

(ii) මෙම පර්යේෂණ ව්‍යාපෘතිය තුළින් මෙරට තේ කර්මාන්තය සඳහා නවීන තාක්ෂණය හඳුන්වාදීමට බලාපොරොත්තුවන ආකාරය, දැනට වෙළඳ පොළෙහි පවතින යන්ත්‍රවලට වඩා මෙමගින් බලාපොරොත්තුවන විශේෂිත ගුණාංග, අපේක්ෂිත වෙළඳපොළ, අපේක්ෂිත පිරිවැය හා තේ කර්මාන්තයේ අභිවෘද්ධිය උදෙසා දායක වන ආකාරය කෙසේද යන්න දැක්වෙන පරිදි ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ප්‍රථමයෙන් සකස් කර නොතිබුණි.

(iii) විද්‍යා හා තාක්ෂණ වැඩිදියුණු කිරීමේ පනත ප්‍රකාරව නවීන තාක්ෂණය යන්නට ඉලෙක්ට්‍රොනික විද්‍යාවද අයත් වන අතර ආයතනයේ ඉලෙක්ට්‍රොනික විද්‍යා අංශයක්ද ස්ථාපිත කර තිබිණි. එහෙත් ඉලෙක්ට්‍රොනික වැඩිදියුණු කිරීම් සඳහා අවශ්‍ය විශේෂඥ ඥානය ආයතනය සතුව නොමැති බව සඳහන් කරමින් ඉහත ව්‍යාපෘතිය තවදුරටත් කරගෙන යෑම සඳහා 2016 මාර්තු මාසයේදී පෞද්ගලික ආයතනයක් සමග රු.8,000,000 ක මුදලකට ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුම ප්‍රකාරව 2017 අගෝස්තු වන විට එහි IV වන අදියරෙහි වැඩ අවසන් විය යුතු වුවත්, I අදියරෙහි කටයුතු පමණක් අවසන් කර ඇති බව භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය.

(ආ) පුරාවිද්‍යා ගවේශණ සහ කැනීම් සඳහා නවීන තාක්ෂණය යොදා ගැනීම.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙනුවෙන් පුරාවිද්‍යා ගවේශණ හා කැනීම් කටයුතු සඳහා ඡායා පිටපත් ලබාගැනීමේ අරමුණින් වටිනාකම රු.10,564,677 ක් වූ නියමුවන් රහිත යානයක් 2016 අගෝස්තු මාසයේදී මිලදී ගෙන තිබුණි. යානය මිලදී ගැනීමට පෙර එය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රු.110,322 ක වියදමක් දරා නිළධාරීන් දෙදෙනෙකුට විදේශීය පුහුණුවක්ද ලබා දී තිබියදී නොවැම්බර් 30 දින ප්‍රථමවරට යානය ගුවන් ගත කල අවස්ථාවේදී යානය හානියට පත්වී තිබුණි. නිෂ්පාදිත රටට යවා යානය අළුත්වැඩියා කර තිබුණද 2017 ඔක්තෝබර් 30 වන විටත් එය ක්‍රියාත්මක කල හැකි තත්වයේ නොමැති බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයට අයත් විදුලි සංදේශ කුලුන, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට කුලියට දීමට අදාළව ආයතනය විසින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සමග 2013 වර්ෂයේ දී එළඹී බදු ගිවිසුම 2015 ජනවාරි 31 දින අවසන් වී තිබුණි. එහෙත් අදාල බදු ගිවිසුම අලුත් කිරීමකින් තොරව 2015 පෙබරවාරි මාසයේ සිට ජූලි මාසය දක්වා භාවිතා කර තිබූ අතර ඒ වෙනුවෙන් ආයතනයට ලැබිය යුතු රු. 638,134 ක කුලිය අයවී නොතිබුණි.

තවද, 2015 අගෝස්තු 01 දින සිට සිට 2017 ජූලි 31 දිනෙන් අවසන් වර්ෂ 02ක කාලය සඳහා ගිවිසුම් අත්සන් කර තිබුණද අදාල කාලය වෙනුවෙන් ලැබිය යුතු රු. 2,079,768 ක කුලියද, 2017 නොවැම්බර් 30 වන විටත් අයකරගෙන නොතිබුණි.

(ආ) පෘථිවි නිරීක්ෂණ දත්ත ලබාගැනීම හා බෙදාහැරීම පිළිබඳ ජාතික මධ්‍යස්ථානය

රටේ සංවර්ධනය සඳහා අභ්‍යවකාශ තාක්ෂණය යොදාගැනීම දිරිගැන්වීමේ අරමුණින් චීන රජයේ සහභාගිත්වයෙන් චන්ද්‍රිකා මධ්‍යස්ථානයක් පිහිටුවීමේ ව්‍යාපෘතියක් ශක්‍යතා අධ්‍යනයක් සිදුකිරීමකින් තොරව ආරම්භ කර තිබුණි. චීන නියෝජිත ආයතනය සමග වූ අවබෝධතා ගිවිසුම ප්‍රකාරව මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා සුදුසු භූමියක් තෝරාගැනීමේදී දෙපාර්ශවයම සහභාගී විය යුතු වුවත්, චීන නියෝජිත ආයතනයේ සහභාගිත්වයකින් තොරව ආයතනයේ අභිමතය පරිදි භූමියක් තෝරගෙන තිබුණි. එහෙත් චීන නියෝජිත ආයතනය විසින් පසුව සිදුකල නිරීක්ෂණ වාරිකා වලදී එම භූමිය ව්‍යාපෘතිය සඳහා සුදුසු නොවන බැවින් වෙනත් භූමියක් සොයාගැනීමට කටයුතු කළ යුතු බව සඳහන් කර තිබුණි. එහෙත්, ආයතනය විසින් එම ඉඩම වටා වැටක් ඉදිකිරීම වෙනුවෙන් 2016 දෙසැම්බර් 16 දින රු.3,545,744 ක මුදලක් නාගරික සංවර්ධන අධිකාරියට ගෙවා තිබුණ ද විගණන දිනය වූ 2017 නොවැම්බර් මාසය වන විටත් අදාළ වැට ඉදිකර නොතිබුණු බැවින් එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2012 වර්ෂයේ සිට උපයෝජනයකින් තොරව පවතින පිරිවැය රු. 4,091,099 ක් වූ තොග අතුරින් භාවිතයට ගත නොහැකි තොග හා සෙමෙන් චලනය වන තොග හඳුනාගෙන අපහරණය කිරීමට හෝ මූල්‍ය ප්‍රකාශනවල වෙන්කිරීම් සිදුකිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී සිදුවූ වාහන අනතුරකින් වූ රු.50,063 ක අලාභය රියදුරුගෙන් අයකල යුතු බවට මූලික විමර්ෂණයෙන් නිර්දේශ කර තිබුණද විගණන දිනය වූ 2017 අගෝස්තු වන විටත් එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 177 ක් වුවද, තත්‍ය කාර්ය මණ්ඩලය 91ක් වූයෙන් තනතුරු 86 ක පුරප්පාඩු පැවතිණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට පැවති තනතුරු 29 ක පුරප්පාඩු 96 අතුරින් තනතුරු 9 ක පුරප්පාඩු පිරවීම සඳහා පමණක් පුවත්පත් දැන්වීම් පලකර තිබුණු අතර ඉන් තනතුරු 2 ක පුරප්පාඩු 8 ක් සඳහා පමණක් බඳවා ගැනීම් සිදුකර තිබුණි.

(ආ) පර්යේෂණ හා සංවර්ධන කටයුතු ඉටුකිරීමේ අරමුණින් ක්‍රියාත්මක මෙම ආයතනය ක්ෂුද්‍ර ඉලෙක්ට්‍රොනික, විදුලි සංදේශ, තොරතුරු තාක්ෂණ, අභ්‍යවකාශ තාක්ෂණ, රොබෝ විද්‍යාව පිළිබඳව සහ නවීන තාක්ෂණ විෂය පිළිබඳ හා වෙනත් අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ ප්‍රමුඛ ආයතනයද වේ. එම ක්ෂේත්‍රයන්ට සෘජුවම සම්බන්ධවන නිලධාරීන්ගෙන් සමන්විත තනතුරු 34 ක පුරප්පාඩු 70 ක් පැවතීම ආයතනයෙන් අපේක්ෂිත අරමුණු කරා ලහා වීමට බලපෑ හැකි බැවින් පුරප්පාඩු සම්පූර්ණ කිරීම සම්බන්ධයෙන් පවතින ගැටලු සමාලෝචනය කර එම ගැටළු විසඳා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.3 වගන්තිය ප්‍රකාරව වැඩ බැලීමේ පත්කිරීමක් කල යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණක් වන අතර තනතුරට පුර්ණ කාලීන නිලධාරියෙකුගේ සේවය අවශ්‍ය නම් නිත්‍ය පත්වීමක් නොපමාව සිදුකල යුතුය. එහෙත් 2013 හා 2015 වර්ෂවල සිට වැඩ බැලීමේ පත්වීම් සිදුකර තිබූ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු 4 ක පුරප්පාඩු පිරවීම සඳහා 2017 මැයි 30 දක්වාම කටයුතු කර නොතිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 ක්‍රියාකාරී සැලැස්ම

(අ) 2016 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුළත් කර තිබූ කාර්යයන් 77 න් කාර්යයන් 25 ක් හැර අනෙක් එක් එක් කාර්යය සඳහා වන ඇස්තමේන්තු මුදල කොපමණද යන්න දක්වා නොතිබුණු අතර වර්ෂ අවසාන කාර්යසාධන ඇගයීමේදීද සත්‍ය වශයෙන් වැයවූ මුදල කොපමණද යන්න කිසිදු ව්‍යාපෘතියක් සඳහා දක්වා නොතිබුණි.

(ආ) එක් එක් ව්‍යාපෘතියෙන් වර්ෂය තුළදී නිම කිරීමට අපේක්ෂිත ප්‍රමාණය හා ප්‍රගතිය සමාලෝචනය කිරීමේදී භෞතික ප්‍රගතිය ප්‍රතිශතාත්මක ලෙස ඇගයීම සිදුකිරීම තුළින් පවත්නා වර්ෂයේ ආයතනයේ මූල්‍ය පිරිවැයට සාපේක්ෂව ප්‍රගතිය ඇගයීමටත් ඊළඟ වර්ෂයේ ක්‍රියාකාරකම් මනාව සැලසුම් කිරීමටත් පහසු වුවද ක්‍රියාකාරී සැලැස්මෙහි සහ ප්‍රගති වාර්තාවල එසේ දක්වා නොතිබුණි.

5.2 ප්‍රසම්පාදන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා සකස් කරන ලද ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත් කර තිබූ ඇස්තමේන්තුගත වටිනාකම් රු.24,064,881 ක් වූ භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනයන් 60 ක් වර්ෂය තුළ ඉටුකර නොතිබුණි. තවද, 2015 වර්ෂයේදී මිළදී ගැනීමට නොහැකි වීම හේතුවෙන් 2016 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර තිබූ ඇස්තමේන්තුගත වටිනාකම් රු.20,910,419 ක් වූ ප්‍රසම්පාදනයන් 14 ක් 2016 වර්ෂයේදී ද නිම කර නොතිබුණි. මේ අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය කාර්යක්ෂම ලෙස සැලසුම් කර තිබුණේද යන්න විගණනයේදී ගැටළු සහගත විය.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ සභාපති වෙත යොමු කරන ලදී. පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

	පද්ධති හා පාලන ක්ෂේත්‍ර	නිරීක්ෂණ
(අ)	මානව සම්පත් කළමනාකරණය	(i) නිවාඩු දිනවල වැඩ කිරීමට පෙර පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවත් වැඩකල දිනට පසුව අනුමැතිය ලබාගැනීම.
		(ii) පැමිණීමේ සහ පිටවීමේ ලේඛනය අනුව අදාළ දිනයේ පැමිණීම හා පිටවීම නිවැරදි බවට බලයලත් නිලධාරියෙකු විසින් සහතික නොකිරීම.
(ආ)	මූල්‍ය පාලනය	(i) නිවාඩු දිනවල වැඩකිරීම වෙනුවෙන් දීමනා ගෙවීමේදී වවුචර්වල "ගෙවන ලදී" යනුවෙන් සටහන් කර නැවත ගෙවීමක් සිදු නොවන බව තහවුරු කර නොගැනීම.
		(ii) නිවාඩු දින වැඩ කිරීම වෙනුවෙන් දීමනා ඉල්ලුම් කිරීමේදී නියමිත ආකෘති පත්‍රය භාවිතා නොකිරීම.
(ඇ)	මෙහෙයුම් පාලනය	(i) විදේශ ගමන් පිළිබඳ ආරාධනා පත්‍රය, අයදුම්පත්‍රය, අනුමැතිය සඳහන් ලිපි ආදිය සහිතව සම්පූර්ණකරන ලද ලිපිගොනු පවත්වා නොගැනීම.
		(ii) නැවත සේවයට වාර්තා කල බව දැන්වීමේ ලිපියක් විදේශ ගමන් ලිපිගොනුවේ හෝ පෞද්ගලික ලිපිගොනුවෙහි නොවීම.

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

13.0 විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති.

(i) සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ පාරිතෝෂික ගෙවීම සම්බන්ධ වූ අගයන් සම්බන්ධයෙන් විගණන නිරීක්ෂණය මඟින් අනාවරණ වූ රු.30,000.00 ක් වූ වෙනස අදාළ ගෙවීම සම්බන්ධයෙන් වූ ගැලපුමක ප්‍රතිඵලයක් බව නිරීක්ෂණය විය.

(ii) මෙම විගණන නිරීක්ෂණයේ දක්වා ඇති පරිදි භාණ්ඩාගාරයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන සමාලෝචිත වර්ෂයට රු. 79,043,000 කි. එහෙත් මූල්‍ය නොවන ප්‍රදාන ලෙස රු.6,390,000 ක් ලැබුණි. සත්‍ය ලෙස අරමුදල් ලැබීම රු.85,433,000 කි.

2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති.

මෙම විගණන නිරීක්ෂණයේ දක්වා ඇති පරිදි සමාලෝචිත වර්ෂයේ විලම්භීත අදායම් ලෙස අදායම් ගිණුම් ගතකර තිබුන ද 2017 ජූලි මස සිට උපචිත පදනම මත ගිණුම් ගත කිරීම ආරම්භ කර ඇත.

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු.

(අ) විගණන නිරීක්ෂණයේ දක්වා ඇති පරිදි රු.91,637 ක් වූ සමුච්චිත ක්ෂය වෙන්කිරීම අතපසු වීමකින් වැඩියෙන් දක්වා ඇත. එය 2017 වර්ෂයේදී නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

(ආ) විගණන නිරීක්ෂණයේ දක්වා ඇති පරිදි විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හා අප ආයතනය අතර වලංගු ගිවිසුමක් අදාළ කාල පරිච්ඡේදය සඳහා අත්සන් කිරීම කොමිසම පාර්ශවයෙන් වූ ප්‍රමාදයක් හේතුවෙන් රු.1,035,657ක් වූ කුලී ආදායම ගිණුම් ගතකර නොතිබුණි. අදාළ ගිවිසුම් මේ වන විට අත්සන් කර ඇති බැවින් 2017 ගිණුම් වර්ෂයේ දී අදාළ ගිණුම් ගත කිරීම් සිදු කර ඇත.

(ඇ) විගණන නිරීක්ෂණයේ දක්වා ඇති පරිදි අදාළ ගැලපීම් සටහන් 2017 වසරේ ගිණුම් තුළ අදාළ පරිදි දැක්වීමට පියවර ගනු ඇත.

(ඈ) මෙම විගණන නිරීක්ෂණයේ දක්වා ඇති පරිදි 2017 වර්ෂයේ සිට පර්යේෂණ හා සංවර්ධන වියදම්, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ වියදමක් ලෙස ගිණුම්ගත කරනු ලැබේ. එම වියදමට අදාළ අගය ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමෙන් අදායමක් ලෙස මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ දැක්වීමට කටයුතු කරනු ලැබේ.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂයන්.

(අ) විගණන නිරීක්ෂණයේ දක්වා ඇති පරිදි සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති හා පාඨමාලා වෙනුවෙන් ලැබිය යුතු ශේෂය රු.8,986,777ක් විය. ඉන් රු,4,186,528ක මුදලක් 2017.10.31 දිනට අයකරගෙන ඇත. තවද රු.622,160 ක වටිනාකමක ඉන්වොයිසි අවලංගු කර ඇත. සත්‍ය වශයෙන්ම මේ වන විට අයකර ගත යුතු වටිනාකම වන්නේ රු.4,178,088 කි.

තවද වසර 3කට වැඩි ශේෂයන්ගේ එකතුව රු.1,655,681ක් වන අතර 2017.10.31 දින වන විට රු.25,132 මුදලක් අයකරගෙන ඇත. තවද රු.125,104 ඉන්වොයිසි අවලංගු කර ඇත. මේ වනවිට සත්‍ය වශයෙන්ම අයකර ගත යුතු වටිනාකම වන්නේ රු.1,505,444 කි. මෙම වටිනාකම තව දුරටත් අය කර ගැනීමට කටයුතු කරනු ඇත.

(ආ) විගණන නිරීක්ෂණයේ දක්වා ඇති අගය පහත පරිදි සැකසී ඇත.

පුද්ගලයන්	රු.	
Debtor – Mr.P.T.Fernando	4,000.00	
Debtor – Mr. Jayathu Fernando	106,894.72	
Debtor – Mr.B.R.P.Perea	45,699.66	156,594.38
ආයතන		
Insurance Cooperation Debtor	9,700.00	
R.S Debtor	14,434.91	
Election Department	8,159.60	
Ministry Debtor – Dish TV Package	33,381.50	65,676.01
		222,270.39

ඉහත අගයන් අය කර ගැනීමට පියවර ගනු ලැබේ.

(ඇ) සේවා සැපයීම මත රඳවාගත් මුදල් සහ වෙනත් නැවත ගෙවියයුතු අගයන් (Refund) වලින් ඉහත අගය සැකසී ඇත. ඒවා විධිමත් ඉල්ලිම් මත නිදහස් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඈ) මෙම විගණන නිරීක්ෂණයේ ඇති 2014 හා 2015 වර්ෂ වලදී ලබා දෙන ලද රු. 195,150 වටිනා අත්තිකාරම් 4 ක් 2017 වර්ෂයේදී නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ.

2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය.

(i) විගණන විමසුමට පාදක වී ඇත්තේ ආයතන සංග්‍රහය සහ එයට සංශෝධන ලෙස 2013 ඔක්තෝබර් 07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2(අ) හි කරුණු බව පෙනීයයි. එසේ වුවද අප ආයතනය වෙනත් පාර්ලිමේන්තු පනතක් මගින් (1994 අංක 11 දරණ විද්‍යා හා තාක්ෂණ සංශෝධන පනත) ස්ථාපනය කරන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වන අතර අප ආයතනය වැනි ආයතන වලට ඉහත කී ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන සෘජුවම අදාළ නොවේ. මේ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ ද දක්වා ඇත. ආයතන සංග්‍රහයේ යම් යම් ප්‍රතිපාදන ආයතනය විසින් අනුගමනය කරනු ලබන්නේ එහි ප්‍රතිපාදන මෙම ආයතනයේ ආයතනික කාර්යයන් සඳහා සුදුසු මාර්ගෝපදේශයක් වන අවස්ථාවන් හිදී ඒ ඒ ප්‍රතිපාදන ආයතනයට සුදුසු පරිදි ගලපා ගැනීමෙන් අනතුරුව පාලක මණ්ඩලය අනුමත කිරීමෙන් පසුව පමණි. (උදාහරණයක් ලෙස විනය පටිපාටි සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ අඩංගු ප්‍රතිපාදන සුදුසු පරිදි ගලපා පාලක මණ්ඩලය මඟින් අනුමත කිරීමෙන් අනතුරුව ආයතනයේ විනය ක්‍රියා පටිපාටිය ලෙස යොදාගනු ලබයි.)

ආයතනය මඟින් අපේක්ෂිත ව්‍යවස්ථාපිත කාර්යභාරය ඉටුකිරීමේ දී ආයතනයේ අභ්‍යන්තර පරිපාලන කටයුතු පිළිබඳව සුදුසු පරිදි තීරණ ගැනීමේ බලය ආයතනය සංස්ථාපනය කිරීමේ පනත අනුව ආයතනයේ පාලක සභාව සතු වේ. එසේ ගන්නා වූ තීරණ ව්‍යවස්ථාදායකය මඟින් සම්මත කරන ලද වෙනත් පනතක හෝ එබඳු පනතකට අනුව නිකුත් කරන ලද රෙගුලාසියක හෝ, එබඳු පනතක / රෙගුලාසියක දැක්වෙන්නා වූ නිශ්චිත ප්‍රතිපාදනයක් පදනම් කරගනිමින් නිකුත් කරන ලද (ආයතනයට අදාළ වන්නා වූ) චක්‍රලේඛයක හෝ අමාත්‍ය මණ්ඩල තීරණයක හෝ නැතහොත් යම් අදාළ නිශ්චිත අධිකරණ තීන්දුවක අඩංගු යම් ප්‍රතිපාදනයකට හෝ පටහැනි නොවන්නේ නම් එම තීරණ නීත්‍යානුකූල තීරණ වේ.

විගණන විමසුමේ දක්වා ඇති මාණ්ඩලික නිලධාරීන්ට සති අන්ත සහ රජයේ නිවාඩු දිනයන් හිදී රාජකාරී කළහැකි උපරිම දින ගණන මාසයකට දින 2ක් පමණක් විය යුතු බව පෙන්වා දී ඇතත් ආයතනික අත්‍යවශ්‍ය රාජකාරිමය ස්වභාවය සැලකිල්ලට ගෙන දින 2කට වඩා වැඩ කිරීමට සිදුවන අවස්ථා පැන නැඟී ඇත. දැනට සිටින කාර්ය මණ්ඩල සාමාජිකයින්ට පැවරෙන වැඩ කොටස් සහ ඒවා ඉටු කිරීමේ කාල රාමුව සීමිත බැවින් එසේ අතිරේක සේවය ලබා ගැනීමට සිදු වී ඇත. **මේ සම්බන්ධයෙන් 2013/09/09 වන දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මගින් පවරන ලද රාජකාරී වල කාර්යමය ස්වභාවය පිළිබඳව කරුණු දක්වා මාසයකට උපරිම දින ගණන 5ක් ලෙස නිවාඩු දින සහ සති අන්ත දිනවල සේවය ලබාගැනීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාදී ඇත.**

අදාළ අනුමැතිය පාලක මණ්ඩලය සතු නීත්‍යානුකූල අධිකාරී බල සීමාව තුළ නීත්‍යානුකූල තීන්දුවක් බැවින් හා විගණන විමසුමේ දක්වා ඇති සති අන්ත හා නිවාඩු දින රාජකාරී යෙදවීම් එකී පාලක මණ්ඩල තීන්දුවට අනුකූලවන පරිදි සිදුකර ඇත. මෙමඟින් ආයතනික කටයුතු වලට අදාළ වන කිසිඳු රෙගුලාසියක් උල්ලංඝනය වී නොමැති බව ඔබගේ කාරුණික අවධානයට යොමුකර සිටිමු.

ඉහත විගණන විමසුමට අදාළව දක්වන ලද කරුණු වලට අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අදාළ නීත්‍යානුකූල අනුමැතිය ලබා දී ඇති පසුබිමක අමාත්‍යාංශ ලේකම් වරයාගෙන් පූර්ව අනුමැතියක් ලබාගැනීමේ අවශ්‍යතාවයක් පැන නොනගින බව ද ඔබගේ කාරුණික අවධානය පිණිස යොමුකර සිටිමු.

(ii) මෙම ජ්‍යෙෂ්ඨ මට්ටමේ පවතින තනතුරුවල පුරප්පාඩු සඳහා බාහිර අයදුම්කරුවන් ඉල්ලුම් නොකරන ලද බැවින් ආයතනයේ පරිපාලනමය හා අනෙකුත් ක්‍රියාකාරකම් දැඩි අර්බුදකාරී තත්වයකට පත්වීම වැළැක්වීම සඳහා ආයතනයේ සුදුසුකම්ලත් නිලධාරීන්ගෙන්, ඔවුනගේ පවත්නා තනතුරේ රාජකාරීන්ට අමතරව, ඊට ඉහළ පුරප්පාඩුව පවතින තනතුරේ වැඩ බැලීම සඳහා ආයතනයේ පාලක මණ්ඩල අනුමැතිය

මත මෙම නිලධාරීන් පත් කර ඇත. මෙම වැඩ බලන තනතුරට අදාළව ඉටු කළයුතු සියලු රාජකාරී සහ ඒ ආශ්‍රයෙන් පැන නගින රාජකාරි ගමන් බිමන් ආදී සියලු කටයුතු වියදම් තමන් විසින් ම දරාගැනීම වෙනුවෙන් පාලක මණ්ඩල තීරණය මත, ප්‍රවාහන දීමනාව හා ඉන්ධන දීමනා ලබාදී ඇත. ආයතන සංග්‍රහයට අනුව මෙම නිලධාරීන් සඳහා වැඩ බලන තනතුරේ, වැටුපෙන් 25% ක් ලබාදීමට ආයතනය විසින් කටයුතු නොකළ බව වැඩිදුරටත් දන්වනු කැමැත්තෙමු.

(ආ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 380 පදනම් කරගනිමින් ආයතනය විසින් සිදු කරනු ලබන පර්යේෂණ, උපදේශණ සේවා, පරීක්ෂණ හා මිණුම් සේවා, මෙන්ම පුහුණු පාඨමාලා මගින් උපයනු ලබන අතිරික්ත ආදායම් අදාළ සෘජු හා චක්‍ර කාර්ය මණ්ඩල සාමාජිකයින් අතර බෙදා දීම සඳහා දැනට ආයතනය තුළ අනුමත ගෙවීම් ක්‍රමවේදය කඩිනමින් නැවත සමාලෝචනයකට ලක්කිරීමට නියමිත බැවින්, එහිදී අදාළ විගණන නිරීක්ෂණය සැලකිල්ලට ගනිමින් සුදුසු සංශෝධන හඳුන්වා දීමට කටයුතු කරනු ඇත.

3 මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵලය

මෙහිදී විගණන නිරීක්ෂණයේ සඳහන් 15,287,030ක ඌනතාවය ඇති වීමට හේතුපාදක වී ඇත්තේ භාණ්ඩාගාරය විසින් වර්ෂයට අදාළව පුනරාවර්ථන ප්‍රදානවල වටිනාකම අඩුවීම මූලිකවම බලපා ඇත. ප්‍රදානවල වටිනාකම අඩුවීමට හේතු වී ඇත්තේ 2015 වර්ෂයේ ඉතිරිව තිබූ පුනරාවර්ථන ප්‍රදාන ශේෂය 2016 වර්ෂයේ භාවිතා කරන ලද බැවිනි. විගණන නිරීක්ෂණයේ මෙහෙයුම් වියදම් රුපියල් 5,830,487.00 කින් වැඩිවීමට හේතුවී ඇත්තේ රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් මත ක්‍රියාත්මක වූ ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් සඳහා ලබාදෙන ඉන්ධන දීමනාව, ප්‍රවාහන දීමනාවල සහ සන්නිවේදන දීමනා වල සමස්ත වියදම මෙහෙයුම් වියදම් වැඩිවීමට සෘජුව බලපා ඇත. මේ අනුව අපගේ නිරීක්ෂණය වනුයේ එය මූල්‍ය පි ප්‍රතිඵලයේ පිරිහීමක් ලෙස අර්ථකථනය නිවරදි නොවන බවයි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 4ක එකතු කළ අගය පිළිබඳ විග්‍රහයේ දී 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේ 10% ක අඩුවීමක් විගණනයේ දී නිරීක්ෂණය කර ඇත. එම 10%ක අඩුවට මූලික වශයෙන් බලපා ඇත්තේ 2016 වර්ෂයේ ඌනතාවයයි. එය එම වර්ෂයට පමණක් අදාළ වන තත්වයක් වන අතර සමස්ත එකතු කළ අගය ක්‍රමානුකූල වර්ධනයක් පෙන්නුම් කරන බව දන්වනු කැමැත්තෙමු.

4 මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

(අ) <u>තේ කොළ වර්ණ ශ්‍රේණිගත කිරීමේ යන්ත්‍රය නිපදවීමේ ව්‍යාපෘතිය</u>

(i)/(ii) තාක්ෂණික වශයෙන් ඉතා සංකීර්ණ ව්‍යාපෘතියක් වන මෙවැන්නක ශක්‍යතා අධ්‍යනය කොටස් දෙකකි. එනම් සාමාන්‍ය ශක්‍යතා අධ්‍යනය (General Feasibility) හා තාක්ෂණික ශක්‍යතා අධ්‍යනයයි (Technical Feasibility). මෙයින් සාමාන්‍ය ශක්‍යතා අධ්‍යනයට ගැනෙන නිෂ්පාදනයට යොජිත පද්ධතිය සඳහා තේ කර්මාන්තශාලාවක ඇති ඉල්ලුම, තේ කර්මාන්තශාලා වක ඇති එවන් උපකරණයක ප්‍රධාන කාර්යභාරය , දැනට භාවිතා කරන මාදිලි ඒවා නිෂ්පාදිත රටවල් හා ආසන්න මිල , ආනයනය නැවතීමෙන් රටේ ඉතිරිවන මුදල් , දැනට භාවිතා වෙන පද්ධති වල අඩුපාඩු හා එවායේ තවදුරටත් කෙරෙමින් පවතින

තාක්ෂණික වෙනස්කම් , මෙවන් උපකරණ දැනට රටේ කොතරම් භාවිතා වේද, ඒවායේ උපරිම ජීව කාලය හා නොකඩවා තේ කර්මාන්තශාලාවල ඇති කැමැත්ත හා උපකරණයක් සෑදීමේ දී ඇති වැදගත්කම පෙන්වීම සඳහා (Demonstration) ඉහත කරුණු සඳහන්ව සාමාන්‍ය ශක්‍යතා අධ්‍යනය අවසානයේ දී පාලක මණ්ඩල අනුමැතිය සඳහා ව්‍යාපෘති විස්තරය ඉදිරිපත් කරන ලද අවස්ථාවේ දී මෙකී ශක්‍යතාවන් පිළිබඳව ප්‍රමාණවත් විස්තර සහිත ඉදිරිපත්කිරීම් කිහිපයක් සිදු කරන ලදි. 2011 වසරේ ජූනි මසට පසුව සාමාන්‍ය ශක්‍යතා අධ්‍යනය ආරම්භ කරන ලද අතර ,2011 සැප්තැම්බර් මාසයේදී ව්‍යාපෘති යෝජනාව (Project proposal) පාලක මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කරන ලද බවත් , තව දුරටත් ශක්‍යතා අධ්‍යනයට එකතු විය යුතු කොටස් කිහිපයක් පසුව (2011 දෙසැම්බර් දක්වා)සිදු කර සාමාන්‍ය ශක්‍යතා අධ්‍යනයේ ඉදිරිපත් කිරීම් සිදු කරන ලදි.

පාලක මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව 2012 වසරේ දී ව්‍යාපෘතියේ පළමු අදියරට අදාළ තාක්ෂණික කටයුතු ආරම්භ කරන ලදි. ව්‍යාපෘති යෝජනාවට අනුව ඉහත පළමු අදියර සඳහා වසරක කාලයක් යන බව සඳහන්ව තිබුණි. මෙම අදියරේ ප්‍රධාන අරමුණ වූයේ සම්පූර්ණ යන්ත්‍රයක් නිපදවීම නොව , තාක්ෂණික නිෂ්පාදනයට අදාළ පෙර සූදානමයි. තාක්ෂණික ශක්‍යතා අධ්‍යනය මේ සමඟ කෙරෙමින් පැවතුනි.

මේ අතරෙහි ව්‍යාපෘති යෝජනාව සඳහා ව්‍යාපෘති කන්ඩායමේ සිටි ඉලෙක්ට්‍රොනික ඉන්ජිනේරුවරිය හා කොන්ත්‍රාත් පදනමට බඳවාගෙන සිටි එකම යාන්ත්‍රික ඉන්ජිනේරුවරයාගේ ඉවත් වීම සිදුවිය. ඊට පසුව සම්බන්ධවූ ඉංජිනේරුවන් දෙදෙනා Know How ලබාගෙන එතැන් සිට ව්‍යාපෘතියේ කොටස් ආරම්භ කලද ඔවුන් දෙදෙනාද මාස 6කින් පමණ ආයතනයෙන් ඉවත්ව පිටරට රැකියා සඳහා යනු ලැබිණි. නැවත සම්බන්ධ වූ ඉන්ජිනේරුවන් දෙදෙනාද ව්‍යාපෘතියේ කෙටි කාලයක් වැඩ කිරීමෙන් පසුව ඉවත්ව ගිය බැවින් පළමු අදියරට අදාළ Single Camera based tea color identification system කොටස ඉවර කර ගැනීමට නොහැකි විය. මෙම කාර්ය සිදු කරමින් පැවති අවස්ථාවේ දී ව්‍යාපෘතියට අදාළ FPGA තාක්ෂණය මත පදනම් වූ කොටස් කරගෙන යාමට අවශ්‍ය දැනුමේ අඩු කමක් ඇති බවද නිරීක්ෂණය විය.

මේ තාක් උපාංග ගැනීම සහ සමහර නිමැවුම් සඳහා රුපියල් මිලියන 3.2ක පමණ මුදලක් වියදම් වී තිබුන බව සැබෑය. එය භාණ්ඩයක් නිෂ්පාදන හුදු පිරිවැයක් නොව පර්යේෂණ හා සංවර්ධන වැඩ සටහනක ඵලදායී අනාගත ආයොජනයකි.

(iii) ඉලෙක්ට්‍රොනික විද්‍යාව සම්බන්ධ අංශයක් පැවතුනද මෙම උපකරණය නිපදවීමේ දී අවශ්‍යව පැවතියේ අධි තාක්ෂණික FPGA (Field Programmable Gate Array) ඉලෙක්ට්‍රොනික දැනුමයි. මේ සම්බන්ධව පුළුල් දැනුමක් සාමාන්‍ය ඉලෙක්ට්‍රොනික ඉන්ජිනේරුවෙකු තුළ දක්නට නොලැබේ. (විශව විද්‍යාල අධ්‍යාපනයේ මේ පිළිබඳ ප්‍රායෝගික දැනුම අල්පය) මේ සම්බන්ධව පිටරටකින් විශේෂ පුහුණුවක් ලබා ගැනීමෙන් පමණි එම හැකියාව ගොඩනගා ගත හැක්කේ.

එම නිසා එම දැනුම ඇති පෞද්ගලික ආයතනයකින් එය ලබාගත යුතුය බව 2014 වසරේ අග වන විට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා (Justification) සමඟ ඉදිරිපත් කරනු ලැබිණි.

මෙම උපකරණය යාන්ත්‍රික ඉන්ජිනේරු තාක්ෂණය හා ඉලෙක්ට්‍රොනික ඉන්ජිනේරු තාක්ෂණය යන දෙකම උපරිම ලෙස භාවිතාවන නිෂ්පාදනයකි.පිටත ආයතන සමඟ FPGA Electronics කර ගැනීමට ගිවිසුම් ගතකරගත් නමුත්, ආතර් සී ක්ලාක් ආයතනයේ වගකීමක් ලෙස යාන්ත්‍රික උපකරණය නිම කර දීම සඳහන් විණි. එම කාර්යය සිදු කර ගත යුත්තේ රටේ ඇති යාන්ත්‍රික නිෂ්පාදන කරන ආයතන තුලිනි (work shop)එම කාර්යය සිදු කරන ආයතන ඉතා අල්ප සහ ඔවුන් ඒ සඳහා වැඩි කාලයක් ගන්නා තත්වයක , ඉහත කාල වකවානු තුළ අධියර 1 සහ අධියර 3 ප්‍රමාදවූ බව සත්‍යකි. එසේ වුවද අද වන විට එය ඉටුකර ගැනීමට හැකි සෑම පියවරක්ම ගෙන ඇත.

(ආ) <u>පුරාවිද්‍යා ගවේශණ සහ කැනීම් සඳහා නවීන තාක්ෂණය යොදා ගැනීම.</u>

විගණන නිරීක්ෂණයෙහි සඳහන් නියමුවන් රහිත ගුවන් යානය (UAV) මිල දී ගනු ලැබුවේ , එම යානා මඟින් ලබා ගන්නා ගුවන් ඡායාරූප, දියුණු රටවල විවිධ ක්ෂේත්‍ර වල සංවර්ධන ව්‍යාපෘති හා අනෙකුත් කටයුතු සඳහා යොදාගන්නා බව ශක්‍යතා අධ්‍යනයේ දී අනාවරණය වූ බැවිනි පුරාවිද්‍යා ක්ෂේත්‍ර ය යනු බොහෝ විෂය ක්ෂේත්‍ර අතුරින් එක් විෂය ක්ෂේත්‍රයක් පමණි.

2016 නොවැම්බර් මස 30 දින අනතුරට පත්වූ UAV එක සම්බන්ධයෙන් ආයතනය විසින් සමීක්ෂණ කමිටු වාර්තාවක් ලබාගන්නා ලද අතර UAV ගුවන් යානය නැවත යතා තත්වයට පත් කර ගැනීම සඳහා කඩිනමින් කළයුතු ක්‍රියාමාර්ග ගෙන ඇත.

නිෂ්පාදිත රටට යවා අළුත් වැඩියා කිරීම සඳහා 2017 පෙබරවාරි 06 දින දේශීය නියොජිත සමාගම වෙත භාරදෙන ලද UAV ගුවන් යානය අළුත්වැඩියාවෙන් පසු2017 මැයි මස 12 දින නැවත අප ආයතනයට බාරදෙන ලදි. UAV යානය අප ආයතනයේ විද්‍යාඥයින් පරීක්ෂා කිරීමේ දී එහි තව දුරටත් තාක්ෂණික දෝෂ ඇති බව අනාවරණය විය.ඒ අනුව එම දෝෂ නිවරදි කිරීම සඳහා එය නැවත කඩිනමින් දේශීය නියොජිත සමාගමට බාරදෙන ලදි. 2017 නොවැම්බර් මස අග භාගයේ දී යානයේ දෝෂ නිදොස් කරන ලද බව අප ආයතනයට දැනුම් දී ඇති අතර මේ වන විට, නියෝජිත ආයතනයේ තාක්ෂණික නිලධාරීන් අධීක්ෂණයෙන් සහ සහභාගීත්වයෙන් UAV යානයේ පරීක්ෂණ ගුවන් ගමනක් සිදු කිරීමට අවශ්‍ය තාක්ෂණික සහ ගුවන් යානා පියාසර කිරීම සම්බන්ධ අවසර ලියවිලි ලබා ගැනීම ආදී කටයුතු සම්පාදනය වෙමින් පවතී.තවද විගණන නිරීක්ෂණයේ සඳහන් නිලධාරීන් දෙදෙනෙකුට ලබාදුන් දින 03ක විදේශීය පුහුණුව, හුදෙක් යානය හැසිරවීමේ කටයුතු සඳහා වූ මූලික පුහුණුවක් පමණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

(අ) ආතර් සී ක්ලාක් ආයතනය සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අතර ගිවිසුම් ප්‍රකාරව 2014 දෙසැම්බර් සහ 2015 ජනවාරි මාස වලදී ගෙවීම් සිදු කිරීමට නියමිතව තිබුනද, ඔවුන් භාවිතා කරන කාර්යාලය අදාළ ප්‍රමිතියට අනුකූලව සකස් කර නොමැති හෙයින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙන් ගෙවීම් ප්‍රතික්ෂේප කරන බවට ලිඛිතව දන්වා ඇත. නමුත් මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සමඟ සාකච්ඡා කර මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

2015 වර්ෂයේ සිට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සහ ආතර් සී ක්ලාක් ආයතනය අතර නව ගිවිසුමකට එළඹී අතර එම ගිවිසුම දෙපාර්ශවයේ එකඟතාවය මත වසර 2ක කාලයක් බලාත්මක වන පරිදි අත්සන් කර ඇති අතර එම ගිවිසුම ප්‍රකාරව 2015 අගොස්තු මස සිට සංශෝධිත කුලී ආදායම් අප ආයතනයට ලැබිය යුතුව ඇත. 2015 පෙබරවාරි 01 දින සිට 2015 ජූලි 31 දක්වා කාලය තුල ඔවුන්ගේ කාර්යාලයේ නඩත්තු කටයුතු සිදුකර ඇති බැවින් එම කාලය ගිවිසුම මඟින් ආවරණය වී නැත.

2015 නව ගිවිසුම අනුව 2015 පෙබරවාරි 01වන දින සිට 2015 ජූලි 31 දක්වා නඩත්තු කටයුතු සිදුවූ බැවින් අදාළ ඉන්වොයිසි සඳහා මුදල් ලබාගැනීම නව ගිවිසුම මඟින් ආවරණය නොවේ. කුලී ගිවිසුම් ප්‍රකාරව මසකට රු 91,162ක් බැගින් අගෝස්තු මස සිට ඔක්තෝබර් මස දක්වා මාස 3ට ගෙවීම් සිදුකර ඇත. එහෙත් නව ගිවිසුම ප්‍රකාරව 5% ක මාසික කුලිය වැඩි වීමට අදාළ මුදල පමණක් ලබාගත යුතුව ඇත. ඒ අනුව 2015 ඔක්තෝබර් දක්වා ආයතනයට තව දුරටත් අයවිය යුතු මුදල රු 24,022.41කි.

2016 පෙබරවාරි 01වන දින සිට 2017 ජනවාරි 31 දක්වා මාස 12ක කාල පරිච්ඡේදයට අදාළ ඉන්වොයිසි ගිවිසුම අත්සන් කිරීමෙන් පසු මේ වන විට නිකුත් කිරීමට කටයුතු කර ඇත.

(ආ) <u>පෘථිවි නිරීක්ෂණ දත්ත ලබාගැනීම හා බෙදාහැරීම පිළබඳ ජාතික මධ්‍යස්ථානය</u>

විද්‍යාව හා තාක්ෂණය දියුණු කිරීමේ ප්‍රධාන ක්‍රමෝපායක් වශයෙන් රාජ්‍ය ප්‍රතිපත්තිමය තීන්දුවක් මත, මහ නගර සහ බස්නාහිර පලාත් සංවර්ධන අමාත්‍යාංශයේ මහ නගර සංවර්ධන අංශය මඟින් මෙම අක්කර 10ක ඉඩම අප ආයතනය වෙත ලබාදෙන ලදි. එහිදී මූලික වශයෙන් අපේක්ෂා කරන ලද්දේ පෘථිවි දත්ත නිරීක්ෂණ මධ්‍යස්ථානයක් වීන රජය සමඟ ඇති කරගත් එකඟතාවයක් මත ස්ථාපිත කිරීමයි. ඒහෙත් පසුව කරන ලද වැඩිදුර අධ්‍යනයන් හිදී තහවුරු වූ කරුණු අනුව, තාක්ෂණික වශයෙන් වඩාත් යෝග්‍ය එමෙන්ම අනාගතයේදී මෙම මධ්‍යස්ථානයට අනුබද්ධව ගොඩ නැගීමේ ශක්‍යතාවයක් පවතින ක්ෂේත්‍රයන් පිළිබඳ වූ පර්යේෂණ සහ අධ්‍යාපනික මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා ඉඩ කඩ සැලසෙන පරිදි එයට වඩාත් යෝග්‍ය භූමි භාගයක් (අක්කර 15ක් පමණ) අත්පත් කරගැනීමයි. ඒසඳහා අප ආයතනය සහ නාගරික සංවර්ධන අධිකාරිය මඟින් සිදු කරනු ලබන වැඩිදුර අධ්‍යනයන් මේ වන විට අවසන් අදියරට පැමිණ ඇත. ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරිය මඟින් ආයතනය වෙත නුදුරේ දී ලබාදෙනු ඇතැයි අපේක්ෂා කරන භූමි භාගයක අදාළ කාර්යය ඉටු කිරීමට නියමිතය.

විගණන විමසුමෙහි දක්වා ඇති පරිදි දැනට ලැබී ඇති භූමිය වටා වැටක් ඉදිකිරීමට රුපියල් මිලියන 3, 545,744/-ක මුදලක් නාගරික සංවර්ධන අධිකාරියට ගෙවා ඇති අතර අදාළ වැට දැනට ඉදි කර නොමැත. මේ සම්බන්ධයෙන් වෙනත් යෝග්‍ය භූමියක් ලැබුනු පසු නාගරික සංවර්ධන අධිකාරිය මඟින් එහි වැට ඉදි කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) උපයෝජනයකින් තොරව පවතින තොග ලෙස විගණනයේ දී නිරීක්ෂණය වී ඇති අයිතමයන් තාක්ෂණික උපාංග වේ. ඒවා දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා ඇතැම් විට අවශ්‍ය වන අතර අනාගතයේ දී දියත්වන ව්‍යාපෘති සඳහා ද භාවිතයට ගැනීමට හැකියාව ඇත. තාක්ෂණික කාර්යයන් ඉටු කරන ආයතනයක් ලෙස පුළුල් තක්සේරුවකින් තොරව එවැනි උපාංග ඉවත් කිරීම සිදු කිරීම ප්‍රායෝගික නොවේ. එමෙන්ම එම බොහෝ උපාංග යල් පැනීමක් හෝ භාවිතයට ගත නොහැකි තත්වයක නොමැත.

(ඈ) මෙම සිද්ධිය සම්බන්ධයෙන් ස්වාධීන නිරීක්ෂණයන් තව දුරටත් සිදුකල අතර මේ සම්බන්ධයෙන් ආයතනයේ විගණන හා කළමනාකරණ රැස්වීමේදී අදාළ කරුණු ඉදිරිපත් කරන ලදී. එහිදී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ ඒකමතික තීරණය වූයේ අදාළ අලාභය වහාම ආයතනයට ගෙවන ලෙස රියදුරුට දැනුම් දෙන ලෙසයි. ඒ අනුව මේ සම්බන්ධව රියදුරු මහතාට ලිඛිත දැනුම් දීමක් සිදු කරන ලද අතර එකී මුදල එකවර ගෙවීමට නොහැකි බවත් වාරික වශයෙන් ගෙවීමට සහනයක් ලබා දෙන ලෙස ඔහු විසින් ඉල්ලීමක් සිදු කරන ලදී. අදාළ අලාභය වන රුපියල් 50,063.00 වන මුදල රියදුරුමහතා ගෙන් අයවිය යුතු බව තහවුරු වී ඇති බැවින් ලැබිය යුතු මුදලක් ලෙස 2017 ගිණුම් සටහන් තබා ඇත.

4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

(අ) ආයතනයේ ඉංජිනේරු පුරප්පාඩු පැවතිය ද ඒවා සම්පූර්ණයෙන්ම පිරවිය යුත්තේ අංශ ප්‍රධානීන් ලෙස බඳවා ගත යුතු තාක්ෂණික ගණයේ ඉහළ ධූරයන් පිරවීමෙන් අනතුරුව බව දැක්විය හැකිය. මෙම තාක්ෂණික ඉහළ තනතුරු සඳහා බඳවා ගැනීමේ සහ උසස්වීමේ පටිපාටියට අනුව අධ්‍යාපන සුදුසුකම් අනුව පළපුරුද්ද සලකා බැලුවද, වැටුප අනෙකුත් රාජ්‍ය ආයතන සහ පෞද්ගලික අංශ සමඟ සසඳා බැලීමේදී පහළ මට්ටමක පවතින නිසා සුදුසුකම්ලත් අයදුම්කරුවන් එම තනතුරු සඳහා අයදුම් කර නොතිබීම හේතුවෙන් සහ සුදුසුකම්ලත් සිටින අයදුම්කරුවන් ද සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගි නොවීම එම ඉහළධුර පුරප්පාඩු තත්වයෙන්ම පවතීමට හේතු වී ඇත. තවද අප ආයතනයේ තාක්ෂණික

නොවන සහයක කාර්ය මණ්ඩල තනතුරු සඳහා බඳවාගත හැකි වන්නේ තාක්ෂණික කාර්ය මණ්ඩල වලට සමානුපාතිකව හා අහිතකර අසමතුලිත තත්වයක් ඇති නොවන ආකාරයට සිදුකල යුතුය.

(ආ) මෙම විගණන විමසුමට අනුව ආයතනයේ තාක්ෂණික අංශයේ පුරප්පාඩු 70% ක ප්‍රමාණයක් පවතින අතර ආයතනයේ අපේක්ෂිත අරමුණු කරා ළඟාවීමට සිදුවී තිබෙනුයේ දැනට සිටින කාර්යය මණ්ඩලය තුලින් බව කාරුණිකව දන්වමි. දැනට පවත්නා ආයතනයේ පාලනයෙන් තොර ඉහත කී දුෂ්කරතාවයන්ට සාපේක්ෂව සලකා බලන කල්හි ආයතනික කාර්ය සාධනය ලබා ඇති ප්‍රගතිය ප්‍රශස්ත මට්ටමක පවතින බවද කාරුණිකව දන්වමි.

(ඇ) ආයතනය විසින් කිහිප අවස්ථාවක දී පුවත්පත් දැන්වීම් පළ කර අදාළ තනතුරු පිරවීමට උත්සාහ කලද සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගේ අයදුම්පත් නොලැබීම මත, මෙම තනතුරු මේ දක්වා පුරප්පාඩුව පවතී. එම තනතුරු සඳහා (අදාළ සුදුසුකම් සහිත අයදුම්කරුවෙකුට) අදාළ වැටුප් වෙළඳපළ වැටුප් හා සැසඳීමේ දී කිහිප ගුණයක් දක්වා වූ වෙනසක් පවතින බැවින් එම තනතුරු සඳහා සුදුසු අයදුම්කරුවන් බඳවාගැනීම සහ රඳවාගැනීම ආයතනික වශයෙන් මුහුණ දෙන බරපතල ගැටළුවකි.

මෙම ජ්‍යෙෂ්ඨ මට්ටමේ පවතින තනතුරුවල පුරප්පාඩු සඳහා බාහිර අයදුම්කරුවන් ඉල්ලුම් නොකරන ලද බැවින් ආයතනයේ පරිපාලනමය හා අනෙකුත් ක්‍රියාකාරකම් දැඩි අර්බුදකාරී තත්වයකට පත්වීම වැළැක්වීම සඳහා ආයතනයේ සුදුසුකම්ලත් නිලධාරීන්ගෙන්, ඔවුනගේ පවත්නා තනතුරේ රාජකාරීන්ට අමතරව, ඊට ඉහළ පුරප්පාඩුව පවතින තනතුරේ වැඩ බැලීම සඳහා ආයතනයේ පාලක මණ්ඩල අනුමැතිය මත මෙම නිලධාරීන් පත් කර ඇත. කෙසේ වුවද අදාළ තනතුරු නිත්‍ය ලෙස පිරවීම සඳහා කටයුතු සිදු කරනු ලැබේ.

5 ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 ක්‍රියාකාරී සැලැස්ම

(අ) ආයතනයේ තාක්ෂණික අංශවල ක්‍රියාකාරකම් අනුව ඒවාට අවශ්‍ය වන අධි තාක්ෂණික උපකරණ පොදු ස්වරූපයක් ගන්නා අතර , ඒවා පොදුවේ එම වර්ෂයේ හෝ ඉදිරි වර්ෂවල ක්‍රියාත්මක වන ව්‍යාපෘති ගණනාවකට භාවිතයට ගනී.මේ හේතුව නිසා සියළුම ක්‍රියාකාරකම් සඳහා වෙන් වෙන් වශයෙන් ප්‍රාග්ධන වියදම් හඳුනාගත නොහැකි අතර ව්‍යාපෘති සඳහා විශේෂිතව ඇස්තමේන්තු කළහැකි ප්‍රාග්ධන වියදම් පමණක් ඒ ඒ කාර්යය සඳහා වෙන් වෙන් වශයෙන් දක්වා ඇත.

තවද ව්‍යාපෘති සඳහා විශේෂිතව හඳුනාගත හැකි සත්‍ය වශයෙන් වැය වූ මුදල ඉදිරි වර්ෂ අවසාන කාර්ය සාධන ඇගයීමේ දැක්වීම කෙරෙහි මෙවන විට විශේෂ අවධානය යොමුකොට ක්‍රියාත්මක වී ඇත.

(ආ) ඉහත (අ) කොටසේ විස්තර කර ඇති තත්වයන් යටතේ ව්‍යාපෘති සඳහා වන ප්‍රාග්ධන වියදම් එම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය හා පූර්ණ වශයෙන් එකිනෙක හා ගැලපෙන සහසම්බන්ධතාවයක් නැත. කෙසේ වුවද ක්‍රියාකාරී සැලසුම් පිළියෙල කිරීමේ දී එක් එක් ව්‍යාපෘතියෙන් වර්ෂය තුළදී නිම කිරීමට අපේක්ෂිත භෞතික ප්‍රගතිය ප්‍රතිශතාත්මකව දැක්වීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

5.2 ප්‍රසම්පාදන සැලැස්ම.

(අ) අප ආයතනය විසින් මිල දී ගන්නා බොහෝමයක් භාන්ඩ තාක්ෂණික භාණ්ඩ වන බැවින් ඇස්තමේන්තු වටිනාකම සහ සත්‍ය වටිනාකම අතර වෙනස්කම් දැකිය හැකි අතර විගණන නිරීක්ෂණය තුළ ඇතුලත්

ඇස්තමේන්තු වටිනාකමින් ඉතිරි වූ මුදල් ද ඇතුලත් වී ඇත. ඊට අමතරව ආයතනයේ පිරිවිතර නොගැලපෙන නිසා සමහර ප්‍රසම්පාදන අවලංගු කිරීමට සිදුවන අවස්ථා දැකිය හැකි අතර නැවත මිල ගණන් කැඳවීම සඳහා සැලකිය යුතු කාලයක් ගතවන බැවින් අදාළ වර්ශයේ ප්‍රතිපාදන භාවිතා නොකරන අවස්ථා ද තිබෙන අතර එවැනි ප්‍රසම්පාදනයන් ඊළඟ වසරේ ප්‍රතිපාදන ඇතුළත සිදුකරන අවස්ථා දැකිය හැක.

තවද විගණනය විසින් පෙන්වා දී ඇති නිරීක්ෂණයන් ගැන අවධානය යොමුකොට දැනට පවත්නා ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය ඉතා කාර්යක්ෂම කර ගැනීමට කටයුත්ත කරන බව දන්වනු කැමැත්තෙමු.

තවද සමස්තයක් ලෙස මෙහිදී සමහර ප්‍රසම්පාදනයන් එනම් සංකීර්ණ හා සැපයුම් කරුවෙකු තෝරා ගැනීම ඉතා අපහසු ප්‍රසම්පාදනයන් සඳහා වසරකට වැඩි කාලයක් ගතවන අවස්ථා දැකිය හැක. ආයතනය විසින් පිරිවිතර පිළියෙල කොට මිල ගණන් කැඳවීමේ දී එම පිරිවිතර වලට අදාළ උපකරණ වලට අදාළව තාක්ෂණික අළුත් උපකරණ පැමිණීම මත සැපයුම් කරුවන් අදාළ මිල ලබාදීම සිදු නොවන අවස්ථාද දැකිය හැකිය. එවැනි අවස්ථා වලදී මිලදී ගැනීම අවලංගු කොට වෙළඳපලෙහි පවත්නා භාණ්ඩ වලට නව පිරිවිතර සැකසීමට සිදුවන අවස්ථාද දැකිය හැක.එවැනි අවස්ථා වලදීද අදාළ වර්ෂයේම මිලදී ගැනීම සිදු නොවේ.මෙහිදී ප්‍රසම්පාදනය ආරම්භ කරන ලද වර්ෂයෙන් ප්‍රතිපාදන නොමැති නිසා ප්‍රසම්පාදනය අවසන් කරන ලද වර්ෂයේ ප්‍රතිපාදනයන් ඇතුළත සිදු කර ගැනීමට ආයතනයට සිදුවේ. එවැනි තත්වයන් විගණන නිරීක්ෂණය සඳහා හේතු පාදක වී ඇත.

තවද තෝරාගන්නා ලද සැපයුම් කරුවන් භාණ්ඩ නියමිත දිනට සැපයුම් සිදු නොකිරීම නිසා ප්‍රමාද ගාස්තු අයකිරීම ටෙන්ඩරයේ සඳහන් කර තිබුනද මිල දී ගැනීම අදාළ සැපයුම්කරු ප්‍රතික්ෂේප කරන අවස්ථාද දක්නට ලැබේ.

විගණන නිරීක්ෂණ මඟින් පෙන්වා දී ඇති කරුණ කෙරෙහි විශේෂ අවධානය යොමුකොට හැකිතාක් අදාළ වර්ෂයේම මිලදී ගැනීම් සිදු කිරීම සඳහා අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඉතා කාර්යක්ෂම කිරීමට මෙම නිරීක්ෂණ පාදක කරගන්නා බව දන්වනු කැමැත්තෙමු.

6 පද්ධති හා පලනයන්

(අ) <u>මානව සම්පත් කළමනාකරණය</u>

(i) නිවාඩු දිනවල වැඩ කිරීමට පෙර පූර්ව අනුමැතිය ලබා ගන්නා නමුදු යම් හදිසි වැඩ තත්වයන් උද්ගත වූ විට අංශ ප්‍රධානියාගේ ඉල්ලීම පරිදි රාජකාරිය ඉටු කොට පසුව අනුමැතිය ලබා ගෙන ඇත. තවද සේවකයෙකුට හදිසි රාජකාරි කටයුත්තක් ඉටු කිරීමට පැවරුණු විටදි එය නිම කිරීමට නිවාඩු දිනක පැමිණීම අත්‍යවශ්‍ය වුවහොත් දුරකථන ඇමතුමක් මාර්ගයෙන් වාචිකව පූර්ව අනුමැතිය ලබා ගෙන පසුව අනුමතිය ලබා ගැනීමේ පෝරමය ඉදිරිපත් කරනු ලැබේ. මෙහි දී විශේෂයෙන්ම සලකා බලනුයේ ආයතනික අවශ්‍යතාවය සහ එය කඩිනමින් ඉටු කිරීමේ හැකියාවයි.

(ii) පැමිණීමේ හා පිටවීමේ ලේඛණය අදාල නිළධාරියෙකු විසින් සහතික නොකල නමුදු, එයට සමගාමීව සේවකයන් ඇඟිලි සලකුණු යන්ත්‍රය මඟින් පැමිණීමේ සහ පිටවීමේ වේලාව සළකුණු කරන හෙයින් අදාළ වාර්තා නිවැරදි වේ. එසේ වුවද විගණන නිරීක්ෂණයෙන් පෙන්වා දී ඇති පරිදි අධීක්ෂණ නිලධාරියෙකුගෙ සහතික කිරීම කෙරෙහි අවධානය යොමුකරනු ලැබේ.

(ආ) <u>මූල්‍ය පාලනය.</u>

(i) මෙම විගණන නිරීක්ෂණයේ පෙන්වා දී ඇති පරිදි සියලුම වවුවර් සහ ඒවාට අදාළ ඇමුණුම් මත ගෙවන ලදී. මුද්‍රාව තැබීමට මේ වන විට පියවර ගෙන ඇත.

(ii) නිවාඩු දින වැඩ කිරීම වෙනුවෙන් දීමනා ඉල්ලුම් කිරීමේදි, අතිකාල දීමනා ඉල්ලුම් කිරීම සඳහා භාවිතා කරන පෝරමයම නිවැරදි දත්ත සටහන් කොට මේ වන විට ආයතනය විසින් යොදාගෙන ඇත.

(ඇ) <u>මෙහෙයුම් පාලනය.</u>

(i) විදේශ ගමන් පිළිබඳ ලිපිගොනු යාවත්කාලීන කිරීමේදි අමතර්‍යාංශ අනුමැතිය ආදිය නියමිත වේලාවට නොලැබෙන අවස්ථා තිබෙන අතර එම තොරතුරු අදාල අංශ වලින් ලැබුණු වහාම එම ගොනු යාවත් කාලීන කිරීමට කටයුතු කරනු ලැබේ.

(ii) විදේශ ගත වූ නිළධාරියා නැවත සේවයට පැමිණෙන දිනය ඔහුගේ/ඇයගේ නිවාඩු ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර අදාල හිමි නිවාඩුව ලබා ගනි. එසේ වුවද නැවත සේවයට පැමිණුනු පසු ඒ බව සඳහන් වන ලිපියක් මේ දක්වා ලබා දී නොමැත. අදාළ ලිපියක් ලබා ගැනීම සම්බන්ධයෙන් ආයතනය විසින් ඉදිරියේදි කටයුතු කරනු ලැබේ.

.....

ඉංජිනේරු සනත් පනාවැන්නගේ
අධ්‍යක්ෂ ජනරාල් / ප්‍රධාන විධායක නිලධාරී

© Arthur C Clarke. Institute for Modern Technologies

Katubedda, Moratuwa, 10400, Sri Lanka

Email us : info@accmt.ac.lk

Call us (General) : : Telephone : +94-11-2650569, +94-11-2650838

Fax : +94-11-2650462

www.accimt.ac.lk